CC0. In Public Domain, Digitizagtion by eGangotri

శ్రీ జయదేవ

గీతగోవింద కావ్యము

పుల్లెంపల్లి కే. వి. శాస్త్రి

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගීතගෝවින්ද කාව්‍යය

ශ්‍රී ජයදේව

ප්‍රණීත

ගීතගෝවින්ද කාව්‍යයේ

පද්‍යාත්මක පරිවර්තනය

::

මුහන්දිරම්
මුල්ලපිටියේ කේ. එච්. ද සිල්වා
අභයසිංහ විජයශ්‍රීවර්ධන

::

ප්‍රකාශකයෝ:
ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම
කොළඹ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගීතගෝවින්ද කාව්‍යය

සංස්කෘත මූලග්‍රන්ථය, සිංහල පද්‍යාවලිය

සහ

සරල භාවාර්ථ විවරණයෙන්ද යුක්ත යි.

::

මුහන්දිරම්
මුල්ලපිටියේ කේ. එච්. ද සිල්වා
අභයසිංහ විජයශ්‍රීවර්ධන

::

ප්‍රකාශකයෝ :
ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම
කොළඹ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

හැඳින්වීම.

ගීත ගෝවින්දය

මුළු ලොවම ප්‍රීතියෙන් උද්දාම වන සුන්දර තර වසන්ත යෙහි දී රාධා නම් නවයොවුන් සුකුමාර කුමරිය ගේ සිත කෘෂ්ණ කෙරේ බැඳී ගියේය. කෘෂ්ණ නීරෝග ය. කෙළි ලොල් ය. රූමත් ය. භද්‍ර යෞවනයෙහි පිහිටියේය. මේ එක් එක් ගුණයක් ම රාධා ඔහු කෙරෙහි වඩ වඩාත් ළං කොට වෙලන රැහැන් බවට පැමිණියේය. අනංග ආශීර්වාදය නො මඳව ලද ඔව්හු පෙම් ලොවෙහි රිසි සේ රජයන්නට වූවෝය. එහෙත් අභාග්‍යයෙකි. මේ පරම ආස්වාද ජනක රාජ්‍යය වැඩි දිනක් නො පැවැත්තේ ය. මලින් මලට මකරන්ද රසායානන මත් බමරෙකු මෙන් කෘෂ්ණ රාධා අත් හැර ගියේය.

ආල යෙන් ආතුර වූ, රතියෙන් රත් වූ, ප්‍රේමයෙන් උන් මාද වූ රාධා, යෙහෙළියක ද සහාය කරගෙන ප්‍රිය වල්ලභයා සෙවීම ... සුපූරුදු වන රොද පීරා යන්නට වූවා ය. පුෂ්පිත ... න ශොභාව රාධාවට දක්වමින් යෙහෙළිය වසන්ත කාලය ... මවතුන් කෙරෙහි බලපවත්වන අඳුම් චමත්කාර ජනක ... රස කියන්නට විය. ඔවුනොවුන් කෙරෙන් වෙන්වූ ආදරවන්තයෝ වසන්තයෙහි දී විරහ දුකින් තැවී තැවී පෙළෙන අයුරු ද, සසර බියෙන් ගෙදර දොර හැර පියා වන වැදී උග්‍ර තපෝ ව්‍රතයන්හි යෙදී සිටින මුනිවරුන් පවා පිපී වැනී ... මාධවී සුගන්ධයෙන් කාමාශක්ත කරවන අයුරු ද රස ... බසින් යෙහෙළිය පැවැසීම රාධාවට ඉවසුම් නො ... න්නක් විය.

මෙ ලෙස් බෙණෙමින් ඉදිරියට යත් මෑ, නිල් විල්ලුද පලසක් වැනි ලා තණින් වැසී ගිය වන දෙණි කඩෙක සුරූප ගෝපිකාවන් පිරිවරා කාමාශක්තව කෙළිදෙලෙහි යෙදී සිටින කෘෂ්ණ, යෙහෙළිය විසින් රාධාවට දැක්විණ. එසේ දක්වා ඔහු ඔවුන් සමග අනුරාග සාගරයෙහි ගිලී ඔකඳ වන සැටි ද සවිස්තර ව පැවසූවා ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

තමා සරි පෙම්බර ප්‍රියාම්බිකාවක් අත් හැර දමා පහන්
ගොපළු කෙල්ලන් සමග අභිරුචියෙන් රමණය වන කෘෂ්ණ
ගැන පිළිකුල් සහගත ඊර්ෂ්‍යාවක් ඇති වූ රාධිකා වහ වහා එ
තැනින් ඉවත් ව ගොස් එක් ලතා මණ්ඩපයකට වැදී සොවින්
පෙළෙන්නට වූවා ය. කෘෂ්ණයා කෙතරම් චපලයෙක් වුව ද
විෂය ලොකයෙහි ආස්වාදයන් පුරුදු පුහුණු කරවනු ලැබූ
ඇගේ සිතින් ඔහු ඉවත් කරනු නොහැකි විය. ඔහු ගේ මනෝ
කාන්ත රූ සපුව, ප්‍රියංකර හුරතලය, ප්‍රේම ක්‍රීඩා විලාශය,
ඇයගේ සිත පාරන්නට වනි. මේ හැඟීම් කෙතරම් නම් ඇය
කෙරේ බල පෑවේ ද යත් ඔහු නොමැතිව තවත් ජීවත්වනු
නොහැකි බව දැනුනෙන් කෘෂ්ණ කැඳවා ගෙන එවයි යෙහෙ
ළියට පැවසුවා ය. ඔහු ඇය ඔකඳ කළ හැටි ආශාවෙන් සිහි
කරමින්, එසින් ම ආශාවන් තව තවත් තියුණු කර ගනිමින්,
ආදර සුරාවෙන් මත්වී සිටින ඇය වෙත ඇය ගේ පෙම්බරු
සොයේ හෝ කැඳවාගෙන එවයි යළි යළිත් යෙහෙළියට
ඇවිටිලි කරන්නට වූවාය.

රාධා මෙසේ වියෝ ගින්නේ වෙළි විලාප නගද්දී, කාමුක
ගෝපිකාවන් අත්හැර දමූ කෘෂ්ණ එම වෘන්දාවනයේ ම තවත්
කොටසක වන වදුලකට වැදී සිත් පිත් නැත්තෙක් මෙන්
සුවිනීත ප්‍රිය පත්නිය නොසලකා දමූ සැටි සිත සිතා පාපොච්
චාරණය කරමින් දුක් වන්නට විය. ඇය ගැන සිතත් සිතත්
ම ආස්වාද ජනක අතීතය ඉදිරියෙහි මැවී දිස් වන්නට
වූයෙන් ඔහු ගේ වියෝ දුකෙහි සීමාවක් නොවීය.

මෙසේ මහත් සොවින් පසු වෙන ඔහු වෙත රාධා
යෙහෙළිය පැමිණියා, රාධා පිළිබඳ දුඃඛිත තත්ත්වය පවසමින්
ඇය වෙත නොපමාව ම පැමිණෙන මෙන් ඇය ගේ බසින්
අයැදියා ය. තමා කළ වරදට රාධාගෙන් ක්ෂමාව ලැබෙන බව
නිසැකයෙන් දැනගත් කෘෂ්ණ, ඇයගේ ආගමනය බලාපො
රොත්තුවෙන් තමා එහි ම රැඳී සිටින බව කියා වහා ඇය
එහි කැඳවාගෙන එන මෙන් යෙහෙළිය පෙරලා යැවී.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

රාධා වෙත ආපසු පැමිණි යෙහෙළිය, කෘෂ්ණ වියෝ දුකින් දැවෙන හැටිත්, ඇය ගැන බලාපොරොත්තුවෙන් වන වදුලෙහි සිටින සැටිත් ප්‍රේම දයාව කුළුගන්වන බසින් පැවැසී ය. අනංගයා විසින් තියුණු හී වලින් රෞද්‍ර ලෙස විදිනු ලැබ හෘදය විදාරණය වී ශයනයෙන් නැගී සිටීමට පවා ශක්තියක් නො වූ රාධා කෙසේ නම් වල්ලභයා කරා යන්නට ද? කෘෂ්ණ තමා වෙත කැඳවා එන මෙන් ඇය නැවතත් යෙහෙළිය යැවී.

යෙහෙළිය පෙරලා පැමිණීම ප්‍රමාද විය. ඒ අතර රාත්‍රි කාලය ද පැමිණියේ ය. නිමේෂයක් නිමේෂයක් පාසා රාධා වියෝ දුකින් මිරිකී මිරිකී අවසානය කරා ළං වන්නීය. ඇය ගේ මනහර රූ සපුවත්, සුමිහිරි යොවුනත්, මෙ සේ අකාලයේ, අකාරුණික ව, අසථානයේ නාස්ති වීම ගැන ඇය වැලැපෙන්නී ය. ඇතැම් විට කෘෂ්ණ මේ මොහොතේ වෙනත් ප්‍රියාවකට ප්‍රේම පූජෝපහාර පවත්වමින් සුරති ශ්වයෙහි සුවවව යෙදෙමින් රමණය වන බව සිතන ඇය මරණය වහ වහා පැමිණෙන මෙන් යාඥා කරන්නී ය.

වටින් ගොඩින් එළිය වැටී ගත එද්දී කෘෂ්ණ ලිය ගොමුවෙහි දොරකඩ දිස් විය. ඔහු ගේ විලාශය ඇය ගේ සැකය සනාථ කොළේ ය. අනෙකක් සමඟ ඔකාද වෙමින් රාත්‍රිය ගත කළ බව නිශ්චය කර ගැනීමෙන් කෝපාවිෂ්ට වූ රාධා ඔහුට එතැනින් ඉවත්ව යන මෙන් නියම කළා ය. ඇය ගේ ඇණුම් බැණුම් සැඩ සුළඟින් හිස නැමී ගිය කෘෂ්ණ නිහඬ විය. ක්ෂමාව අයදින මෙන් එහි පැමිණි ප්‍රේමවන්තයා පලවා නො හරින මෙන්, යෙහෙළිය මෙහි දී ඉදිරිපත් ව රාධාවට චෝදනා මුඛයෙන් තෙපළා ය. මෙසින් ධෛර්‍යමත් වූ කෘෂ්ණ, ප්‍රේමණීය බැගෑ බසින් ක්ෂමාව අයදින්නට විය. ඔහු ගේ මනෝ රාජ්‍යයෙහි කිරීටය ඇයට මිස කිසි කලෙක, අන් කිසිවකට හිමි නො වන බව මොළොක් බසින් සපථ කොළෙන් රාධාව ගේ ක්‍රෝධ වේගය මඳ වන්නට විය. අවසථාව අවබෝධ කරගත් යෙහෙළිය කෘෂ්ණ ගේ නිකුංජය වෙත යැමට රාධා ධෛර්‍යමත් කළා ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

උතුරා යන ආශාවෙන් නිකුංජය වෙත පිවිසි රාධාවට ප්‍රේම රාජ්‍යයෙහි සිංහාසනය නැවතත් හිමි විය. විවිධ ප්‍රේම ප්‍රයෝගයන්හි ප්‍රයුක්තව ප්‍රණීත ප්‍රිය ප්‍රණයයෙන් ප්‍රමෝදයට පත් පති පත්නී දෙදෙන සඳ සුන්දර සාදර සාගරයෙහි සකලවිධ දුක් ගිනි කිඳවා නිවා නිවී සැනැසුනෝ ය. මෙ සේ ප්‍රේමයේ වහලෙකු බවට පැමිණි සුවච ස්වාමියාට සුරත තරඟයෙහි දී විසිරී ගිය මාලාදම, ලිහීගිය සළු පිළි, කැලඹී ගිය කෙහෙ කැරලි සකස් කර සදන මෙන් ඇය දුන් අණ ඉතා කැමැත්තෙන් ඔහු ඉටු කෙළේ ය. මෙ සේ කෘෂ්ණාවතාරයෙන් ලෝ පහළ වූයේ භගවද් ශ්‍රී විෂ්ණු ය. රාධාව නම් ශ්‍රී කාන්තා තොමෝ ය. ගීත ගෝවින්දයෙහි වස්තුව මෙය ය.

බැලූ බැල්මට ම මේ කථා වස්තුව ලිහිල් සේ පෙනෙතුදු පෙරදිග ආලය පිළිබඳ විවරණයක් සේ එය සැලැකිය හැකි ය. අධික ආශාව, ඊර්ෂ්‍යාව, බලාපොරොත්තුව, ආශාභංගය, ප්‍රකෝපය, ප්‍රසාදනය ආදී ප්‍රේමයේ උද්වේග ජනක සෑම අංශයක් ම එහි විස්තර වන්නේ ය. එ මතු ද, ස්වභාව සෞන්දර්‍ය්‍යය සහ කාම ශාස්ත්‍රයෙහි දැක්වෙන කාම කලා විධීන් ද අති දක්ෂ ලෙස සුදුසු ස්ථානයන්හි ඇතුළත් කර තිබෙන මේ කථා වස්තුවෙන් ශ්‍රද්ධා භක්තිය දනවීම ද මැනැවින් ම කෙරෙන්නේ ය.

කර්තෘවරයා ස්වකීය 'වෛෂ්ණව භක්තිය ප්‍රකට කිරීම සඳහාත්, පාඨකයන් ගේ සිත් ශ්‍රද්ධා පදනමක් මත පිහිටුවා ආගමික චරිත කථාවක රස විඳීමට පෙළ ගැස්වීම සඳහාත් තම කෘතියේ ආරම්භක සර්ගයේ වැඩි හරියක් ද, සර්ග මධ්‍යයේ වෙනත් වෘත්තයක් පටන් ගන්නා තැන්වල ද, වෘත්තය වෙනස් කරන තැන්වල ද, සෑම සර්ගයකම අවසානයෙහි ද, විෂ්ණුහු ගේ චරිත සිද්ධි, බල පරාක්‍රමය හා ඔහු පිදීමෙන් ලැබෙන ලෞකික . ලෝකෝත්තර සැප සම්පත්තීන් ද අභිරුචියෙන් වර්ණනා කරන්නේ ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

එ නිසාම ය රාම සේතුවෙහි සිට හිමාවලය දක්වා වන මුළු මහත් භාරතයෙහි ම යටත් පිරිසෙයින් ගීත ගෝවින්ද යෙහි ගී දෙක තුනක් වත් දිනපතා ගායනා නො කෙරෙන එකද හින්දු නිවාසයක් වත් සොයාගත නො හැක්කේ. අද්භූත බල සම්පන්න මහා ඉෂ්ට මන්ත්‍රයක් ලෙස හින්දූහු ගීත ගෝවින්දය සලකත්. බොහෝ දෙන එය භාවිතයෙහි යෙදෙනුයේ ඉන් දෙ ලෝ වැඩ සැදෙතැයි යන විශ්වාසය සලකා මිස, එහි පිරි ඉතිරි යන පරම රමණීය කලා රසය ගැන සලකා නො වේ.

භක්තිමතුන් ගේත්, කලා රසිකයන් ගේත් සංගීත විසාරදයන් ගේත් එසේ ම ශබ්ද විද්‍යාඥයන් ගේත් එක සේ අතිමාත්‍ර සාදරයට මෙ තරම් පාත්‍ර වූ නව එක ද කාව්‍යයක් විශ්ව සාහිත්‍යයෙන් සොයා ගත නො හැක. ගීත ගොවින්දය කොතරම් ජන ප්‍රිය භාවයට පැමිණියේ ද යන්න එය අනු කාරණය කොට නොයෙක් තරාතිරම්වල කවීන් විසින් කරන ලද සුවිශාල කාව්‍ය සංඛ්‍යාවෙන් පමණක් ම නොව 14 වැනි ශත වර්ෂයෙහි විසූ විශ්වනාථ කවිරාජයන් විසින් සවකීය සාහිත්‍ය දර්පණයෙහි වෘත්ත්‍යනුප්‍රාස පිළිබඳව නිදර්ශන වශ යෙන් ගීත ගෝවින්දය ගෞරව පුරස්සර ව සඳහන් කර තිබීමෙන් ඔප්පු වන්නේ ය.

ගීත ගෝවින්දය වනාහි නාට්‍ය ග්‍රන්ථයක් නො වේ. එසේ ම වෘත්තාන්ත කාව්‍යයක් ද නො වන්නේ ය. නාට්‍ය සහ වෘත්තාන්ත කාව්‍ය යන දෙක්හි ම ලක්ෂණ නො අඩුව ලැබෙන මෙය එයට ම විශෙෂ වූ ආශ්චර්යවත් කෘතියකි.

බෙංගාලයෙහි යාත්‍රා පුජෝත්සවයෙහි අවශ්‍ය තම අඞ්ග යක් වන ගම්බද ජනතාව ගේ රඟ දැක්වීමට උපයෝගී වන පරිද්දෙන් එය පිළියෙල වීනැයි ඇතැම් විචාරකයෝ විශ්වාස කරත්.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගැමි ජනතාවට ඉතා ම ප්‍රිය මනාප වූ ශ්‍රී කෘෂ්ණ ගේ රති ලීලාවන් පිළිබඳ මේ කථා වස්තුව ශ්‍රී භාගවත් පුරාණ යෙහි දශම ස්කන්ධයෙහි රස පංචාධ්‍යායයීය සහාය කොට ගෙන සකස් කරගන්නා ලද්දකැයි යන බවට ද මතයක් වේ.

උත්තර භාරතීය වෛෂ්ණව භක්තිකයන් ගේ සහ දක්ෂිණ භාරතීය භාගවත සම්ප්‍රදායීය අනුගාමිකයන් ගේ ද විශිෂ්ටතම ධර්ම ග්‍රන්ථය මෙන් ද, සකල ලෝකයෙහි ම රස කාමීන් ගේ අමෘත ප්‍රවාහය මෙන් ද සදාදරයට පාත්‍ර වූ ගීත ගෝවින්දය නම් අමරණීය කාව්‍යය රචනා කරන ලද්දේ ශ්‍රී ජයදේව නම් විප්‍රවරයකු විසිනි.

කාලිදාස නමින් කිවිවරු කිහිප දෙනෙක් ම වූවාක් මෙන් ම, ජයදේව නමින් ද කිවිවරු කිහිප දෙනෙක් සිටි බව පෙනේ. ප්‍රසන්නරාඝව නාටකය ලියන ලද්දේ ජයදේව නමැත්තෙකි. මහාදෙව ගේ සහ සුමිත්‍රාව ගේ පුත් වූ ඔහු කෞණ්ඩින්‍ය ගෝත්‍රිකයෙකි. ශෘංගාර මාධවී චම්පුවෙහි කතෘභූත ජයදේවයන් ගේ දෙමාපියන් ගැන හෝ, ගෝත්‍රය ගැන හෝ සඳහනෙක් දක්නට නැති. කෘෂ්ණදාස නැමැති ආරූඪ නාමයෙන් පෙනී සිටි ඔහු ද ව්‍යක්ත කාවියෙකි.

ගීත ගෝවින්ද කර්තෘවර ජයදේවයන් පිළිබඳව එහි ම සඳහන් ව ඇත්තේ මෙ සේ ය.

තෙවැනි සග :-

"වර්ණිතං ජයදෙවකෙන හරෙරිදංප්‍රවනෙන
කින්දුබිල්ව සමුද්‍ර සම්භව රොහිණී රමණෙන."

දොළොස් වැනි සග :-

"ශ්‍රී භොජදෙවප්‍රභවස්‍ය රාමාදෙවී සුතශ්‍රී ජයදෙවකස්‍ය"

කින්දුබිල්ව නම් ගම්හි භොජදෙවයනට සහ රාමාදේවි යට පුත්ව ජයදේවයෝ ජනිත වූ බව ඉන් කියැවේ. එබැවින් ගීත ගොවින්ද කර්තෘ නිරාකරණය කර ගැනීමෙහි ලා විමති යෙක් මතු නො වන්නේ ය. ජයදෙව පත්නිය පද්මාවති

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

නම් වූ බවද ගීත ගොවින්දයෙහි සඳහන් වන "ජයතු පද්මාවතී රමණ ජයදෙව කවිභාරතී භණිතමිති ගීතම්" යන්නෙන් සිතාගත හැකි ය.

සිය කෘතියෙහි සමකාලීන කවීන් දක්වන ශ්‍රී ජයදේවයෝ:-

"වාචඃ පල්ලවයත්‍යුමාපතිධරඃ සන්දර්භශුද්ධිං ගිරාං
ජානීතෙ ජයදෙව එව ශරණඃ ශ්ලාඝ්‍යො දුරූහද්‍රුතෙ
ශෘඞ්ගාරොත්තර සත්ප්‍රමෙය රචනෛරාචාර්‍ය්‍යගොවර්ධන
ස්පර්ධී කොපි න විශ්‍රුතඃ ශ්‍රුතිධරො ධොයී කවික්ෂ්මාපතිඃ"

උමාපතිධර, ශරණ, ගොවර්ධනාචාර්‍ය්‍ය, සහ ධොයී යන්නන් නම් කෙරෙත්. ජයදේවයන් ජීවත් වූ වකවානුව ගැන සිතා ගැනීමට මේ කවි නාමාවලිය බෙහෙවින් ම උපකාරී වන්නේ වේ.

බෙංගාල දෙශාධීශ්වර ව විසූ ලක්ෂ්මණසේන රාජයා ගේ දර්ශන ශාලාවට ඇතුළු වන දොරටුවෙහි :-

"ගොවර්ධනශ්ච ශරණො ජයදෙව උමාපතිඃ
කවිරාජශ්ච රත්නානි සමිතෞ ලක්ෂ්මණස්‍ය ච"

යන ශ්ලොකය ඇති ගල් පුවරුවෙක් වෙයි. මේ ශිලා ලෙඛනයෙන් ජයදෙවයන් ගේ කාලය නිසැක ලෙස ම නිශ්චය කළ හැකි. ලක්ෂ්මණසෙන රාජයා විසුයේ දොළොස් වැනි ශතවර්ෂයේ ය. ඔහු ගේ රාජකීය කවි මඩුවෙහි සුපූජිත කවියකු වන ජයදෙවයෝ ද එ නිසා ම දොළොස් වැනි ශත වර්ෂයට අයත් වීයැ යුතු ය.

රමණීය සරල පදවලින් හෘදයට ම ව්‍යක්ත ලෙස අදහස් ඉදිරිපත් කළ පුරාණතම සංස්කෘත පද්‍යයන් කවි කලාවේ උසස් ම තැන වැජඹුන බව පැරණි සාහිත්‍ය ග්‍රන්ථයන් ගෙන් පෙනේ. සුන්දර පදයන්ගෙන් අති සියුම් ගැඹුරු චින්තාවන් පළ කළ සංස්කෘත පද්‍ය සාහිත්‍යය ක්‍රම ක්‍රමයෙන් පිරිහෙන්නට විය. මහාකවි කාලිදාසයනට පශ්චාද්භාගයෙහි විසූ බොහෝ කිවිවරු මේ පිරිහීම වඩාත් ඉක්මන් කළ බව පෙනේ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

මෙ සේ කාලක් ගත වත් ම, නිරුත්සාහී වැ හෘදයෙන් උතුරා ගිය සුමිහිරි පද්‍යාවලිය සම්මත ස්වරූපයකට අනුව හැඩ ගස්වා නිපදවනු ලබන වාඞ්මාලාවකට පරිවර්තනය විය, කලාව ව්‍යාජයෙන් වැසී ගියේ ය. මානසික හැඟීම් විවරණය සාටෝප වාගාඩම්බරයට පෙරළී ගියේ ය. මේ සියල්ලට ම සූක්ෂ්ම රසෝත්පාදනාංගයන් ගෙන් සමන්විත, එසේ ම බොහෝ විට අශ්ලීලත්වයේ මායිම දක්වා ම තල්ලු වී යන ශෘඞ්ගාරය, සැම සාහිත්‍ය කෘතියක ම, ජීවය හෙවත්, ස්ථායි භාව බවට පත් විය. භර්තෘහරි ගේ ශෘඞ්ගාර ශතකය, අමරු ශතකය සහ ආචාර්ය ගොවර්ධනයන් ගේ ආර්‍යා සප්ත ශතී ආදිය මේ යුගයේ කාව්‍යය ගමන් කළ අත කියා පාන්නේ ය. පද්‍ය සාහිත්‍යයේ සංවර්ධනයට බෙහෙවින් උපකාරී වූ රාජකීය අනුග්‍රහය, නව විධ රස අතුරෙන් අන් සියල්ල ම යටපත් කොට ශෘඞ්ගාරයට යොමු වීම නිසා එය ම ප්‍රිය මනාප භාවයෙන් ප්‍රචාරයට පත් විය.

ශ්‍රී ජයදේවයෝ ජනිත වූයේ මෙ බඳු අවදියක ය. ඔහු ගේ නිසර්ග සිද්ධ කවිත්වය හා ශ්‍රද්ධා භක්තිය එවකට ප්‍රචලිත ව තුබූ පද්‍ය විලාසිතාවට අනුව හැඩ ගැස්වීම නිසා අසම සම ගීත ගෝවින්ද කාව්‍යය පහළ විය.

ජයදේවයන් පිළිබඳ ව ගෙතී ඇති ජන ප්‍රවාද බොහෝ වෙත්. ඒ සියල්ලෙන් ම ඔප්පු වන්නේ ඔහු ගේ අතිමාත්‍ර කෘෂ්ණ භක්තිය ය. මේ අචල ශ්‍රද්ධාව නිසා ම ය, ශ්‍රී කෘෂ්ණයන් ගේ ලීලාවන් වර්ණිත මේ අමරණීය ගීතය ගෙතීමට ඔහු පෙළැඹී ගියේ. තම භක්ති ගීතය සර්ව සුන්දර ලෙස සකසා ගැනීමට බ්‍රහ්ම වෛවර්ත පුරාණය ආදී පුරාණ ග්‍රන්ථයන් ද දේවී භාගවතය සහ රාධ කෘෂ්ණ ලීලාවන් පිළිබඳ ව ගෙතී තිබුන ගැමි ගීතයන් ද ඔහු ප්‍රයෝජනයට ගත්තා නිසැක ය. ඒ සියල්ලෙහි ම රස භාවයන් තමනට ම විෂය වූ අතුල්‍ය අනුප්‍රාස රසාලංකාර විධීන්ගෙන් සරසා, රසයෙන්, ශබ්දයෙන්, අර්ථයෙන් පිරිපුන් විශිෂ්ට නව්‍ය පද්‍යයන් නිර්මාණය

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

කිරීමෙහි ඔහු සමත් විය. එහෙයිනි පශ්චාත් කාලීන සංස්කෘත කිවීන් අතර උච්චම ස්ථානයක් ශ්‍රී ජයදෙවයෝ දරනුයේ.

හින්දූන් ගේ නාට්‍ය කලාවේ ප්‍රභවය හා සංවර්ධනය බෙහෙවින් ම ශ්‍රී කෘෂ්ණ ගේ චරිත කථාව ආශ්‍රය කොට ගෙන ඇති වූ බව විචාරකයන් ගේ මතය වේ.

වේද යුගයේ සිට යාග හෝම වලදී දෙවියන් ගේ වික්‍රමයන් පිළිබඳ ගීත ගායනය කළ බව පෙනේ. දෙවියන් අතර ද වික්‍රම ක්‍රියාවන් ගැන ප්‍රකට වූවෙකි ශ්‍රී විෂ්ණු. හේ දශාවතාර දැරුවෙක් බැවිනි. එනිසා වීරස්තෝත්‍ර සඳහා ඔහුට සමවන තවත් දෙවියෙක් සොයාගැනීම උගහට ය. මෙ සේ ජනප්‍රිය භාවයට පත් වූ විෂ්ණුහු ගේ සුරති චරිතය ද අනන්‍ය සාධාරණ කාම විජයග්‍රහණයක් මෙන් භක්තිමතුන් ගේ සාදර සම්භාවනයට සෑදු පාත්‍රවන පරිදි ශ්‍රී ජයදෙවයන් විසින් නාට්‍ය ගෙය්‍ය වාද්‍ය රස විඳිත හැකි ගීත ස්වරූපී ප්‍රණීත කාව්‍ය බන්ධනයකින් ගීත ගෝවින්දය නමින් ඉදිරිපත් කැරිණ.

අකුටිල ශ්‍රද්ධාභක්තියෙන් පිරිපුන් අහිංසක ගැමි ජනතාව ගේ සිත් තුළට ශ්‍රී විෂ්ණුහු ගේ අන් සියලුම වීර ක්‍රියාවන් ම පසුබා මේ රතිලීලා වික්‍රමයන් ම ගලා යෑම ස්වාභාවික ය. මෙය මෙ සේ නමුදු දෙවියන් පිළිබඳ මෙබඳු ලෞකික වර්ණනයන් කිරීම නුසුදුසුයැ යි සිතන්නන් ද නොවන්නේ නො වේ. එ පමණක් ම නොව කවරකු පිළිබඳව හෝ කාව්‍යයක ශෘඞ්ගාරාත්මක වර්ණනාවන් ඇතුළු වීම ඒ කාව්‍යය කෙලෙසීමට හේතු වන්නේය යි සිතන්නෝ ද වෙත්. පෙර කී පිරිස භක්තියෙන් බියපත් වීම නිසාත්, පසු කී ගණය යථා තත්ත්වය හමුවෙහි පැකිළීම නිසාත් මෙ සේ පැවසීමට පෙළඹෙන බව කිවයුතු ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

උගතුන්, විචාරකයන්, සමාජ සුධාරකයන් වශයෙන් පැලඹෙන්නවුන් අවස්ථානුරූපව වෙස්පෙරලන නමුදු, ශෘඞ්ගාරයෙහි මතුපිට පෙනෙන ජීව රසයෙන් සන්තර්පනය වන සාමාන්‍ය ජනතාව, එමගින් අපවිත්‍ර අන්ධකාර ආචාරයන් කරා සිය සිතුවිලි කිසි විටෙකත් ගමන් නොකරවති මෙ නිසා ය හින්දූන් ගේ, විශෙෂයෙන් ම පොදු හින්දු ජනතාව ගේ ප්‍රියතම භක්ති ගීතය බවට ගීත ගෝවින්දය පැමිණ ඇත්තේ.

ස්වීය අසම සම කවිත්වය ගැන ජයදේවයෝ තුමූ ම ගර්වයෙන් සැලකූ බව පෙනේ. ඔහු තමා ගැන "කවිනෘප-දෙව" යයි කියා ගත්තා පමණක්ම නොව, තම කෘතිය ගැන ද මහත් අභිරුචියෙන්-

"සාධ්වි මාධ්වික චින්තා නභවති භවතඃ ශර්කරෙ කර්කශාසි
ද්‍රාක්ෂෙ ද්‍රක්ෂ්‍යන්ති කෙත්වා මමෘත මෘතමසි ක්ෂීර
නීරං රසස්තෙ
මාකන්ද ක්‍රන්ද කාන්තාධර ධරණි තුලාං ගච්ඡ
යච්ඡන්ති භාවං
යාවච්ඡෘඞ්ගාර සාරං ශුභමිවජය දෙවස්‍ය වෛදග්ධ්‍ය වාචඃ

මදුර මදිරු නොසිත රසයයි සකුරූ
තෙපි රළු අම්හි ඊ
කවර නම් අය පිය කෙරෙති මිදි අමා
තෙපි දුන් කල් මැ ඊ
අදර ලඳ රස පිරිහි කිර නීරසය අඹ
නොප රස වැ ඊ
මිහිර නම් ජය දේවගීමය සොඳුරු
සුලලිත පද පි ඊ" යි

සඳහන් කරන්නේ ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගීත ගෝවින්දය කියවා රස වින්දහු ශ්‍රී ජයදේවයන් ගේ කිවිරාජ බවටත්, ඔහු ගේ පද්‍ය හා සමාන අන් කිසිද රසයක් ලෙව්හි නොමැති බවටත් ඔහු හා සමග සම්පූර්ණයෙන් ම එකඟවනු නො අනුමාන ය.

පද්‍ය රස විඳීමෙහි පරිචයක් නැති වූවකු ගේ පවා මන සවන පිනවන පරිද්දෙන් ශබ්දාර්ථ දෙක ම අති දක්ෂ ලෙස එක සේ ව්‍යක්තව සම්බන්ධ කොට අනුප්‍රාස රසයෙන් අනූනව නිබන්ධිත ගීත ගෝවින්දය අන්‍ය භාෂාවකට පෙරලීමට දරණ උත්සාහය, අත්‍යර්ථයෙන් ම ව්‍යර්ථ වන ප්‍රයත්නයක් යැයි, ගීත ගෝවින්දයේ අපූර්ව ගුණයන් පිළිබඳව "සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය" නම් සවකිය ග්‍රන්ථයේ බැරිඩේල් කීත් නමැති මහා සාහිත්‍ය විශාරදයාණන් විසින් කර තිබෙන නිගමනය ගැන දන්නා නමුදු ලෝක සාහිත්‍ය ග්‍රන්ථයක් බවට පත්ව ඇති මෙය සිංහලට පෙරලීමට මා සිත තුළ ඇති වූ ආශාව යටපත් කළ නොහැකි වූයේ, එහි රස සපුරා විඳීමේ භාග්‍යය මට ලැබුණු බැවිනි.

මා සකුවෙහි මෙන් ම සංගීතයෙහි ද වැඩිදුරටත් හික්මවා ලූ, පූර්වාපර භාෂා ශාස්ත්‍රප්‍රවීණ සංගීත විශේෂඥවර ගම්පල පුෂ්පවිබණ්ඩාර ඉලංගසිංහ රවේ මහතාණන් වෙතින්, සියුම් අරුත් විකසිතව, ගැයුම් වැයුම් සහිතව ගලා විත් මහද තුළ පිවිසගත් ගීත ගෝවින්ද රස ධාරාව උතුරා යා නො දී වළක්වා ලීමේ ශක්තියක් නොමැති වීම මේ අනුවාද කරණයෙහි මා පුහුකළ බව මුත්, එහි නියම රසය සිංහලෙන් දීමේ සමත් බවක් මා තුළ ඇතැයි යන ලෙෂමාත්‍රවත් හැඟීමකින් නොවන බව කිව යුතු ය.

කාලයක් තිස්සේ මේ ගැන සිත සිතා සිට, එය කළ යුතුමයයි නියත වශයෙන් ම තීරණය කර ගත් දින ඉලංගසිංහ ආචාර්යෝත්තමයාණන්ට සහ, මගේ සාහිත්‍යකෘති සඳහා උපදේශ දීමාදියෙන් අනුග්‍රහ කර වදාරණ සංස්කෘත සහ සිංහල භාෂා පිළිබඳ විශිෂ්ට පාණ්ඩිත්‍යයෙකින්

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

මෙහි ඇතැම් ගීතයන් ශ්‍රී විෂ්ණු ම නිබන්ධිත බව ජනප්‍රවාදයයි....................

මේ දක්වා සිංහල අකුරෙන් පවා මුද්‍රණය වී නොමැති මේ ගැන මහත් ආයාසයක් සහ කාලයක් යෙදවිය යුතු බව සලකාවම්හ."

අනුවාද කරණයෙහි භාරදූර භාවය ගැන මනා වැටහීමකින් යුතු ව එහි යෙදීමට මේ හිතවත් අනුශාසනා වන් නිසා පුළුවන් වූ බව කෘතඥතා පූර්වකව සඳහන් කළ යුතුය.

සංස්කෘත ගීතයන්හී එන රාග තාල අනුව ම සිංහල ගී බැඳි අතර ශ්ලෝකයන් ඒ ඒ අවස්ථාවට අනුරූපවන වෘත්තමය කවිවලට නඟන ලදී. හැකි සෑම තැන ම සිංහල ව්‍යවහාරයට පත්ව ඇති සංස්කෘත පදයන් එසේ ම යෙදුවෙමි. සිංහල කාව්‍ය ග්‍රන්ථවල එන සම්ප්‍රදායට අනුරූප වන පරිදි පළමු වන ශ්ලෝකය කෙටි කවි තුනකට ද, (1 – 2 – 3) දෙවන ශ්ලෝකය දෙකකට ද (4 – 5) එසේ ම 284 වන ශ්ලෝකය දෙකකට ද (287 (i) 287 (ii) පෙරළා ඇත. මෙ බැවින් සංස්කෘත ග්‍රන්ථයෙහි ඇති පද්‍ය ගණනට වඩා පද්‍යයන් සතරක් අනුවාදයෙහි අඩංගු වන්නේ ය. සිංහල පද්‍ය අනුව අංක දීම නිසා ය, 5 වැනි ශ්ලෝකය 8 වැන්න ලෙස දක්වා ඇත්තේ.

රාග තාලයන් ද නො ඉක්මවා, අර්ථයත්, රසයත්, සෞන්දර්යයත් රැකා ගැනීමට දරන ලද ඉමහත් වෑයම කෙතරම් දුරට සාර්ථක වී ඇද්ද යි යන්න නිගමනය කිරීම රසිකයනට භාර වූවකි. සංස්කෘත පෙළ හා සිංහල අනුවාදය ප්‍රතිවිරුද්ධ පිටුවල දක්වා තිබීම නිසා මේ සැසඳීම වඩාත් පහසු වනු ඇත.

මෙය සකස් කිරීමෙහි ලා නොයෙක් අන්දමින් අප උනන්දු කළ, එසේ ම අත් පිටපත මුළුමනින් ම කියවා සප්‍ර

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

යෝජනාවත් ශාස්ත්‍රීය උපදෙශයන් දීමෙන් අනුග්‍රහ කළ, සිංහල මහා ශබ්ද කෝෂයෙහි සහකාර කර්තෘවර විද්වද් ජෝන් සිරිමන් ද සොයිසා සිරිමතාණන් හට අපගේ සාදර ස්තුතිය හිමි වන්නේය. එසේ ම මෙහිදී අප මිත්‍ර ඩී. ජේ. කුමාරගේ මහතාණන් ගෙන් ලැබුණ උපකාරයන් ද අගය කොට සලකන බව සඳහන් කළයුතුය.

වත්මන් කිවි පරපුර තැනීමෙහි උත්සුක වීමේ උත්තම ගුණය නිසා කවීන්ගේ කවියෙකු බවට පත්වූ, ශබ්දාර්ථ රසයෙන් රස කැවුන ප්‍රාණවත් භාෂා ශෛලියකින් කියවන්නන් කිතිකවා අසහාය රසවතෙකු ලෙස අමරනීය වූ ධර්මපාල මුනිදාස මහා වියතාණන් ගේ නාමයට මෙය පිළිගැන්වෙන්නේ අප වෙත සදකල්හි දක්වූ සාදරයට සම්මානනයක් වශයෙනි.

මේ කෘතියෙහි දී ගීත ගෝවින්දය පිළිබඳ ව ලියැවී ඇති සංස්කෘත මෙන් ම ඉංග්‍රීසි ටීකා, ව්‍යාඛ්‍යාන ද කිහිපයක් ම ආශ්‍රය කළමුත්, ගුරුපොත වශයෙන් සලකන ලද්දේ නිර්ණය සාගර යන්ත්‍රාලයීය පොත ය.

ගීත ගෝවින්ද අනුවාදයෙන් කව් කලාව අගය කරන සිංහල පාඨකයන්ගේ රස ඇවිස්සෙතොත් එය ම අපගේ උත්සාහයට ප්‍රමාණවත්ය.

ඇතැම් තැනෙක දක්නා ලැබෙන මුද්‍රණ දෝෂයන් දෙවන මුද්‍රණයෙහි දී සකස් වනු ඇත.

මෙය මුද්‍රණමාර්ගයෙන් ප්‍රචාරය කිරීමට ඉදිරිපත් වූ ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගමේ අධ්‍යක්ෂවර ජ්. පී. ඩී. ජිනදාස මහතාට කියවීම් ලෝකයේ ස්තුතිය හිමි විය යුතු ය.

මුහන්දිරම් මුල්ලපිටියේ කෝ. එච්. ද සිල්වා
අභයසිංහ විජයශ්‍රීවර්ධන.

1958 මාර්තු 13 වැනි දින
මුල්ලපිටියේ
බමුණුවතන වලව්වේදීය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

උපහාර

පිවිතුරු යෙදුමෙන් විසිතුරු බැඳුමෙන්
අමයුරු සැදුමෙන් වන ආ සා
පදයට පබඳට නව පණ පමුණා පමොදට
පත්කළ හෙළ බා සා

තුඩ තුඩ රස පද ලියලන අනුබල ලද හෙළ
කවිකුල දුන් රු වේ
රස සයුරාණනි රස මිතුරාණනි බස
ඉසුරාණනි ලංකා වේ

මී ඔඩමක් සරි ගී පිරිතිරි බැති සීකර
සිතල ගති සා මි
හෙම්පල් මුනිදස් මිතු ගෙල ගුණෙනුස්
පළඳිමි මෙමගත් මල් දා මේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගීතගොවින්ද කාව්‍යය

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගීතගොවින්ද කාව්‍යම්.

ප්‍රථමඃ සර්ගඃ.

1

මෙඝෛර්මේදුරමම්බරං වනභුවඃ ශ්‍යාමාස්තමාලද්‍රුමෛර්-
නක්තං භීරුරයං ත්වමෙව තදිමං රාධෙ ගෘහං ප්‍රාපය
ඉත්ථං නන්දනිදෙශතශ්චලිතයොඃ ප්‍රත්‍යධ්වකුඤ්ජද්‍රුමං
රාධාමාධවයොර්ජයන්ති යමුනාකූලෙ රහඃකෙලයඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගීතගොවින්ද කාව්‍යය.

පළමු වන සග

1

සිනිඳුය වෙලිතඹ ර
වනවල තමලු තුරු බ ර
තොප සෙ බියකරු ගො ර
පැමිණී රැකල වතළ ගණඳ ර

2

රාදූව යව ගෙ ම
පවසන නන්ද මෙලෙස ම
කළිඳු නදි තෙර ව ම
නිහඬ ගස්ගොමු වදුළු තුරු ය ම

3

සැඟවෙන කෙළි දෙ ලේ
රාද මාදව සුව ලේ
ඔකාඳ කෙළි අව ලේ
දිනේවා සැම ලෙසින් උදූ ලේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

2

වාග්දේවතාචරිතචිත්‍රිතචිත්තසද්මා
පද්මාවතීචරණචාරණචක්‍රවර්ති
ශ්‍රීවාසුදේවරතිකේලිකථාසමේත-
මේතං කරෝති ජයදේවකවිඃ ප්‍රබන්ධම්

3

යදි හරිස්මරණේ සරසං මනෝ යදි විලාසකලාසු කුතූහලම්
මධුරකෝමලකාන්තපදාවලීං ශෘණු තදා ජයදේව-
සරස්වතීම්.

4

වාචඃ පල්ලවයත්‍යුමාපතිධරඃ සන්දර්භශුද්ධිං ගිරාං
ජානීතේ ජයදේව ඒව ශරණඃ ශ්ලාඝ්‍යෝ දුරූහද්‍රුතේඃ
ශෘංගාරෝත්තරසත්ප්‍රමේයරචනෛරාචාර්යගෝවර්ධන-
ස්පර්ධී කෝ'පි න විශ්‍රුතඃ ශ්‍රුතිධරෝ ධෝයී කවික්ෂ්මාපතිඃ.

මාලව රාගේණ රූපකතාලේන ගීයතේ.

8

ප්‍රලයපයෝධිජලේ ධෘතවානසි වේදම්
විහිතවහිත්‍රචරිත්‍රමඛේදම්
කේශව ධෘතමීනශරීර ජය ජගදීශ හරේ - ධ්‍රුවම්.

Dr. Urmila Sharma Collection, Varanasi

4

සරසවි සිරිත රැ ති
සිතු සිතුවම් මැදුරු ඇ ති
සිරිසර සරණ පෙ ති
සරන සැම සත කෙරෙන් සක්වි ති

5

සිරි වසුදෙව් සුර ත
කෙළිනතු කතා රසව ත
මෙපබඳ හෙබි සිරි ත
කෙරේ ජයදෙව් කිවිදු බැති යු ත

6

සිත සිහිකරත හරි සිහිලස ග න්නේය
රත රස කෙළිකලා කුතුහල ව න්නේය
වත සුමිහිරි කොමල පිය පද ස න්නේය
සත ජයදෙව් බසට ඉන් කන් දෙ න්නේය

7

වදන් දළු "උමාපතිදර" ලියල ව න
දුලඳරුන් "සරණ" "සුතිදර" "ගෝවර්ධ න"
සිරිඟර සමත "ධෝයී" කිවි තරවර න
ජය දෙව්මය සුපිවිතුරු යෙදුමෙහි නද න

රාගය – මාලව තාලය – රූපක

8

යුගත මහා මුහුදේ ගිලි වේද සෙව්මෙන්
රුකඳුන් මැනවින් මතුකර ලීමෙන්
කේසව දරු මීනවතාර ජය ජගදීස හරේ

CC0. In Public Domain, Digitizagtion by eGangotri

9

ක්ෂිතිරතිවිපුලතරෙ තව තිෂ්ඨති පෘෂ්ඨෙ
ධරණිධරණකිණචක්‍රගරිෂ්ඨෙ
කෙශව ධෘතකච්ඡපරූප ජය ජගදීශ හරෙ –

10

වසති දශනශිඛරෙ ධරණී තව ලග්නා
ශශිනි කලඞ්කකලෙව නිමග්නා
කෙශව ධෘතශූකරරූප ජය ජගදීශ හරෙ –

11

තව කරකමලවරෙ නඛමද්භුතශෘඞ්ගම්
දලිතහිරණ්‍යකශිපුතනුභෘඞ්ගම්
කෙශව ධෘතනරහරිරූප ජය ජගදීශ හරෙ –

12

ඡලයසි වික්‍රමණෙ බලිමද්භුතවාමන
පදනඛනීරජනිතජනපාවන
කෙශව ධෘතවාමනරූප ජය ජගදීශ හරෙ –

13

ක්ෂත්‍රියරුධිරමයෙ ජගදපගතපාපම්
ස්නපයසි පයසි ශමිතභවතාපම්
කෙශව ධෘතභෘගුපතිරූප ජය ජගදීශ හරෙ –

14

විතරසි දික්ෂු රණෙ දික්පතිකමනීයං
දශමුඛමෞලිබලිං රමණීයම්
කෙශව *ධෘතරාමශරීර ජය ජගදීශ හරෙ –

15

වහසි වපුෂි විශදෙ වසනං ජලදාභම්
හලහතිභීතිමිලිතයමුනාභම්
කෙශව ධෘතහලධරරූප ජය ජගදීශ හරෙ –

---

*'රඝුපතිරූප' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

9

ඔබ පිටැ විපුල තරේ මිහි මණ්ඩල වැස්වී
ලකුණ දෙරණ දූරු ලපිනි සුදිස්වී
කේසව කුමු රූපවතාර ජය ජගදීස හරේ

10

දෙරණ ඔබගෙ දළගේ ඇවිනී රැඳෙමින්නා
සුදිලි පසන් සඳලේ ලපමෙන්නා
කේසව දූරු සූකර රූප ජය ජගදීස හරේ

11

ඔබකර කමල වරේ නිය උල්වුන සිඟුමෙන්
පැළුව හිරණ්‍ය කසිපු ගත බිඟුමෙන්
කේසව දූරු නරසිහ රූප ජය ජගදීස හරේ

12

රුවටුව වික්‍රමයෙනී බලි විස්මිත වාමන
පද නිය නීර ජනිත ජන තේමන
කේසව දූරු වාමන රූප ජය ජගදීස හරේ

13

කැත් කුළ ලෙහෙ ජලයේ ඉමහත බව තාපෙන්
නහවා මෙදෙරණ දුරුකළ පාපෙන්
කේසව දූරු බිගුපති රූප ජය ජගදීස හරේ

14

පිතවුව මන් සුරනෝ දික්පති රණ කාමෙන්
දස හිස වොටුනු පෙළින් බලි දීමෙන්
කේසව දූරු රාමවතාර ජය ජගදීස හරේ

15

හලෙන හලත බියෙනෝ ගමනොත් යමුනාවන්
සැදි නිල පැහැදුල සළු සුමනාවන්
කේසව දූරු බලරම රූප ජය ජගදීස හරේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

16

නින්දසි යඥවිධෙරහහ ශ්‍රුතිජාතම්
සදයහෘදය දර්ශිතපශුඝාතම්
කෙශව ධෘතබුද්ධශරීර ජය ජගදීශ හරෙ –

17

ම්ලෙච්ඡනිවහනිධනෙ කලයසි කරවාලං
ධූමකෙතුමිව කිමපි කරාලම්
කෙශව ධෘතකල්කිශරීර ජය ජගදීශ හරෙ –

18

ශ්‍රී ජයදෙවකවෙරිදමුදිතමුදාරම්
ශෘණු ශුභදං සුඛදං භවසාරම්
කෙශව ධෘතදශවිධරූප ජය ජගදීශ හරෙ –

19

වෙදානුද්ධරතෙ ජගන්නිවහතෙ භූගොල මුද්බිභ්‍රතෙ
දෛත්‍යාන්දාරයතෙ බලිං ඡලයතෙ ක්ෂත්‍රක්ෂයං කුර්වතෙ
පෞලස්ත්‍යං ජයතෙ හලං කලයතෙ කාරුණ්‍යමාතන්වතෙ
ම්ලෙච්ඡාන්මූර්ච්ඡයතෙ දශාකෘතිකෘතෙ කෘෂ්ණාය
තුභ්‍යං නමඃ.

ගූර්ජරීරාග නිඃසාරතාලාභ්‍යාං ගීයතෙ 2.

20

ශ්‍රිතකමලාකුචමණ්ඩල ධෘතකුණ්ඩල එ
කලිතලලිතවනමාල ජය ජය දෙව හරෙ – ධ්‍රුවම් –

21

දිනමණිමණ්ඩලමණ්ඩිත භවඛණ්ඩන එ
මුනිජනමානසහංස ජය ජය දෙව හරෙ –

22

කාලියවිෂධරගඤ්ජන ජනරඤ්ජන එ
යදුකුලනලිනදිනෙශ ජය ජය දෙව හරෙ –

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

16

නින්දිත බිලි වේදේ ඉවතට හල ඝෘගෙන්
සතුන වෙතෙහි මන් මහ කාරුණාවෙන්
කේසව දූරු සම්බුදුවේස ජය ජගදීස හරේ

17

මෙලෙසි වැනසූ මෙලොවේ යහ සත වෙත ජේමෙන්
දූමකේතු සරි කඟත දූරීමෙන්
කේසව දූරු කල්කි සරීර ජය ජගදීස හරේ

18

සිරි ජය දේව කිවී මෙම උදිත උදුරම්
අස සුබ බව බිය සින්දු උදුනම්
කේසව දූරු දස අවතාර ජය ජගදීස හරේ

19

වේදය දූරු ලොව ඉසුලූ මිහි සැත සු
දුතව මැරූ බලි රුවටූ කැත් වැත සු
රාවණ දිනූ හල මිහිඳු දයා දෙ සු
නාසක මෙලෙසු ඔබ නමදිමි මෙදස වෙ සු

රාගය – ගුර්ජරී තාලය – නිඃසාර

20

බැඳ කමලා තන මණ්ඩල දූරු කුන්ඩල ඒ
කලත ලලිත වනමාල ජය ජය දේව හ රේ

21

දිනමිණි මඩල පලන්දන බව බින්දන ඒ
මුනිජන මානස හංස ජය ජය දේව හ රේ

22

කාලිය ඝොරසපු බින්දන දන නන්දන ඒ
යදුකුල නලින දිනේස ජය ජය දේව හ රේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

23

මධුමුරනරකවිනාශන ගරුඩාසන එ
සුරකුලකෙලිනිදාන ජය ජය දෙව හරෙ -

24

අමලකමලදලලොචන භවමොචන එ
ත්‍රිභුවනභවන†නිදාන ජය ජය දෙව හරෙ -

25

ජනකසුතාකෘතභූෂණ ජිතදූෂණ එ
සමරශමිතදශකණ්ඨ ජය ජය දෙව හරෙ -

26

අභිනවජලධරසුන්දර ධෘතමන්දර එ
ශ්‍රීමුඛචන්ද්‍රචකොර ජය ජය දෙව හරෙ -

27

තව චරණෙ ප්‍රණතා වයමිති භාවය එ
කුරු කුශලං ප්‍රණතෙෂු ජය ජය දෙව හරෙ -

28

ශ්‍රීජයදෙවකවෙරිදං කුරුතෙ මුදම් එ
මඞ්ගලමුජ්ජ්වලගීති ජය ජය දෙව හරෙ -

29

පද්මාපයොධරතටීපරිරම්භලග්න-
කාශ්මීරමුද්‍රිතමුරො මධුසූදනස්‍ය
ව්‍යක්තානුරාගමිව ඛෙලදනඞ්ගඛෙද-
ස්වෙදාම්බුපූරමනුපූරයතු ප්‍රියං වඃ-

30

වසන්තෙ වාසන්තීකුසුමසුකුමාරෛරවයවෛර් -
භ්‍රමන්තීං කාන්තාරෙ බහුවිහිතකෘෂ්ණානුසරණාම්
අමන්දං කන්දර්පජ්වරජනිතචින්තාකුලතයා
වලද්බාධාං රාධාං සරසමිදමූචෙ සහචරී.

---

†නිධාන ඉති පාඨඃ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

23

"මදු" "මුර" "නරක" විනාශන ගරුඩාසන ඒ
සුරකුලකේලි නිදාන ජය ජය දේව හ රේ

24

අමල කමල දල දෙනුවන බව මුදවන ඒ
තිලෝතල සකල සදන ජය ජය දේව හ රේ

25

ජනක සුතා කළ බුසණ දිනු "දූසණ" ඒ
යුද්ද වැද දස හිස සින්ද ජය ජය දේව හ රේ

26

නව වැසි වෙළ වැනි සුන්දර දුරු මන්දර ඒ
සිරිමුව සඳ සියුරාණ ජය ජය දේව හ රේ

27

ඔබ සරණා සිර රන්දන කර වන්දන ඒ
දෙව සිරි සැප සතොසාන ජය ජය දේව හ රේ

28

සිරි ජය දේව පලෝබන කළ සෝබන මේ
සුන්දර මංගල ගීත ජය ජය දේව හ රේ

29

පද්මා පියොවුරු පිරිරුඹ හැසිරී
දිස්නා රොන්සුණු සිරියල් ඇසිරී
වස්නා මින්දද සෙද බිඳු විසිරී
තුස්වා දින දින වස්දෙවි අසිරී

30

වසත් කුසුම් සරි සියුමැලි ගත කොමළ
සුරත් සුරත රුදු සර වසත් කල
වසත් වල සොවින් සිහිකර කමල් කල
පුවත් මෙම පැවසි හිතවත් කලක් මොළ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

වසන්තරාග යතිතාලාභ්‍යාං ගීයතෙ.

31

ලලිතලවඞ්ගලතාපරිශීලනකොමලමලයසමීරෙ
මධුකරනිකර කරම්බිතකොකිලකූජිතකුඤ්ජකුටීරෙ,
විහරති හරිරිහ සරසවසන්තෙ නෘත්‍යති
යුවතිජනෙන සමං සඛි විරහිජනස්‍ය දුරන්තෙ – ධ්‍රුවම් –

32

උන්මදමදනමනොරථපථිකවධූජනජනිතවිලාපෙ
අලිකුලසංකුලකුසුමසමූහනිරාකුලබකුලකලාපෙ
විහ –.

33

මෘගමදසෞරභරභසවසංවදනවදල මාලතමාලෙ
යුවජනහෘදයවිදාරණමනසිජ නඛරුචිකිංසුකජාලෙ
විහ –.

34

මදනමහීපතිකනකදණ්ඩරුචිකෙසර කුසුමවිකාසෙ
මිලිතශිලීමුඛ[b]පාටලපටලකෘතසමරතූණවිලාසෙ
විහ –.

---

a 'චලත්' – ඉති පාඨ: b 'පාටලිපටල' – ඉතිපාඨ:
c 'අවලොකිත කරුණ' – ඉතිපාඨ: d 'කෙතකී' – ඉතිපාඨ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

රාගය – වසන්ත තාලය – යති

31

ලලිත ලවංග ලතා පරිසේවන කෝමල මලය සමීරේ
කෝකිල කූජිත බිඟු ගුමු ගායන රැව්දෙන ලිය මඩු මීරේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි
වෙසි හදයන්තේ

32

මල්සර සරවැද වියොලද කල්බඳ උන්මද නහන විලාපේ
බිඟුමුළු රොද බැඳි සුපිපුණු අතු ඉති සරසන වකුල කලාපේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි
වෙසි හදයන්තේ

33

ඉම්හිරි කස්තුරි සුවඳ විහනන එන නවදල මාල තමා ලේ
එරබදු මල් පෙති මනයොන තියවැනි හදවන පාරන බා ලේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි
වෙසි හදයන්තේ

34

මදන මහිපති කණක දණ්ඩයුති විකසිත කේසර කුසුමේ
බමර බරිනි පිරි පළොල පොකුරු මල් හියොවුරු සරි
සැර කුසුමේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි
වෙසි හදයන්තේ

Dr. Urmila Sharma Collection, Varanasi

35

විගලිතලජ්ජිතජගදවලොකනතරුණකරුණකෘතහාසෙ
විරහිනිකෘන්තනකුන්තමුඛාකෘති කෙතකදන්තුරිතාසෙ
විහ –.

36

මාධවිකාපරිමලලලිතෙනවමාලතිජාතිසුගන්ධෞ
මුනිමනසාමපි මොහනකාරිණි තරුණාකාරණබන්ධෞ
විහ.–

37

ස්ඵුරදතිමුක්තලතාපරිරම්භණ මුකුලිතපුලකිතචූතෙ
වෘන්දාවනවිපිනෙ පරිසරපරිගතයමුනාජලපූතෙ,
විහ–.

38

ශ්‍රීජයදෙවභණිතමිදමුදයති හරිචරණස්මෘති සාරම්
සරසවසන්තසමයවනවර්ණනමනුගතමදනවිකාරම්
විහ–.

CC0. In Public Domain, Digitizagtion by eGangotri

35

විලිහල ලොව දක තරුණ කරුණ තුරු කුසුම මුවිනි
දෙන හාසේ
විරහිනි හද ඇනි කොතවිය මුත වැනි කේතකි පෙති
පර කාසේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි
වෙයි හදයන්තේ

36

මෝහන කරවන මුනිමනවුව නවයව්වන සුහද පබන්දේ
සෝබන දකොඳ මාදවි මාලති විකසිත කුසුම සුගන්දේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි
වෙයි හදයන්තේ

37

මිනිමුතු මුතුමල් පිරි අඹ තුරු වැල් වලඳින තුටිනි පිළියේ
වුන්දවන පරිසර පිවිතුරු කර හැරි හැරි කලිනි ගැලීයේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි
වෙයි හදයන්තේ

38

අනුරු රසයන උතුරු මනයොන රජයන වනය වස න්තේ
සිවුබුජ සිරිපද සිහිවන සිරිජය දෙව් වැනි බැතිනි අන න්තේ
වෙහෙසන විරහිනි සරස වසන්තේ
කොමලඟ ළඟ රඟ නිලඟ වෙසේ සකි වියොගිනි වෙයි
හදයන්තේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

39

දරවිදලිතමල්ලීවල්ලිචඤ්චත්පරාග-
ප්‍රකටිතපටවාසෛර්වාසයන්කානනානි
ඉහ හි දහති චෙතඃ කෙතකීගන්ධබන්ධුඃ
ප්‍රසරදසමබාණප්‍රාණවද්ගන්ධවාහඃ

40

උන්මීලන්මධුගන්ධලුබ්ධමධුපව්‍යාධූතචූතාඞ්කුර-
ක්‍රීඩත්කොකිලකාකලීකලරවෛරුද්ගීර්ණකර්ණජ්වරාඃ
නීයන්තෙ පථිකෛඃ කථංකථමපි ධ්‍යානාවධානක්‍ෂණ-
ප්‍රාප්තප්‍රාණසමාසමාගමරසොල්ලාසෛරමී වාසරාඃ

41

අනෙකනාරීපරිරම්භසම්භ්‍රමස් -
ඵුරන්මනොහාරිවිලාසලාලසම්
මුරාරිමාරාදුපදර්ශයන්ත්‍යසෞ
සඛී සමක්‍ෂං පුනරාහ රාධිකාම්

රාමකරීරාග යතිතාලාභ්‍යාං ගීයතෙ.

42

චන්දනචර්චිතනීලකලෙවරපීතවසනවනමාලි
කෙලිචලන්මණිකුණ්ඩලමණ්ඩිතගණ්ඩයුගඃ ස්මිතශාලී
හරීරිහ මුග්ධවධූනිකරෙ විලාසිනි විලසති කෙලිපරෙ -
ධ්‍රැවම් -

43

පීනපයොධරභාරභරෙණ හරිං පරිරභ්‍ය සරාගම්
ගොපවධූරනුගායති කාචිදුදඤ්චිතපඤ්චමරාගම්
හරී-.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

39

පෙති දිග හැර හැර කේතකී සුවඳ සලාලයි
ලවඟ කුසුම් මුවරද පටසේල සඳුලයි
මලවිය පණ උතුරුයන සුළඟ වලාලයි
මෙවසත් සමයේ සංලෙළුන් මනස තවාලයි

40

මී සුවඳට බිඟුරොද බැඳි අඹදළු කිනි ති
ගී කිය කිය කන සකියන කෝකිල සාඩ තී
කී කාල දෙය පණ වැනි පියහන සඟ කැම තී
සී කර කර දූහැනම මෙන් මගිදන තැවෙ තී

41

සුබෙ.ලඳ පියකරු පියබඳ නොම දෑ
සිඹ සනසා ඇද බැද බඳ වැළ දෑ
කැලඹුණු කළු දෙස දක්වා රු දෑ
යල පියයෙහෙළිය පැවසිය මෙලෙ දෑ

රාගය – රාමකරී තාලය – යති

42

චන්දන කල්සාය නීලබඳේ සැදි පීත වසන වන මාලී
පාන රංගුම් මණ්ඩි කුන්ඩල පන්දන හාස කොපුල් සුකු මාලී
කෙළි ලොල මත්ත සලී සලෙලේ සභා හරි රඟ අනුරාග
දෙළේ

43

තාල පුරු සිරිහාර හරු හඩ නංවන ගෝපිනියක් කිසියම්
පීන පයෝදර ආරන යාකර වැළඳ ගයයි ගී රස මනරම්
කෙළි ලොල මත්ත සලී සලෙලේ සභා හරි රඟ අනුරාග
දෙළේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

44

කාපි විලාසවිලොලවිලොචනඛෙලනජනිතමනොජම්
ධ්‍යායති මුග්ධවධූරධිකං මධුසූදනවදනසරොජම්,
හරි-,

45

කාපි කපොලතලෙ මිලිතා ලපිතුං කිමපි ශ්‍රුතිමූලෙ
චාරුචුචුම්බ නිතම්බවතී දයිතං පුලකෛරනුකූලෙ
හරිං .

46

කෙලිකලාකුතුකෙන ච කාචිදමුං යමුනාජලකූලෙ
මඤ්ජුලවඤ්ජුලකුඤ්ජගතං විචකර්ෂ කරෙණ දුකූලෙ,
හරි-.

47

කරතලතාලතරලවලයාවලිකලිතකලස්වනවංශෙ
රාසරසෙ සහ නෘත්‍යපරා හරිණා යුවතිඃ ප්‍රශශංසෙ,
හරි-.

48

ශ්ලිෂ්‍යති කාමපි චුම්බති කාමපි කාමපි රමයති රාමාම්
පශ්‍යති සස්මිතචාරුතරාම පරාමනුගච්ඡති වාමාම්,
හරි-.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

44

රාගතුරා සපුරා උතුරා යන දෑසකැළුම් කෙළිලොල් තිසුණු
ලාලන ලාලතියක් මදුසුදන අංගන ලෝලවී දිසුණු
කෙළි ලොල මත්ත සළි සලෙලේ සහා හරි රහ අනුරාග
දෙළේ

45

රෑමතියක පිරි නිතඹ බරින් බර කොඳුරන සේ රග සේනී
විලඟ සවනට ආදර ඔකඳිනි සිපගනී කපොල ර සේනී
කෙළි ලොල මත්ත සළි සලෙලේ සහා හරි රහ අනුරාග
දෙළේ

46

රාග කලා ගිජු ගෝපි කුතුහලයෙන් යමුනා ගඟ තීරේ
වේණු වෙනෝ වැදි වෙන් ඇඳි දූලෙනි අදිනී සුරතට මීරේ
කෙළි ලොල මත්ත සළි සලෙලේ සහා හරි රහ අනුරාග
දෙළේ

47

කරතල තාලය හඬවන වලහඬ මුසු මුදු නාදෙට වස් දඹු වේ
පියබඳ පසසයි හරිසහ හවුලට රහදෙන රාගය රස තනු වේ
කෙළි ලොල මත්ත සළි සලෙලේ සහා හරි රහ අනුරාග
දෙළේ

48

එකියක වළඳියි එකියක සිපගනී අනිකක සහ සුරතල්සේ
සුරතක් හිනැහෙන වෙත නෙතු සැර හැර තවෙකක් යයි
මන ලොල්සේ
කෙළි ලොල මත්ත සළි සලෙලේ සහා හරි රහ අනුරාග
දෙළේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

49

ශ්‍රී ජයදෙවභණිතමිදමද්භුතකෙශවකෙලිරහස්‍යම්
වෘන්දාවනවිපිනෙ ලලිතං විතනොතු ශුභානි යශස්‍යම්,
හරි–.

50

විශ්වෙෂාමනුරඤ්ජනෙන ජනයන්නානන්දමින්දීවර –
ශ්‍රෙණීශ්‍යාමලකොමලෛරුපනයන්න–
ඞ්ගෛරනඞ්ගොත්සවම්,
ස්වච්ඡන්දං ව්‍රජසුන්දරීභිරභිතඃ ප්‍රත්‍යඞ්ගමාලිඞ්ගිතඃ
ශෘඞ්ගාරඃ සඛි මූර්තිමානිව මධෞ මුග්ධො හරිඃ ක්‍රීඩති.

51

නිත්‍යොත්සඞ්ගවසද්භුජඞ්ගකවලක්ලෙශාදිවෙශාචලං
ප්‍රාලෙයප්ලවනෙච්ඡයානුසරති ශ්‍රීඛණ්ඩශෛලානිලඃ,
කිං ච ස්නිග්ධරසාලමෞලිමුකුලාන්‍යාලොක්‍ය හර්ෂොදයා–
දුන්මීලන්ති කුහූඃ කුහූරිති කලොත්තාලාඃ පිකානාං ගිරඃ.

52

රාසොල්ලාසභරෙණ විභ්‍රමභෘතාමාභීරවාමභ්‍රුවා –
මභ්‍යර්ණෙ පරිරභ්‍ය නිර්භරමුරඃ ප්‍රෙමාන්ධයා රාධයා,
සාධු ත්වද්වදනං සුධාමයමිති ව්‍යාහෘත්‍ය ගීතස්තුති –
ව්‍යාජාදුද්භටචුම්බිතස්මිතමනොහාරී හරිඃ පාතු වඃ.

'කාවෙරීදමද්භුත' ඉතිපාඨඃ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

49

කේසව කෙළි දෙලෙ කෙළි දල විසිතුරු වුන්ද වන වදුලේහි
වේ සුබ මංගල සිරි ජය මංගල සිරිජය දෙවී තෙපුලේහී
කෙළි ලොල මත්තසලි සලෙලේ සනා හරි රඟ අනුරාග
දෙළේ

50

කල් කෙළිලොල් රොද බැඳ වැද සිප සිනිදු
නිල් මහනෙ‍ල් මල්පෙති මුදු ගත ගොවිදු
මල් සර සිරින් අනුරා රස කර පුබුදු
කල් ගත කරන සැටි බල යෙහෙළිය පුරුදු

51

නි බ ද බැඳුන සපුවිස ගිම හරන ලෙදේ
සු ව ද මලය නල හිමගල වෙතට ඇදේ
පැ හැ ද දකිනු මුදු අඹ හිස කැකුළු සුදේ
නොමද කොවුල් කුහු කුහු හඬ දසත සැදේ

52

පෙම් කෙළි පැළඹ කුල්මත් කල් මැද ගොපලු
පෙම් බර රුදුව හද වියොගිනි ඇවුලූ
නි ම් නැති සෙනෙහසින් සිපගත් වී තුරුලූ
හෙම් සළු හස නහන සුරකිත් ලොව සිසලූ

පළමු වන සග නිමි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ද්විතීයඃ සර්ගඃ

—

අක්ලෙශ කෙශවඃ

53

විහරති වනෙ රාධා සාධාරණප්‍රණයෙ හරෞ
විගලිතනිජොත්කර්ෂාදීර්ෂ්‍යාවශෙන ගතාන්‍යතඃ
ක්වචිදපි ලතාකුඤ්ජෙ ගුඤ්ජන්මධුව්‍රතමණ්ඩලී -
මුඛරශිඛරෙ ලීනා දීනාප්‍යුවාච රහඃ සඛීම්

ගුර්ජරීරාගෙණ යති තාලෙන ගීයතෙ.

54

සංචරදධරසුධාමධුරධ්වනිමුඛරිතමොදනවංශම්
චලිතදෘගඤ්චලචඤ්චලමෞලිකපොලවිලොලවතංසම්,
රාසෙ හරිමිහ විහිතවිලාසම්
ස්මරති මනො මම කෘතපරිහාසම් – ධ්‍රුවම් –

55

චන්ද්‍රකචාරුමයූරශිඛණ්ඩකමණ්ඩලවලයිතකෙශම්
ප්‍රචුරපුරන්දරධනුරනුරඤ්ජිතමෙදුරමුදිරසුවෙශම්,
රාසෙ –.

56

ගොපකදම්බනිතම්බවතීමුඛචුම්බනලම්භිතලොභම්
බන්ධුජීවමධුරාධරපල්ලවමුල්ලසිතස්මිතශොභම්.
රාසෙ –.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

දෙවන සඟ

53

ඔ කා ද   මූහුද ගිලෙම්නි වේණු ගොපලු   ලියේ
සු හ ද   කෙළි කෙළින වන වදුලෙහි   ඇලියේ
නි බ ද   ගුමු නහන ලිය ගොමුවක   තිලියේ
බොලඳ   රැදුව වියොදුක මෙ   තොපලියේ

රාගය – ගුර්ජරි   තාලය – යති

54

කන්කළු වස්දඹු ගී රස ගැන්වුන පොළඹන
සුමදුර   දෙතොලයි
කොමල බැළුම් ඉඟියෙන් හිස නටවන දෙකපොල
ලෙලදෙන   කොඩොලයි
රුමෙට නටම්නි නාටක   ගොපළු
සිහිවෙයි මට ඔහු කළ කී   විහිළු

55

පුන්සඳ සේ ලප මයුර පිළින් සැදි සුන්දර වට වෙලු   කේසයි
සොදුරු පුරන්දර දුනු කැළුමෙන් බර ගත හැම
ගෙනවෙර   වේසයි
රුමෙට නටම්නි නාටක   ගොපළු
සිහිවෙයි මට ඔහු කළ කී   විහිළු

56

කෝමල ගෝපිනි නිතඹ බරින් බර වත සිඹ ගැනුමෙහි පියැලී
දසනහ කැළුමෙන් දිලිසෙන ලා දල තොල් සරි බඳුවද පියැලී
රුමෙට නටම්නි නාටක   ගොපළු
සිහිවෙයි මට ඔහු කළ කී   විහිළු

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

57

විපුලපුලකභුජපල්ලවලයිතවල්ලවයුවතිසහස්‍රම්,
කරචරණොරසි a)මණිගණභූෂණකිරණවිභින්නතමිස්‍රම්,
රාසෙ –.

58

ජලදපටලb)චලදින්දුවිනින්දකචන්දනතිලකලලාටම්
පීනපයොධරපරිසරමර්දනනිර්දයහෘදයකපාටම්
රාසෙ –.

59

මණිමයමකරමනොහරකුණ්ඩලමණ්ඩිතගණ්ඩමුදාරම්
පීතවසනමනුගතමුනිමනුජසුරාසුරවරපරිවාරම්,
රාසෙ –.

60

විශදකදම්බතලෙ මිලිතං කලිකලුෂභයං ශමයන්තම්
මාමපි කිමපි තරලතරඞ්ගදනඞ්ගදෘශා මනසා රමයන්තම්
රාසෙ –.

61

ශ්‍රී ජයදෙවභණිතමතිසුන්දරමොහනමධුරිපුරූපම්
හරිචරණස්මරණං ප්‍රති සංප්‍රති පුණ්‍යවතාමනුරූපම්,
රාසෙ –.

---

a)'මණිමයභූ' – ඉති පාඨඃ. b)'චලත්' – ඉතිපාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

57

ලොමු දහැගැන්වුන තෙදහස් වල්ලබ කල් කර පල්ලව වැලදී
බුජ පද උරතල සැරසූ අබරණ මිණි කැලුමෙන'දර බිදිනලදී
රාමෙට නටමිනි නාටක ගොපළු
සිහිවෙයි මට ඔහු කළ කි විහිළු

58

ගතකුළු බැම මැද පුන්සඳ වන් දිලි චන්දන තිලකය තළලේ
පින් පියයුරු වැඩි එඩි හරනට මැඩි හැඩිදැඩි උරතල පළලේ
රාමෙට නටමිනි නාටක ගොපළු
සිහිවෙයි මට ඔහු කළ කි විහිළු

59

මිණිමය මුවර මනෝහර කුන්ඩල පන්දන කොපුල උදුරයි
පීත දුහුල දූල මුණිවර නරසුර අසුර නිකර පරිවාරයි
රාමෙට නටමිනි නාටක ගොපළු
සිහිවෙයි මට ඔහු කළ කි විහිළු

60

නිමල කදම්බ මූලේ පිය සුන්දරි සැනසූ සුපෙම් කෙළි කලහා
මා මන පිනවන සසල බැළුම් බැලූ මල්සර සර සර හා
රාමෙට නටමිනි නාටක ගොපළු
සිහිවෙයි මට ඔහු කළ කි විහිළු

61

සිරි ජය දේව වැණූ අති සුන්දර මෝහන මදුරිපු රූපේ
බැති යුතු යලි යලි හරි සිරි පද වෙත ඇතිකර හරවයි පාපේ
රාමෙට නටමිනි නාටක ගොපළු
සිහි වෙයි මට ඔහු කළ කී විහිළු

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

62

ගණයති ගුණග්‍රාමං භාමං භ්‍රමාදපි නෙහතෙ
වහති ච පරීතොෂං දොෂං විමුඤ්චති දූරතඃ,
යුවතිෂු [a]වලත්තෘෂ්ණෙ කෘෂ්ණෙ විහාරිණි මාං විනා
පුනරපි මනො වාමං කාමං කරොති කරොමි කිං.

මාලවගෞඩරාගෙණ ඒකතාලීතාලෙනච ගීයතෙ

63

නිභෘත නිකුඤ්ජගෘහං ගතයා නිශි රහසි නිලීය වසන්තම්
චකිතවිලොකිතසකලදිශා රති[b]රභසභරෙණ හසන්තම්,
සඛි හෙ කෙශිමථනමුදාරම් රමය මයා සහ
මදනමනොරථභාවිතයා සවිකාරම් – ධ්‍රුවම් –

64

ප්‍රථමසමාගමලජ්ජිතයා පටුචාටුශතෛරනුකූලම්
මෘදුමධුරස්මිතභාෂිතයා ශිථිලීකෘතජඝනදුකූලම්.

65

කිසලයශයනනිවෙශිතයා චිරමුරසි මමෛව ශයානම්
කෘතපරිරම්භණචුම්බනයා පරිරභ්‍ය කෘතාධරපානම්.

66

අලසනිමීලිතලොචනයා පුලකාවලිලලිතකපොලම්
ශ්‍රමජල[c]සකලකලෙවරයා වරමදනමදාදතිලොලම්.
සඛි —

---

[a]‘වලදිඤ්ජු’ – ඉති පාඨඃ. [b]‘රභසරසෙන’ ඉති පාඨඃ.
[c]සික්තකලෙවරයා. ඉතිපාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

62

බොළඳ මසිතු තවමත් වෙණු වෙතෙහි බැඳී
ඔ කා ද කරසි ඔහු ගොපලිය හට ලයෙදී
නි බ ද පෙනෙනු ගුණමය යටකර වැරදී
සු හ ද ඔබට නැත වෙනසක් මසිත යෙදී

63

රාගය – මාලවගෞඩි තාලය – ඒකතාල

ලිය ගොමුවෙන් වැසි වදුල තුලා රුඳි සැඟවී විසුව විස න්තේ
කොමල සිතාසෙත කොතැන ගියා ඔහු සොයනෙමි
නේක දිගන්තේ
යෙහෙලේ කේසී දිණු නොතබායා
කඳප දපා පා කරනට එව පොළඹාගෙන පියුම නැඹායා

64

පළමු සමාගම කෝලබියා මන මාමුව මුදු මද හාසයි
රුවටිලි බස් ඇනි සාදරයා ඇඳි උකුලෙහි ගිලිහුණු වාසයි
යෙහෙලේ කේසී දිණු නොතබායා
කඳප දපා පා කරණට එව පොළඹාගෙන පියුම නැඹායා

65

මගෙ ඇඟ ලංදෙල රිකිලි වියේ මගෙ පින් පියොවුරු ඔහු යානයි
බඳ බඳ තුරුළුව වැළඳ මුවේ මුවලා සිප ඉබාන'දර පානයි
යෙහෙලේ කේසී දිනු නොතබායා
කඳප දපා පා කරනට එව පොළඹාගෙන පියුම නැඹායා

66

පියවි වැසී යන දෙනයනයා වන විනිවිද ලොමු දූහැ ගැන් වෙයි
මදන මදු මුදනාවූ අංසෙනි මා ගත සෙද බිඳු දූන් වෙයි
යෙහෙලේ කේසී දිණු නොතබායා
කඳප දපා පා කරනට එව පොළඹාගෙන පියුම නැඹායා

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

67

කෝකිලකලරවකූජිතයා ජිතමනසිජතන්ත්‍රවිචාරම්
ශ්ලථකුසුමාකුලකුන්තලයා නඛලිඛිත ඝනස්තනභාරම්.
සඛි —

68

චරණරණිතමණිනූපුරයා පරිපූරිතසුරතවිතානම්
මුඛරවිශෘඞ්ඛලමෙඛලයා සකචග්‍රහචුම්බනදානම්.
සඛි —

69

රතිසුඛසමයරසාලසයා දරමුකුලිතනයනසරෝජම්
නිඃසහනිපතිතතනුලතයා මධුසූදනමුදිතමනෝජම්.
සඛි —

70

ශ්‍රීජයදෙවභණිතමිදමතිශයමධුරිපුනිධුවනශීලම්
සුඛමුත්කණ්ඨිතගෝපවධූකථිතං විතනෝතු සලීලම්.
සඛි —

71

හස්තස්‍රස්තවිලාසවංශමනෘජුභ්‍රූවල්ලිමද්වල්ලවී-
වෘන්දෝත්සාරිදෘගන්තවීක්ෂිතමතිස්වේදාර්ද්‍රගණ්ඩස්ථලම්,
මාමුද්වීක්ෂ්‍ය විලජ්ජිතං ස්මිතසුධාමුග්ධානනං කානනේ
ගෝවින්දං ව්‍රජසුන්දරීගණවෘතං පශ්‍යාමි හෘෂ්‍යාමි ච.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

67

කෝකිල කළරව රුචි පරයා දෙන පිරිසිඳ දත් කෙළි කාමේ
කොස කුසුමා කුල කුන්තලයා ලැම තිය සලකුණු මත රාමේ
යෙහෙලේ කේසී දිනු නොතබායා
කඳප දපා පා කරනට එව පොළඹාගෙන පියුම නැඹායා

68

සුරති රසට අනුරූප තියා පිරු නූපුර නාද දෙපා දේ
හිස කොස ගෙන වත සිඹින පියාදර රුවු දෙන මෙවුලෙහි නාදේ
යෙහෙලේ කේසී දිනු නොතබායා
කඳප දපා පා කරනට එව පොළඹාගෙන පියුම නැඹායා

69

රති සුව සමය රසාගතයා වෙණු හැකුළුණු නයන සරෝජේ
මදන තුරා රස පීඩිතයා බිදි මගන ලතා සිදි ඕජේ
යෙහෙලේ කේසී දිනු නොතබායා
කඳප දපා පා කරනට එව පොළඹාගෙන පියුම නැඹායා

70

සිරි ජය දේව වැණු අති සුන්දර මදුරිපු සිරිහර සිරිතයි
ගෝපිනි රස බස ඇසු දෙසු සැමටම සිරි සුබ මංගල බරිතයි
යෙහෙලේ කේසී දිනු නොතබායා
කඳප දපා පා කරනට එව පොළඹාගෙන පියුම නැඹායා

71

මැ ද වැ ද කොමල බැම නැමි ලඳ ලිය ගොපළු
ව න ඔ ද හරි මෙමා දුටු විගසම යහළු
උණු සෙද බිදු කොපුල ගිලිහිණි අත වෙවුළු
එ ම තු ද මදහසින් මුව සැරසිය හැකුළු

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

72

[a]දූරාලොකස්තොකස්තවකනවකාශොකලතිකා
විකාසඃ කාසාරොපවනපවනොපි ව්‍යථයති
අපි භ්‍රාම්‍යද්භෘඞ්ගී[b]රණිතරමණීයා න මූකුල-
ප්‍රසූතිශ්චූතානාං සඛි සිඛරිණීයං සුඛයති.

73

සාකූතස්මිතමාකුලාකුලගලද්ධම්මිල්ලමුල්ලාසිත-
භ්‍රෑවල්ලිකමලිකදර්ශිතභුජා[c]මූලොධර්ධස්තස්තනම්
ගොපීනාං නිභෘතං නිරීක්ෂ්‍ය [d]ගමිතාකාඞ්ක්ෂශ්චිරං චින්තය-
න්නන්තර්මුග්ධමනොහරං හරතු වඃ ක්ලෙශං නවඃ කෙශවඃ.

ද්විතීයඃ සර්ගඃ.

---

a 'දූරාලොකඃ ස්තොකස්තවක නවිකා' ඉති පාඨඃ.
b 'රණිතිරමණීයා' ඉති පාඨඃ. c 'මූලාර්ධදෘෂ්ට' ඉති පාඨඃ.
d 'දශිතාකාඞ්ක්ෂ' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

72

දු රි න් පෙනෙන මිණිමුතු වන ලිය සෝ කා
සරෙන් බමර බර අඹමල් සහ සා කා
ප ව න් හමන පිසගෙන වල් විල් තෝ කා
ද ව න් තෙය මගත සිත වැඩි කර සෝ කා

73

පෙණෙන පරිදි තන කැස පා නහන අත
ස ද න වරල මුදු මදහස පුබුදු වත
ල දු න ගොපළු වෙත යොදමින් වසන නෙත
න ස න ලැබේවා හරි ඔබ කෙලෙස් සිත

දෙ වන සග නිමි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

තෘතීයඃ සර්ගඃ

(3)

මුග්ධ මධු සූදනඃ

74

කසංරි'රපි සංසාරවාසනාබන්ධශෘඞ්ඛලාම්
රාධාමාධාය හෘදයෙ තත්‍යාජ ව්‍රජසුන්දරීඃ.

75

ඉතස්තතස්තාමනුසෘත්‍ය රාධිකාමනඞ්ගබාණව්‍රණඛින්නමානසඃ
කෘතානුතාපඃ ස කලින්දනන්දිනීතටාන්තකුඤ්ජෙ[a]විෂසාද
මාධවඃ

ගූර්ජරීරාග යතිතාලාභ්‍යාං ගීයතෙ.

76

මාමියං චලිතා විලොක්‍ය වෘතං වධූනිචයෙන
සාපරාධතයා මයා'පි න වාරිතාති භයෙන
හරිහරි හතාදරතයා ගතා සා කුපිතෙව – ධ්‍රුවම්.

77

කිං කරිෂ්‍යති කිං වදිෂ්‍යති සා චිරං විරහෙණ
කිං ධනෙන ජනෙන කිං [b] 'මම ජීවිතෙන ගෘහෙණ.
හරිහරි-

---

[a] 'නිෂසාද' ඉතිපාඨඃ.

[b] 'මමකිං ගෘහෙනමුඛෙන්' ඉතිපාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

තෙවන සඟ

74

යදමෙන් බැඳි සස ර
රාදූ සොඳුර සිහි කා ර
කංසා රිපු රූසි ර
ගොපලු ලඳ ළිය බැහැර කර හැ ර

75

කල - ක ම් ගැණි පසු තැවිලි වෙ ලි
මන - යොන් මල් සර වැද හද පැ ලි
සොය- මි න් හරි පෙම්බර සුකොම ලි
වනි - ග ං තෙර ළිය ගොමුවට කලි

76

රාගය - ගුර්ජරී තාලය - යති

මා ගමුන් මැද සිටිය මා දුසා ඈ ගියා විග සේම
සා පරාදවූ සිතඃනොවී දිරි තවත්වා ලන සේම
අහො අහෝ හැරාදර දයා ගියා ඈ සරො සේම

77

කුම් කරන්නිද කුම් කියන්නිද ඇවිසූ විර හේත
මිල මුදල් හෝ යෙහෙළියන් හෝ කිම් පලක් දිවි ශේත
අහො අහෝ හැරාදර දයා ගියා ඈ සරො සේම

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

78

චින්තයාමි තදානනං කුටිලභ්‍රූ කොපභරේණ
ශෝණපද්මමිවෝපරි භ්‍රමතාකුලං භ්‍රමරේණ.
හරිහරි —

79

තාමහං හෘදි සංගතාමනිශං භෘශං රමයාමි
කිං වනේ'නුසරාමි තාමිහ කිං වෘථා විලපාමි.
හරිහරි —

80

තන්වි ඛින්නමසූයයා හෘදයං තවාකලයාමි
තන්න වේද්මි කුතෝ ගතාසි නතේන තේනුනයාමි.
හරිහරි —

81

දෘශ්‍යසේ පුරතෝ ගතාගතමේව මේ විදධාසි
කිං පුරේව සසංභ්‍රමං පරිරම්භණං න දදාසි.
හරිහරි —

82

ක්ෂම්‍යතාමපරං කදාපි තවේදෘශං න කරෝමි
දේහි සුන්දරි දර්ශනං මම මන්මථේන දුනෝමි.
හරිහරි —

83

වර්ණිතං ජයදේවකේන හරේරිදං ප්‍රවණේන
[අ]කින්දුවිල්වසමුද්‍රසම්භවරෝහිණී රමණේන.
හරිහරි —

අ. 'තින්දුවිල්ව' ඉතිපාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

78

රෝද බැඳුන් බමරුන් වසා සිටිනා සුරත් සර සේම
ළෙව් මතක් සරෝසා සිහින් බැම බින්ද ඇය වත පේම
අහො අහෝ හැරුදර දයා ගියා ඈ සරෙ සේම

79

මා මෙනෝ තුළ පෙම් සමාගම සුන්දරී නොවි වාද
මේ වෙනෝ සොයනෝ අඩා වැළපී කුමක් සඳ හාද
අහො අහෝ හැරුදර දයා ගියා ඈ සරෙ සේම

80

තන්වි වෙන්වූ මෙමා හැරා රොසිනි කඩා ළබැ දීම
ගන්න පාද නමා සමා කොහි වේද නැහැ වැට හීම
අහො අහෝ හැරුදර දයා ගියා ඈ සරෙ සේම

81

පෙම්බරී ඔබ මේ මගේ ළඟ එනු යනු පෙනේ දූස
මෙන් කලින් කිම දූන් තුරුල් කර ඇයි නොදෙනු රස පාස
අහො අහෝ හැරුදර දයා ගියා ඈ සරෙ සේම

82

දෙන් අනේ මට දුන් සමාව මෙසේ යලිත් නොම වේය
මාගෙ පෙම් පිළිගන්න සුන්දරී රාතලින් ම දූ වේය
අහො අහෝ හැරුදර දයා ගියා ඈ සරෙ සේම

83

කින්දු බිල්වය සාගරෙන් නැගී පුන් තරින්දු සමාන
සින්දු ජයදෙව් ගී වැණුම් මේ වාසුදෙවිදු තුමාන
අහො අහෝ හැරුදර දයා ගියා ඈ සරෙ සේම

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

84

හෘදි විසලතාහාරො නායං භුජඞ්ගමනායකඃ
කුවලයදලශ්‍රෙණී කණ්ඨෙ න සා ගරලද්‍යුතිඃ
මලයජරජො නෙදං භස්ම ප්‍රියාරහිතෙ මයි
ප්‍රහර න හරභ්‍රාන්ත්‍යානඞ්ග ක්‍රුධා කිමු ධාවසි.

85

පාණෞ මා කුරු චූතසායකමමුං මා චාපමාරොපය
ක්‍රීඩානිර්ජිතවිශ්ව මූර්ඡිතජනාඝාතෙන කිං පෞරුෂම්
තස්‍යා එව මෘගීදෘශො මනසිජ ප්‍රෙඞ්ඛත්කටාක්‍ෂාශුග-
ශ්‍රෙණීජර්ජරිතං මනාගපි මනො නාද්‍යාපි සංධුක්‍ෂතෙ.

86

භ්‍රූපල්ලවං ධනුරපාඞ්ගතරඞ්ගිතානි
බාණා ගුණඃ ශ්‍රවණපාලිරිති ස්මරෙණ
තස්‍යාමනඞ්ගජයජඞ්ගමදෙවතායා
මස්ත්‍රාණි නිර්ජිතජගන්ති කිමර්පිතානි.

87

භ්‍රූචාපෙ නිහිතඃ කටාක්‍ෂවිශිඛො නිර්මාතු මර්මව්‍යථාං
ශ්‍යාමාත්මා කුටිලඃ කරොතු කබරීභාරොපි මාරොද්‍යමම්
මොහං තාවදයං ච තන්වි තනුතාං බිම්බාධරො රාගවාන්
සද්වෘත්තඃ ස්තනමණ්ඩලස්තව කථං ප්‍රාණෛර්මම ක්‍රීඩති.

88

තානි ස්පර්ශසුඛානි තෙ ච තරලාඃ ස්නිග්ධා දෘශොර්විභ්‍රමා-
ස්තද්වක්ත්‍රාම්බුජසෞරභං ස ච සුධාස්‍යන්දී ගිරාං වක්‍රිමා
සා බිම්බාධරමාධුරීති විෂයාසඞ්ගෙපි චෙන්මානසං
තස්‍යාං ලග්නසමාධි හන්ත විරහව්‍යාධිඃ කථං වර්ධතෙ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

84

ඔ ල් මාලාවෙක මාලය හෙල්මැලි තතතාරද නොමවේ
තිල් මහනෙල් දම මිස දිලිසෙන්නේ ගෙලවට විස නොමවේ
කල් කය හෙළ සඳුනේ සිහිලස ගත තැවරුව අළු නොමවේ
ම ල් සර රුවටී හිල් නොකරව හද මෙහෙසුරු මම නොමවේ

85

ඔ ක දි න් කෙළිදෙලෙ පිනවා මුළු ලොව සියවසගෙට්ගත්තා
දු බ ල න් මලවිය පෙළණු පිරිමිකම නොවෙ සත අනු දන්නා
සැරයෙන් මියුලැස දෑදුරුව ගිය හද තව පාරන මෙන්නා
නොසඳන් නොසඳන් අත ඇති අඹමල් හී සැර උගු දුන්නා

86

වසහෙහි මුළු ලොවම යෙ දී
මද ඇගෙ බැම දුන්න සැ දී
කන් වැල දුණු දියට බැ දී
සැලෙන බැලුම් හීය වි දී

87

බැම දුනු දියෙහි නෙත් සැර පීඩා දේවා
ර ම නිය වරලසින් මල්මද පිබී දේවා
සු ම දුර අදර බිඹු පල මෝහන වේවා
ලැම පින් පියයුරන් යලි කෙළි පැල ඕවා

88

ර ත් සර සදිසි වත සුමිහිරි සුවඳ පි රී
ග ත් පැහැ පැහැර බිඹුපල දෙඅදර අසි රී
නෙ ත් පෙම් දියෙන් දෙනයන රස බස් ඉති රී
අ ත් හැර නොයසි සිත ඉන් වියො ගිනි පැති රී

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

෬෯

තිර්යක්කණ්ඨවිලොලමෞලිතරලොත්තංසස්‍ය වංශොච්චර-
ධ ද්දීපතිස්ථානකෘතාවධානලලනාලක්ෂෛර්න සංලක්ෂිතාඃ
ස ත්වාං පශ්‍යති[c] වෙපතෙ පුලකයත්‍යානන්දති ස්විද්‍යති
ප්‍රත්‍යුද්ගච්ඡති මූර්ච්ඡති ස්ථිරතමඃපුඤ්ජෙ නිකුඤ්ජෙ ප්‍රියඃ.

235

අක්ෂ්ණොර්නික්ෂිපදඤ්ජනං ශ්‍රවණයොස්තාපිඤ්ඡගුච්ඡාවලිං
මූර්ධ්නි ශ්‍යාමසරොජදාම කුචයොඃ කස්තූරිකාපත්‍රකම්.
ධූර්තානාමභි[d]සාරසම්භ්‍රමජුෂාං විෂ්වඞ්නිකුඤ්ජෙ සඛි
ධ්වාන්තං නීලනිචොලචාරු සුදෘශාං ප්‍රත්‍යඞ්ගමාලිඞ්ගති.

---

a 'නිජගතිශීලම්' ඉති පා·ඨ.
b 'සිතරාමම්' ඉති පාඨඃ.
c 'කම්පතෙ' ඉති පාඨඃ.
d 'සාරසහසකෘතා' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

230

කම්පිත තංග තරංග තුලේ මත බන්දන පුන් කලසාවන්
තෙනෙත තෙතෙත අස මඟෙ බස ගැන සැක ඇතහොත
තොප මනසාවන්
යන්නේ මදු මතන ලබැඳි වෙත බොළඳ රාදි කේ

231

රණ කෙළියට පැමිණි තොප සුන්දර සැරසිලි දනී
යෙහෙලි තුම්
යව සෙර සුහුඹම සළඹ රසන් දම් කිංකිණිරණ බෙර දී ගුම්
යන්නේ මදු මතන ලබැඳි වෙත බොළඳ රාදි කේ

232

සකි අත වත්තම් පී යව රණ බෙර හඬදී වළලු ගැටී මෙන්
තිසුණු මනෝහර දිගු තිය තියතසි තිට සහවතු අවී වී මෙන්
යන්නේ මදු මතන ලබැඳි වෙත බොළඳ රාදි කේ

233

හරි සිරි වරුණය වැණුම තිසර හර සිරි ජයදේව උදරම්
සරසවමින් ගෙල පවතු සඳ කල බැති මතු සතත සඳරම්
යන්නේ මදු මතන ලබැඳි වෙත බොළඳ රාදි කේ

234

පෙ ම් දිය නෙත් නුවන් බැළුම් රස මැසිවිලි සවන් පුරා
ලොම් දූහැ ගන්වන වැළඳුම් දුන් දුන් ලැබෙතැයි ඉදුරා
ති ම් හිම් නැති තුටිනි විසුව ඔහු තී නැතියෙන් නුදුරා
ක ම් පා වෙයි-සිහි නැතිවෙයි-හඬයි-දෙඩයි දුකින් තුරා

235

බැ ළු ව මැනව පිය යෙහෙලිය කළු පලසක් වැනි ගනඳ ර
ක ළු අඳුනෙන් නුවන් සවන් කමල පතින් වරල් පත ර
ති ළු පුල් මල් දමින් ලැමැද මුව මදයෙන් සරා සොඳු ර
මූ ළු පෙදෙසම වසා සිටිසි සලෙල දනන් සිතු ඹද කා ර

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

236

කාශ්මීරගෞරවපුෂාමභිසාරිකාණා-
මාබද්ධරෙඛමභිතො රුචිමඤ්ජරීභිඃ
එතත්තමාලදලනීලතමං තමිස්‍රං
තත්ප්‍රෙමහෙමනිකෂොපලතාං තනොති.

237

හාරාවලීතරලකාඤ්චනකාඤ්චිදාම
කෙයූරකඞ්කණමණිද්‍යුතිදීපිතස්‍ය
ද්වාරෙ නිකුඤ්ජනිලයස්‍ය හරිං නිරීක්ෂ්‍ය
ව්‍රීඩාවතීමථ [1]සඛීමියමිත්‍යුවාච.

වරාඩිරාගරූපකතාලාභ්‍යාං ගීයතෙ (17)

238

මඤ්ජුතරකුඤ්ජතලකෙලිසදනෙ
විලස රතිරභසහසිතවදනෙ
ප්‍රවිශ රාධෙ මාධවසමීපමිහ – ධ්‍රුවම් –.

239

[2]නවභවදශොකදලශයනසාරෙ
විලස කුචකලශතරලහාරෙ – ප්‍රවිශ –.

240

කුසුමචයරචිතශුචිවාසගෙහෙ
විලස කුසුමසුකුමාරදෙහෙ—ප්‍රවිශ—

241

මෘදුචලමලයපවනසුරභිශීතෙ
විලස මදනශරනිකරභීතෙ—ප්‍රවිශ—.

---

[1] 'සඛීනිජගාදරාධාම්' ඉති පාඨඃ. [2] 'නවලසදශොක' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

236

රන් දම් රසන් මිණි කැළුමෙන් මත
වන්හෙම් කසා පැහැපියබඳ තත් රංගී
යන් තම් ගනඳෑරන් මිරිකි යනු වංගී
අන් දම් මවයි රන් හිර උරගල සැංගී
ලෑංගී

237

සළු ඹ මෙවුල වල මිණි රැස් වලලු
සුල ඹ ලදල ලිය මඹු දෙරටුවෙහි මැදේ
කල ඹ සදිසි හරි දෑක විලි සසල තදේ
පොළඹ වනසෙ ගෙහෙලිය පැවසු ලදේ
මෙලෙදේ

238

රාගය – වරාඩි

තාලය – රූපක

නන්දවන මණිඹපෙහි ලදල
ඔසද කෙළි සොළිඹු හසිත යනෝ
යනුව රාදේ මාදව සමීපයට වදනෝ

239

අතුල නව සෝක දල සයන සාරේ
පිනව තන සසල කුසුම හාරේ
යනුව රාදේ මාදව සමීපයට

240

කුසුම සම මෙතොප සුකුමාර දේ හේ
සතපවනු මිහිරි සුවඳ ගේ හේ
යනුව රාදේ මාදව සමීපයට

241

කුසුමවි සැරට හැකිළී සැළුන බීතේ
ඔකඳ වනු මලය පවන සීතේ
යනුව රාදේ මාදව සමීපයට

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

242

විතතබහුවල්ලිනවපල්ලවඝනෙ
විලස චිරමලසපීනජඝනෙ—ප්‍රවිශ—.

243

මධුමුදිතමධුපකුලකලිතරාවෙ
විලස[b] කුසුමශරසරසභාවෙ—ප්‍රවිශ.

244

මධුරතරපිකනිකරනිනදමුඛරෙ
විලස දශනරුචිරුචිරශිඛරෙ—ප්‍රවිශ.

245

විහිතපද්මාවතීසුඛසමාජෙ
කුරු මුරාරෙ මඞ්ගලශතානි
භණති ජයදෙවකවිරාජරාජෙ—ප්‍රවිශ

246

ත්වාං චිත්තෙන චිරං වහන්නයමති-ශ්‍රාන්තො භෘශං තාපිතඃ
කන්දර්පෙණ ච පාතුමිච්ඡති සුධාසංබාධබිම්බාධරම්.
අස්‍යාඞ්කං තදලංකුරු ක්ෂණමිහ භ්‍රූක්ෂෙපලක්ෂ්මීලව-
ක්‍රීතෙ දාස ඉවොපසෙවිතපදාම්භොජෙ කුතඃ සංභ්‍රමඃ.

247

සා සසාධ්වසසානන්දං ගොවින්දෙ ලොලලොචනා
සිඤ්ජානමඤ්ජුමඤ්ජීරං [c]ප්‍රවිවෙශ නිවෙශනම්.

---

a 'රතිවලිතලලිත ගීතෙ' ඉති පාඨඃ.

b 'මදනරසරභසභාවෙ' ඉති පාඨඃ.

c 'ප්‍රවිවෙශනිකෙතනම්' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

242

හැසුණු නව ලඳල ලියමඬු තුලේගී
පුළුළු කුලැතිය යෙදෙව කෙළි දෙලේගී
යනුව රාදේ මාදව සමීපයට

243

මදු මදින බිගු නගන කලහ රා වේ
සැප විඳිනු කැමති රසනු රා වේ
යනුව රාදේ මාදව සමීපයට

244

මදුර තර පික නිකර නිනද මිහි රේ
පිනව මුනු දිමුනු දසන රුසි රේ
යනුව රාදේ මාදව සමීපයට

245

පිහිට පද්මාවතී පතන තේ ජා
වැණු මුරාරේ නෙයිය ආයි දූ ජා
සඳනු ජයදේව කිවිරාජ රා ජා
යනුව රාදේ මාදව සමීපයට

246

ර ම නිය සිත දරා වෙහෙසී ගත තැවු ණු
අ ම බඳු තොල් උරා බීමෙහි ලොබ දිනු ණු
බැ ම බිඳි පමණ සැම මෙහෙයෙහිම තියැළු ණු
කි ම කියදසුට ඔබ පදසර වැඳ වැටු ණු

247

ඇණවුම ලෙස යෙහෙලිය ඇය මි හි රි
ලියගොමු වැඳ හඬවා පද ගි ගි රි
සැසලෙන හඳුනිව සතුටින් ඉ ති රි
හරිවත වෙත නෙතු කැළුමන් පැ ති රි

Dr. Urmila Sharma Collection, Varanasi

වරාඩිරාගයතිතාලාභ්‍යාං ගීයතෙ. (22)

248

රාධාවදනවිලොකනවිකසිතවිවිධවිකාරවිභඞ්ගම්
ජලනිධිමිව විධුමණ්ඩලදර්ශනතරලිතතුඞ්ගතරඞ්ගම්.
හරිමෙකරසං චිරමභිලෂිතවිලාසම්
සා දදර්ශ ගුරුහර්ෂවශංවදවදන[1]මනඞ්ගනිවාසම්—
ධ්‍රුවම්—

249

හාරමමලතරතාරමුරසි දධතං පරිරභ්‍ය විදූරම්
ස්ඵුටතරඵෙනකදම්බකරම්බිතමිව යමුනාජලපූරම්
හරි—

250

ශ්‍යාමලමෘදුලකලෙවරමණ්ඩලමධිගතගෞරදුකූලම්
නීලනලිනමිව පීතපරාගපටලභරවලයිතමූලම්—හරි—

251

තරලදෘගඤ්චලචලනමනොහරවදනජනිතරතිරාගම්
ස්ඵුටකමලොදරඛෙලිතඛඤ්ජනයුගමිව ශරදි තඩාගම්—හරි.—

252

වදනකමලපරිශීලනමිලිතමිහිරසමකුණ්ඩලශොභම්
ස්මිතරුචිරුචිරසමුල්ලසිතාධරපල්ලවකෘතරතිලොභම්—හරි—

253

ශශිකිරණච්ඡුරිතොදරජලධරසුන්දරසකුසුමකෙශම්
තිමිරොදිතවිධුමණ්ඩලනිර්මලමලයජතිලකනිවෙශම්
හරි—

1. 'භඞ්ගවිකාරම් – මනඞ්ගවිකාරම්' ඉති පාඨෙ.

CC0. In Public Domain, Digitizagtion by eGangotri
Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

248

රාධා වදන විලෝකන විකසිත සතත අනේක හැඟුම් මෙන්
සමුදුර සමවන පුන්සඳ හමුවණි කැලඹුන තුංග තරන් ගෙන්
සහවාස රිසින් විසු ඇය ගැණි ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹි සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

249

සාර තරලතර ආරන උරතල දූරු ලෙල හර මින හාරයි
රළ වැළ කැළුන උදම්වන සුන්දර නිල් යමුනා පෙණ පාරයි
සහවාස රිසින් විසු ඇය ගැණි ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹි සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

250

කෝමල සුනිල බඳේ රැඳි රන් පැහැ විහිදෙන සිනිඳු දුකූලයි
පීත පරාගය පටල ඇලි ගිය උපුල තටුව අනුකූලයි
සහවාස රිසින් විසු ඇය ගැණි ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹි සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

251

සැලෙන නෙතින් එන දසන මනෝහර වදන ජනිත රති රාගේ
තඹර පිප්ගිය කෙළි දෙල ලොල දද යුවලෙකා සරද තඹාගේ
සහවාස රිසින් විසු ඇය ගැණි ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹි සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

252

උවන කමල තල සෙලවෙන හැපි හැපි රිවි වැනි
කුණ්ඩල සෝබා
විසි කරවන මිත හස සැරයූ වත රතදර රස බොනු ලෝබා
සහවාස රිසින් විසු ඇය ගැන ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹි සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

253

රැඳි සඳකැන් දුල ගන කැළ පරයන මනහර කුසුමිත කේසයි
ගනදර දුර හළ පුන්සඳ චන්දන නළල තිලක පරකාසයි
සහවාස රිසින් විසු ඇය ගැන ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹි සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

254

විපුලපුලකභරදනතුරිතං රතිකෙලිකලාභිරධීරම්
මණිගණකිරණසමූහසමුජ්වලභූෂණසුභගශරීරම්
හරි—.

255

ශ්‍රීජයදෙවභණිතවිභවද්විගුණීකෘතභූෂණභාරම්
ප්‍රණමත හෘදි විනිධාය හරිං සුචිරං සුකෘතොදයසාරම්
හරි—

256

අතික්‍රම්‍යාපාඞ්ගං ශ්‍රවණපථපර්‍යන්තගමන-
ප්‍රයාසෙනෙවාක්ෂ්ණොස්තරලතරතාරං A ගමිතයොඃ
ඉදානීං රාධායාඃ ප්‍රියතම B සමායාතසමයෙ
පපාත ස්වෙදාම්බුප්‍රසර ඉව හර්ෂාශ්‍රුනිකරඃ.

257

භජන්ත්‍යාස්තල්පාන්තං කෘතකපටකණ්ඩූති C පිහිත-
ස්මිතං යාතෙ ගෙහාද්බහිරපිහිතාලීපරිජනෙ
ප්‍රියාස්‍යං පශ්‍යන්ත්‍යාඃ D ස්මරපරවශාකූතසුභගං
සලජ්ජා ලජ්ජාපි ව්‍යගමදිව දූරං මෘගදෘශඃ

258

සානන්දං නන්දසූනුර්දිශතු මිතපරං සංමදං මන්දමන්දං
රාධාමාධාය බාහ්වොර්විවරමනු දෘඪං පීඩයන්
ප්‍රීතියොගාත්
තුඞ්ගෞ තස්‍යා උරොජාවතනු E වරතනොර්
නිර්ගතෞ මා ස්ම භූතාං
පෘෂ්ඨං නිර්භිද්‍ය තස්මාද්බහිරිති වලිතග්‍රීවමාලොකයන්වඃ.

A 'හිතයොඃ' ඉති පාඨඃ. B 'විහිත' – ඉති පාඨඃ.
C 'මාලොකසමයෙ' – ඉති පාඨඃ D 'ස්මරසරසමාකූත' ඉති පාඨඃ. E 'තනුවලතනොඃ' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

254

සුරත කලා කෙළිලළ තෙරපත් ගත පෝපියත
සැලෙන පිනීමෙන්
පියකරු පුරු බැබලිණි මිණි අබරණ විකිරණ
කිරණ ගැනීමෙන්
සහවාස රිසින් විසූ ඇය ගැණ ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹී සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

255

සිරි ජයදේව පුදන අති සුන්දර කන්කළු ගී මිණි මාලෙන්
හද ගද කිළි හරි වැඩ හිඳුවා පුද දෙවී මිදෙනුව පව් ජාලෙන්
සහවාස රිසින් විසූ ඇය ගැණ ම වඩා පෙම්
ඈ නැරඹී පෙළැඹී සිරි හරිවත දිලිසෙන පිරි අනුරා ගෙන්

256

ම න හර සොඳුරු රුව් සිරිපති දකින තියා
සා න වෙත දිගු නුවන් යුග ඇඟග විහිදී ගියා
ප න වැනි සුපෙම්වත වෙත යත සිත තකියා
සෙන ගස උණු කඳුළු බිඳු වැටි වැටිවැ ගියා

257

ඇ සි පිය තොම හෙළා බලමින් හරි රුසිරි
ර සි වඩ වඩා යහනට ළං වෙත සොඳුරි
වි සි තුරු කෙළි සිනා පැතුරුණ මුවග පිරි
වැ සි කසමින් කොපුල් තල යෙහෙලිය ළඳුරි

258

මු දු මුදු ලෙසින් රාදු ලඳ වැළඳ තොබා
වි දු ලිය සිරින් ඇද බැඳ බද බඳෙහි ඔබා
සි දු රුව ලැම පිවින් නැගිදූසි දෙතන සුබා
යෙදු නෙත නාන්ද සුත කෙරෙවා සිරි සුලබා

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

259

ජයශ්‍රීවින්‍යස්තෛර්මහිත ඉව මන්දාරකුසුමෛඃ
ස්වයං සින්දූරෙණ ද්විපරණමුදා මුද්‍රිත ඉව
භුජාපීඩක්‍රීඩාහතකුවලයාපීඩකරිණඃ
ප්‍රකීර්ණාසෘග්බින්දුර්ජයති භුජදණ්ඩො මුරජිතඃ.

260

සෞන්දර්‍යෛකනිධෙරනඞ්ගලලනාලාවණ්‍යලීලාමුඛෙ
රාධායා හෘදි පල්ලවෙ මනසිජක්‍රීඩෛකරඞ්ගස්ථලෙ
රම්‍යොරොජසරොජ ඛෙලනරසිත් වාදාත්මනඃ ඛ්‍යාපය-
ධ්‍යාතුර්මානසරාජහංසනිභතාං දෙයාන්මුකුන්දො මුදම්.

ඉති ශ්‍රීගීතගොවින්දෙ රාධිකාමිලනෙ සානන්දදාමොදරො
නාමෛකාදශඃ සර්ගඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

259

සි ද කුවලයාපීඩ රුදු අසුර ගෙල
මි ද රා කුසුම් රොත්සුනු මෙන් වතල
ර ද ගිය සුරත් පැහැ මලහෙයෙන් වගුල
ස ද කල් දිනේ දිගු සවි බා යුවල

260

ර ත් සර කැකුළු සරි පින් පිය චූරන්ද
සි ත් ගත් රාදිසා ලැම විල සුතන්ද
නි ත් කෙළි දෙලෙහි ඇලි රදහස පබන්ද
සෙත් සිරි සියළු සලසාවා මූකුන්ද

එකොළොස්වන සග නිමි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ද්වාදශඃ සර්ගඃ (12)

සුප්‍රීතපීතාම්බරඃ

261

ගතවති සඛීවෘන්දෙමන්දත්‍රපාභරනිර්භර-
සමරපරවශාකූතස්ඵීතස්මිතස්නපිතාධරාම්.
සරසමනසං දෘෂ්ට්වා රාධං මුහුර්නවපල්ලව-
ප්‍රසවශයනෙ නික්ෂිප්තාක්ෂීමුවාච හරිඃ ප්‍රියාම්.

විභාසරාගෙණෛකතාලිතාලාභ්‍යාං ගීයතෙ (23)

262

කිසලශයනතලෙ කුරු කා.මිනි A චරණනලින-
විනිවෙශම්
තව පදපල්ලවවෛරිපරාභවමිදමනුභවතු සුවෙශම්.
ක්ෂණමධුනා නාරායණමනුගතමනුසර B මාං
රාධිකෙ. — ධ්‍රැවම් —

263

කරකමලෙන කරොමි චරණමහමාගමිතාසි විදූරම්
ක්ෂණමුපකුරු ශයනොපරි මාමිව නූපුරමනුගති සූරම්
ක්ෂණ —

264

වදනසුධානිධිගලිතමමෘතමිව රචය වචනමනුකූලම්
විරහමිවාපනයාමි පයොධරරොධකමුරසි දුකූලම්
ක්ෂණ —

265

ප්‍රියපරිරම්භනරභසවලිතමිව පුලකිතමතිදුරවාපම්
මදුරසි කුචකලශං විනිවෙශය ශොෂය මනසිජතාපම්
ක්ෂණ —

A 'චරණකමල' ඉති පාඨඃ. B 'භො.' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

දෙළොස්වන සග

රාගය - විරාස   තාලය - ඒකතාල

261

ඉ ව තට ගිය සඳ ලඳ ලිය යහළු
ඉ ව කර කර මල් යහනත ලකුළු
පු ව ල අවල රිසි මුවහස මුකුළු
ප ව සනු රාදා හට දද ගුරුළු

262

ලා දල සයන තලේ පිය කාමිනී සරණ තඹර මනහාරයි
තබනුව මල් දළු මුළු වැදෙනා ලෙස මද මුදු පහසිනි සාරයි
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

263

කර කමලේන මගේ පිරිමදිනෙමි ගෑ ලතු මා මෙම පාදේ
සැනපෙව මෙම යහනේ වැළඳ පා නූපුර මෙන් සිතු පැදේ
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

264

වදන සඳුගෙන ගලන අමාමෙන රස බස මුව උපලෙන්
මලසින මුදුලන පීන පයෝදර ඉඩදෙව ඇවුරුව දුලෙන්
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

265

පියබඳ වැළඳගැනීමට ලොබ බැඳි මනස මගේ දුව තාපෙන්
මුදනුව රන් කුඹුවන් පිරි පියයුරු ළමැද තබන් සුමනාපෙන්
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

266

අධරසුධාරසමුපනය භාමිනි ජීවය මෘතමිව දාසම්
ත්වයි විනිහිතමනසං විරහානලදග්ධවපුෂමවිලාසම්
ක්ෂණ —

267

ශශිමුඛි මුඛරය මණිරසනාගුණමනුගුණකණ්ඨනිනාදම්
ශ්‍රුතියුගලෙ පිකරුතවිකලෙ මම ශමය චිරාදවසාදම්
ක්ෂණ —

268

මාමතිවිඵලරුෂා විකලීකෘතමවලොකිතුමධුනෙ දම්
ලජ්ජිතමිව නයනං තව විරමති සෘජසි වෘථා රතිඛෙදම්
ක්ෂණ —

269

ශ්‍රීජයදෙවභණිතමිදමනුපදනිගදිතමධුරිපුමොද ම්
ජනයතු රසිකජනෙෂු මනොරමරතිරසභාවවිනොදම්
ක්ෂණ —

270

ප්‍රත්‍යූහඃ පුලකාඞ්කුරෙණ නිවිඩාශ්ලෙෂෙ නිමෙෂෙණ ච
ක්‍රීඩාකූතවිලොකිතෙධරසුධාපානෙ A කථාකෙලිභිඃ
ආනන්දාධිගමෙන මන්මථකලායුද්ධෙපි යස්මින්නභූ-
දුද්භූතඃ ස තයොර්බභූව සුරතාරම්භඃ ප්‍රියංභාවුකඃ.

271

දෝර්භ්‍යාං සංයමිතඃ පයොධරභරෙණාපීඩිතඃ පාණිජෛ-
රාවිද්ධො දශනෛඃ ක්ෂතාධරපුටඃ ශ්‍රොණීතටෙනාහතඃ
හස්තෙනානමිතඃ කචෙධරසුධාස්‍යන්දෙන සංමොහිතඃ
කාන්තඃ කාමපි තෘප්තිමාප තදහො කාමස්‍ය වාමා ගතිඃ.

A 'කථාකෙලිභිඃ' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

266

මරණෙහි දෙර ලඟ වෙසෙන විරහ ගිණි වැද හදවත දෙදරාලා
අදර අමාරස පොවමිනි කාමිනි සුවකල මැන මෙම වාලා
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

267

සිසිවත සොඳුරිය මිණි රසනා දම් සහ රස බස නින් නාදෙන්
සතපනු දෙසවන පිඩාවට පත් මත් කෝකිල ගී නාදෙන්
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

268

ඉම් කිම නයන වසාගෙන සාදරි ඇයි මා සහ මේ කෝපෙන්
විලිකිම මා දෙස යොමුකරනට ඇස වද දෙන්නෙද
තොමනාපෙන්
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

269

සිරිජය දේව කිවිඳු බඳ රස පද පිරි මදුරිපු රති ආසා
රසික දනා මනහර සිරිඟර රසයෙන් කෙරෙවා අති ලාසා
එව සැනිනා නාරායන වෙත තොප පණ වැනි මා රාදිකේ

270

තොසැලි වැළඳ සිටුමෙහි ලොමු දැහැ ගැන්ම
ඇසිපිය හෙළුම සිතු ලෙස රූ සිරි දැක්ම
සොඳුරන තෙපුල බිඹෙහි තොල් අම ඉස්ම
වැළඳී ඔවුන් සෙවු හැම රති රස යක්ම

271

බැ ඳ යුගතින් තලමින් පියයුරන් හපා
නි ය පහරින් සම බිඳ තොල දතින් සපා
ඇඳ කෙසඟින් ඇය දෙන වද නොයෙක උපා
හරි සතොසින් විදි විලසින් අමර සැපා

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

272

[B]මාරඞ්කෙ රති කෙලිසංකුලරණාරම්භෙ තයා සාහස–
ප්‍රායං කාන්තජයාය කිංචිදුපරි ප්‍රාරම්භි යත්සම්භ්‍රමාත්
නිෂ්පන්දා ජඝනස්ථලී ශිථිලිතා දෝර්වල්ලිරුත්කම්පිතං
වක්ෂෝ මීලිතමක්ෂි පෞරුෂරසඃ ස්ත්‍රීණාං කුතඃ සිධ්‍යති.

273

තස්‍යාඃ පාටලපාණිජාඞ්කිතමුරෝ නිද්‍රාකෂායෙ දෘශෞ
[C]නිර්ධෞතොදරශොණිමා විලුලිතාස්‍රස්තස්‍රජෝ මූර්ධජාඃ
කාඤ්චිදාම දරශ්ලථාඤ්චලමිති ප්‍රාතර්නිඛාතෛර්දෘශෝ–
රෙභිඃ කාමශරෛස්තදද්භුතමභූත්පත්‍යුර්මනඃ කීලිතම්.

274

ව්‍යාකෝශඃ කෙශපාශස්තරලිතමලකෛඃ
ස්වෙදමොක්ෂෞ කපොලෞ
ක්ලිෂ්ටා බිම්බාධරශ්‍රීඃ කුචකලශරුචා හාරිතා හාරයෂ්ටිඃ
කාඤ්චීකාඤ්චිද්ගතාශා ස්තනජඝනපදං පාණිනාච්ඡාද්‍ය සද්‍යඃ
පශ්‍යන්තී සත්‍රපා සා තදපි විලුලිතා මුග්ධකාන්තිර්ධිනොති.

275

ඊෂන්මීලිතදෘෂ්ටි මුග්ධවිලසත්සීත්කාරධාරාවශා–
දව්‍යක්තාකුලකෙලිකාකුවිකසද්දන්තාංශුධෞතාධරම්
ශ්‍රාන්තස්තබ්ධපයෝධරං භෘශපරිෂ්වඞ්ගාත්කුරඞ්ගීදෘශෝ
හර්ෂෝත්කර්ෂවිමුක්තනිඃසහතනෝර්ධන්‍යෝ ධයත්‍යානනම්

276

අථ සහසා සුප්‍රීතා සුරතාන්තෙ සා නිතාන්තඛින්නාඞ්ගී
රාධා ජගාද සාදරමිදමානන්දෙන ගෝවින්දම්

B 'මාරබ්ධෙ' ඉති පාඨඃ. C 'නිර්ධූතොධරඃ' ඉති පාඨඃ.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

272

දි න න ලෙසින හරි පැලඹුන ඇය සුරත
සැතින දුබල වීය පියකරු සුවල ගත
නා ය න පියවි හදවත තද සැලුම් පත
ම ද න කවර ලෙස මඩිනෙද කොමල කත

273

රතු නිදි වරු දෙනයන මිරිකුන දෙතොල
බිඳි පිය යුරු නිය පහරින් මිදි වරල
ලිහිලව ඉරු ගිය සළු අලුයම කොමල
දැක පස සරු සර ඔහු හද කලෙ විකල

274

න ල ල වතල කෙහෙරැලි ඔහ තැගි කොපු ලි
ද ව ල හර පැරගු පින් පියොයුරු ලක ලි
උ කු ල මෙවුල දිණු ලඳ ලැම නිතඹ බ ලි
කොමල අතින් අවුරා ලිය සිතිනි වි ලි

275

මි යු ලැස පියැවි ගිය දසනග කැලුම් වැ දී
දි යු ණුවු ලවන් පැහැ ලැම නිසසලව නි දී
නි යු ණු පෙම් යුදෙන් පසු ගත විසුම් යෙ දී
සි යු මැලි සොඳුර මූව අම ඔහු උරන ල දී

276

අවල කෙළි වෙහෙ සී
තුටු රාදිකා දිගැ සී
අවනත වී ති සී
ගොවිඳු හට මේ ලෙසින් පැව සී

———

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

රාමකරීරාගයතිතාලාභ්‍යාං ගීයතෙ (24)

277

කුරු යදුනන්දන චන්දනශිශිරතරෙන කරෙණ පයොධරෙ
මෘගමදපත්‍රකමත්‍ර මනොභවමඞ්ගලකලශසහොදරෙ
නිජගාද සා යදුනන්දනෙ ක්‍රීඩති හෘදයානන්දනෙ–ධ්‍රැවම් —

278

අලිකුලගඤ්ජනමඤ්ජනකං රතිනායකසායකමොචනෙ
ත්වදධරචුම්බනලම්බිතකජ්ජල උජ්ජවලය ප්‍රිය ලොචනෙ
නිජ —

279

නයනකුරඞ්ගතරඞ්ගවිකාශනිරාසකරෙ ශ්‍රැතිමණ්ඩලෙ
මනසිජපාශවිලාසධරෙ ශුභවෙශ නිවෙශය කුණ්ඩලෙ
නිජ —

280

භ්‍රමරචයං රචයන්තමුපරි රුචිරං සුචිරං මම සංමුඛෙ
ජිතකමලෙ විමලෙ පරිකර්මය නර්මජනකමලකං මුඛෙ
නිජ —

281

මෘගමදරසවලිතං ලලිතං කුරු තිලකමලිකරජනීකරෙ
විහිතකලඞ්කකලං කමලානන විශ්‍රමිතශ්‍රමශීකරෙ.
නිජ —

282

මම රුචිරෙ චිකුරෙ කුරු මානද මනසිජධ්වජචාමරෙ
රතිගලිතෙ ලලිතෙ කුසුමානි ශිඛණ්ඩිශිඛණ්ඩකඩාමරෙ
— නිජ —

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

රාගය – රාමකරි   තාලය – යති

277

මන යොන මංගල පුන් කල සුවිල සමාන සුපීන පයෝද රේ
කස්තුරි සටහන් දෙව යදු නන්දන සඳ දිණුඅතිනී මනෝහ රේ
ඇය මේ ලෙසා යදු නන්දනෝ කෙළි යෙදී   ආනන්දනෝ

278

මදරද දුනුදිය බැම රසදුන් පිස හැර නොප මුදු අදරා   වැදී
සඳ නුව යළි අදුනෙන පරදලන විලසින බැඳි බමරා පොදී
ඇය මේ ලෙසා යදු නන්දනෝ කෙළි යෙදී   ආනන්දනෝ

279

නයන කොනින් එන සුන්දර පැය සරලන සෝබන මන් බැදේ
මනයොන පාස විලාස කනේ මිණි කුණ්ඩලදලනු පෙම් ක දේ
ඇය මේ ලෙසා යදු නන්දනෝ කෙළි යෙදී   ආනන්දනෝ

280

සුපිපි පියුම් පිය ගන්ද පියංකර වන් බිගුවන් රොද බන්ද ලා
වන කම්ලේ නළලේ රැළි ගැස්සෙන අස් කළ මැන කෙස
කුණ්ඩ ලා
ඇය මේ ලෙසා යදු නන්දනෝ කෙළි යෙදී   ආනන්දනෝ

281

සියපත වන් සිරිමත් වත යුත් පියෙ ඕහ බිඳු නලලත සාදරේ
කස්තුර් තිලකය දෙව මනරම් ලප දිළිසෙන පින් පිනිපා
යු රේ
ඇය මේ ලෙසා යදු නන්දනෝ කෙළි යෙදී   ආනන්දනෝ

282

දිණු රුසිරේ මියුරේ පිල සෝබන මඳ රද බඳ දද   වාම රේ
රති සුදෙහී ගිලිහී ගිය මල්පෙති හවසව වරලස   පාද රේ
ඇය මේ ලෙසා යදු නන්දනෝ කෙළි යෙදී   ආනන්දනෝ

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

283

සරසඝනෙ ජඝනෙ මම ශම්බරදූරණවාරණකන්දරෙ
මණිරශනාවසනාභරණානි ශුභාශය වාසය සුන්දරෙ
නිජ—

284

ශ්‍රීජයදෙවවචසි රුචිරෙ හෘදයං සදයං කුරු මණ්ඩිතෙ
හරිචරණසමරණාමෘතනිර්මිතකලිකලුෂජ්වර ඛණ්ඩිතෙ
නිජ—

285

රචය කුචයොඃ පත්‍රං චිත්‍රං කුරුෂ්ව කපොලයො -
ඝටය ජඝනෙ කාඤ්චිං මුග්ධස්‍රජා කබරීභරම්
කලය වලයශ්‍රෙණීං පාණෞ පදෙ මණිනූපුරා-
විති නිගදිතඃ ප්‍රීතඃ පීතාම්බරොපි තථාකරොත්.

286

යද්ගාන්ධර්වකලාසු කෞශලමනුධ්‍යානං ච යද්වෛෂ්ණවං
යච්ඡෘඞ්ගාරවිවෙකතත්ත්වරචනාකාව්‍යෙෂු ලීලායිතම්
තත්සර්වං ජයදෙවපණ්ඩිතකවෙඃ කෘෂ්ණෛකතානාත්මනඃ
සානන්දාඃ පරිශොධයන්තු සුධියඃ ශ්‍රීගීතගොවින්දතඃ

287

ශ්‍රීභොජදෙවප්‍රභවස්‍ය රාමාදෙවීසුතශ්‍රීජයදෙවකස්‍ය
පරාශරාදිප්‍රියවර්ගකණ්ඨෙ ශ්‍රීගීතගොවින්දකවිත්වමස්තු

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

283

සිරි පුලඹෙඹි නිතඹෙඹි මනයොන ලෙන ආරත මෝරත
පෙම් ර සේ
මිණි රසනා වසනා සරනා සරභාලව මාදව මන් ලෙ සේ
ඇය මේ ලෙසා යදු නන්දනේ කෙළි යෙදී ආනන්දනේ

284

සිරි ජයදේව බැතිනි ඉතිරී හද පිරි හරි සිරිපද වන්දනේ
සුමිහිරි ගීත අමාරස තිසැකිනි කලියුග පව් උන සින්දනේ
ඇය මේ ලෙසා යදු නන්දනේ කෙළි යෙදී ආනන්දනේ

285

කස් තුරි රචා තන සරසව රසන්ද ම
උස් කර බඳු නිතඹ ගවසව කෙස කුසු ම
අස් වන හඩ සලඹ පය ලව මෙ ඇ හැ ම්
ලස් තොව කළා හරි ඇය ඇණවුම් ලෙස ම

286

රි සි සිරිඹර රසෙහි මැණු තෙක් ගතෝයා
වි සි වන ගදඹ වන වෙණු බැති සිතෝයා
නි සි ජයදෙව් කිවිදු කව් නළු වතෝයා
චි සි තුරු ගොවිඳු ගී බල අම යුතෝයා

287 (i)

බෝජ දෙව් පිතා
රාමා දේවි මාතා
සුතන සුවි නිතා
කිවිඳු ජයදෙව් ගොවිඳු ගීතා

287 (ii)

පරාසර පව රා
වැනි හිතවතුන් ඇසු රා
මිහිර රස පතු රා
දිනේ රසවතු සතත සපු රා

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

288

සාධ්වී මාධ්වීක චින්තා න භවති භවතඃ ශර්කරෙ කර්කශාසි
ද්‍රාක්ෂෙ ද්‍රක්ෂ්‍යන්ති කො ත්වාමමෘත මෘතමසි
ක්ෂීර නීරං රසස්තෙ
මාකන්ද ක්‍රන්ද කාන්තාධර ධර න තුලාං ගච්ඡ යච්ඡන්ති භාවං
යාවච්ඡෘඞ්ගාරසාරං ශුභමිව ජයදෙවස්‍ය වෛදග්ධ්‍යවාචඃ.

289

ඉත්ථං කෙලිතතීර්විහෘත්‍ය යමුනාකූලෙ සමං රාධයා
තද්‍රෝමාවලි මෞක්තිකාවලියුගෙ වෙණීභ්‍රමං බිභ්‍රති
තත්‍රාහ්ලාදකුචප්‍රයාගඵලයොර් ලිප්සාවතොර් හස්තයො-
ර්ව්‍යාපාරඃ පුරුෂොත්තමස්‍ය දදතු ස්ඵීතාං මුදං සම්පදම්.

ඉති ශ්‍රීජයදෙවකෘතෞ ගීතගොවින්දෙ

සුප්‍රීතපීතාම්බරො නාම

ද්වාදශඃ සර්ගඃ.

සමාප්තං චෙදං කාව්‍යම්.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

288

මදු ර මදිරු නොසිත රසයයි සකුරු තෙපි රළු අම්බි රී
කවර නම් අඟ පිය කෙරෙති මිදි අමා තෙපි දුන් කල් මැ රී
අ ද ර ලඳ රස පිරිහි කිර නීරසය අඹ තොප රස වැ රී
මිහි ර නම් ජයදේව ගීමය සොඳුරු සුලලිත පද පි රී

289

කළිඳු සිරිති නැගි ලොම් වැල ගර ගංගා
වැලඳි පයාගයෙ රුඳ පල තුංගා
යුගත අසිරි සිරිපති පෙම් වන රංගා
කැමැති සැපත සත වෙත කෙරෙවා ලංගා

දොළොස් වැනි සග නිමි.

ගීතගොවින්ද කාව්‍යය නිමියේයි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

පළමුවන සග.

1

අහස වලාවෙන් වැසී ගොස් ය. වන පෙදෙස තමලු ගස්වලින් වැසී ගොස් ය. තොප සේම වූ භයංකාර අන්ධකාර රාත්‍රි කාලය පැමිණියේ ය.

2

රාධාව ගෙට යා යි නන්ද විසින් දන්වන ලදුව කලිඳු ගංතෙර නිහඬ රුක් ගොමු වදලයන්හී

3

සැහවි සැගවි කෙළි දෙපලන් පසුවන රාදමාදව – දෙදෙනාගේ සුරත ක්‍රීඩාවන් සියලු ලෙසින් සඵල වේවා.

මාදව හෙවත් කෘෂ්ණ, රාධාව ගේ සමාගමය ප්‍රිය කරයි. රාධාව ගේ ආරක්ෂකයා වූ නන්ද තෙමේ දෙශ කාල වස්තු ලක්ෂණාදී සියල්ලෙහි ම බිය එලවන සුළුබව, අන්ධකාර බව දක්වා රාධා ගෙට යා යි කීහ. අහස වැසි අඳුරෙන් කලු විය. ඝන නිල් පත්‍රයෙන් සැදි තමලු තුරින් කැලෑ රොද කළු විය. රාත්‍රි කාලය පැමිණීමෙන් අන්ධකාරයෙන් කළු විය. මේ සියල්ලම කළු පැහැ දිය ගැන ප්‍රසිද්ධ යමුනා තීරයෙහි වීමෙන් එහි සර්වාංග සම්පූර්ණ අන්ධකාරය ඇති බව දක්වෙයි. කෘෂ්ණ තද කළු පැහැයෙන් යුක්ත ය. එහෙයින් සියලු අංගොපාංගයෙන් සැදි මේ කෘෂ්ණත්වය කෘෂ්ණට සම ය.

4

පියකරු සරසවි චරිතය සිතුවම් කල සිත් මැදුරු ඇති ශ්‍රියාකාන්තාව (පද්මාවතී) ගෙ පාද පද්මයන් සේවනය කරන සියල්ලන් ගේ ම සක්විති වූ –

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

5

භක්තිමත් ජයදේව කිවිඳුන් විසින් ශ්‍රී වාසු දේවයන් ගේ සුරත ක්‍රීඩා කථාවන් ගෙන් රසවත් වූ චරිතය පිළිබඳ මේ ප්‍රබන්ධය කෙරේ.

සරසවි සිරිතිඟ් සිතුවම් කරන ලද සිත් නැමැති මන්දිර ඇතැයි යන්නෙන් ශ්‍රී ජයදේවයෝ නානා වර්ණ ප්‍රසාද මාධුර්‍යාදී ගුණ සම්පන්න ලෝකෝත්තර කාව්‍ය රචනයෙහි දක්‍ෂභාවය ද, පද්මාවතිය ගේ සරණ හැසුරෙහි හැසිරෙන්න වුන් ගේ සක්විතියැයි කීමෙන් ජගදානන්ද ගෝවින්ද භක්ති ප්‍රේමය ද, නාට්‍ය ප්‍රවීණත්වය ද, ප්‍රකට කළෝ. ශ්‍රී ජයදේව පත්නිය ගේ නාමය ද පද්මාවතියයි. කවියා ස්ව ප්‍රියාව කෙරෙහි ඇති ප්‍රේමාවනත භාවය ද මෙයින් ම හඟවන ලදී.

6

ඉදින් හරිහු සිහි කිරීමෙහි දී සිත ශාන්තව යේ ද එසේ ම ඉදින් විලාස කලාවන් දැක්වීමෙහිදී කුතුහල භාවය ඇති වේ ද, එසල්හි සුමිහිරි කෝමල අර්ථාන්විත ජයදේව බසට සන්දෙව.

7

උමාපතිධර, වචනය ලියලවයි. ශරන දුෂ්කර ශබ්ද ප්‍රයෝගයන්හි දක්‍ෂ වෙයි. ගොවර්ධන ශෘංගාරාත්මක වර්ණනා වන්හි ශ්‍රෙෂ්ඨ වෙයි. ශ්‍රැතිධරද ගෝවර්ධනයන් ගේ සමත්කම් ම ඇත්තේ ය.

ධෝයී නම් කවි තෙමේ අසන්නන් පිනවීමෙහි කවිරාජ භාවය උසුලයි. එහෙත් ශබ්ද රසයෙන් මෙන් ම අර්ථ රස යෙන් ද පිරිපුන් කාව්‍ය කරණයෙහි සමත් වනුයේ ජයදේවයෝ ම ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

සමකාලීන මහා කවීන් දක්වා ඔවුනතුරෙන් ජය-
දේවයෝ ම ශ්‍රේෂ්ඨතම බව මේ කී සේ ය. උමාපතිධර
වචනය ලියලවතුදු එහි ශබ්දාර්ථ ගුණ ශූන්‍ය හෙයින් ආහ්ලාද
ජනක නොවේ. ගූඪාර්ථ හෙයින් ශරන ගේ කාව්‍යයෝ
ප්‍රසාදාදී ගුණ රහිත ය. ගොවර්ධන ශ්‍රැතිධර දෙදෙන සමත්
වනුයේ ශෘංගාර රස ප්‍රධාන කාව්‍ය කරණයෙහි පමණ ය.
අලංකාර කථනයන් නිසා කවිරාජත්වයෙන් හඳුන්වනු
ලැබූවහු ද ධෝයි තෙමේ සත්කවි භාවයට නොගැනෙයි.
සන්දර්භශුද්ධි ගුණාලංකාර සම්පන්න කාව්‍ය රචනයෙහි සමත්
වූවෝ ජයදේවයෝ ම ය. අන්‍යයෝ නොවෙති.

මෙසේ ගීත ගොවින්ද කාව්‍යය යෙහි ආරම්භයෙහි "රාධ-
මාධව දෙදෙනා ගේ සුරත ක්‍රීඩාවන් සියලු ලෙසින් සඵල
වේවා" යනුවෙන් ආශිර්වාදයද, "සරසවි සිරිත රුතී"
ආදියෙන් කාව්‍ය ප්‍රවීණත්වය සහ ගොවින්ද භක්තියද "යිත
සිහිකරන හරි" ආදියෙන් කාව්‍ය ප්‍රයෝජනය ද, "වදන්දළ
උමාපතිදර" යන්නෙන් සමකාලීන කවීන් ගැනද, දක්වන
ජය දේවයෝ ගොවින්ද චරිත වර්ණනයට පෙරාතුව ගොවින්ද
ප්‍රශස්ති සඳහා දශාවතාර සිද්ධීන් සිහිපත් කරන්නේ ය.

8

කල්පාන්ත සාගරයෙහි කිඳීගිය වේදය මතුකර රැකදීම
සඳහා මත්ස්‍යාවතාර ගත් ලෝකාධිපති හරි නම් කෙශවයාට
ජය වේවා .

9

මහත්වූ පෘථුවි තලය දරීමෙන් පිටෙහි ලපයක් ඇතිවූ
ඉදිබු අවතාරයක් ගත් ලෝකාධිපති හරි නම් කෙශවයාට
ජය වේවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

10

දළයෙහි ඇමිණී ගිය පෘථුවිය නවසඳ ලපය මෙන් දිලිසුනාවූ වරාහ අවතාරගත් ලෝකාධිපති හරි නම් කේශවයාට ජය වේවා.

11

අත් තඹරෙහි පෙති වැනි උල්වූ නියෙන් කළු බඹරු වැනි හිරණ්‍ය කසිපුගේ ගත පැළුවාවූ නරසිංහ අවතාර ගත් ලෝකාධිපති හරි නම් කේශවයාට ජයවේවා (සාමාන්‍ය පිරිත නම් කළු බමරුන් විසින් නෙළුම්පත් ඉරීම ය. නෙළුම් පත් විසින් බම්රා ඉරාදැමීම අ.ශ්‍රව්‍යයි ම ය)

12

වික්‍රමයෙන් බලි අසුරා රවටා පදනිය දහරෙන් දනන් සේදූ වාමන අවතාර ගත් ලෝකාධිපති හරි නම් කේසවයාට ජයවේවා.

13

නසන ලද ක්‍ෂත්‍රියයන් ගේ ලෙහෙ ජලයෙන් භව ග්‍රීෂම යෙන් තැවුනාවූ භූමිය සෝද පාපයන් දුරුකළ භෘගුපති (පරසුරාම) අවතාර ගත් ලෝකාධිපති හරි නම් කේසවයාට ජය වේවා.

14

යුද්ධයෙහි දසහිස් රාවණ වනසා බිලිපුද දීමෙන්, දික්පති දෙවිවරුන් සතුටුකල රාමාවතාර ගත් ලෝකාධිපති හරි නම් කේසවයාට ජය වේවා. (රාවණයා දසහිස් නමින් හැඳින්වෙයි. ඔහුට හිස් දසයක් වූ බැවිනි.)

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

15

නගුලිසෙන් පෙළතැයි බියපත්ව පසුගමන් ගත් යමුනා නදියේ දිය මෙන් නිල්සළු පැළඳි බලරාම අවතාර ගත් ලෝකාධිපති හරි නම් කේසවයාට ජය වේවා. (විෂ්ණු බලරාම අවතාරයෙන් පෙනී සිටි සමයෙහි තමා ගේ ස්නානාදී ප්‍රයොජනය සඳහා යමුනා නදිය ස්වකීය නිවාසය කරා නගුලිසෙන් ඇදගෙන ආවේ ල.)

16

සත්වයන් වෙත්හි සිත්හිවූ මහ කාරුණාවෙන් වේදයාග යන්හි එන බිලි පූද පැවැත්වීම හෙලාදුක ඉවත් කළ බුද්ධාවතාර ගත් ලෝකාධිපති හරි නම් කෙසවයාට ජය වේවා.

17

සත් පුරුෂයන් වෙත දයාවෙන් අත් හී දූරූ ධූමකේතු වක් සරි කඩුපතින් මෙලච්ඡ ජනයා වැනැසූ කල්කී අවතාර ගත් හරි නම් කේසවයාට ජය වේවා.

18

බවයෙන් ගොඩවීම සඳහා භක්ති ප්‍රෙමයෙන් යුක්තව ශ්‍රී ජයදේව කවීහු ගේ උදූර පිවිතුරු කාව්‍යයෙන් දක්වෙන පරිදි දස අවතාරයකින් ලෝ පහළවූ ලොකාධිපති හරි නම් කේසවයාට ජය වේවා.

19

වේදය දරන ලද, (මත්ස්‍ය) ලොකය උසුලන ලද, (කූර්ම) පෘථුවිය සනසන ලද, (වරාහ) දානවයා මරන ලද, (නරසිංහ) බලියා රවටන ලද, (වාමන) ක්ෂත්‍රියයන් සනසන ලද, (භාගු පති) රාවණයා ජයගත්, (රාම) නගුල විහිදුවන ලද, (බල රාම) දයාව දෙශනාකළ, (බුඩ) මෙලච්ඡයන් වැනසූ, (කල්කි) යන දශ අවතාර දූරූ ඔබ වහන්සේ නමස්කාර කරමි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

මෙසේ ගෝවින්දයන් ගේ පූජි චරිතාපදානයන් දක්වූ ශ්‍රී ජය දේවයෝ ස්වකීය කාව්‍යයට වස්තු කොට ගත් චරිත සිද්ධීන් දක්වා යළිත් මෙසේ ප්‍රශස්ති පවත්වති.

20

කමලාව ගේ පියයුරන් ආලිංගනයෙහි යෙදුනාවූ, සවන් කුණ්ඩලාභරනයෙන්ද, ගෙල වනමල් මාලායෙන්ද දිළිසෙන් නාවූ හරි තෙමේ ජයෙන් ජයට පත් වේවා.

21

සූර්‍ය්‍ය මණ්ඩලය වැනි ප්‍රභාමත්වූ, සංසාර භයහරින්නාවූ, තාපස ජනයන් ගේ හද විලෙහි රාජහංසායමානවූ හරි තෙමේ ජයෙන් ජයට පත් වේවා.

22

කාලිය නම් විසකුරු සපියා විනාශ කොට ජනයන් සතුටු කළ යදුවංස පියුමට සූර්‍ය්‍යා වැනි හරි තෙමේ ජයෙන් ජයට පත් වේවා.

23

මදුය – මුරය – නරකය යන්නන් විනාශ කළාවූ, ගරුඩාසනයෙහි වෙසෙන, දිව්‍ය ගණයාගේ ප්‍රීති ප්‍රමොදයන් වඩන, හරි තෙමේ ජයෙන් ජයට පත් වේවා.

24

පවිත්‍රවූ කමලපතක් හා සමාන නෙත් ඇත්තාවූ තුන් ලෙව්හි සියල්ල සාද දෙන්නාවූ හරි තෙමේ ජයෙන් ජයට පත් වේවා.

25

ජනක දියණිය (සීතා) ශෝභන කළාවූ, දූෂනයන් ජය ගත්, යුද වැදී රාවණයන් වැනසවූ හරි තෙමේ ජයෙන් ජයට පත් වෙවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

26

අළුත් වැහි වලාකුලක් මෙන් සුන්දරවූ, මන්දර පර්වතය උසුලන ලද, ධවල චන්ද්‍ර බිම්බායමාන ශෝභා සම්පන්න මූව මඩල චකෝර පක්ෂි සිරිගත්, නැතහොත් පුන් සඳරැස් බොන ඇටිකුකුලන් මෙන් ලක්ෂ්මිය ගේ රූ සිරිය දෙනෙතින් බොනු ලබන්නාවූ හරි තෙමේ ජයෙන් ජයට පත් වේවා.

27

ඔබගේ පාද හිසින් දරමින් නමස්කාර කරන්නාවූ අපට සියලු සම්පත් දෙනු මැනව. හරි නමැති ඔබ වහන්සේ ජයෙන් ජයට පත් වේවා.

28

අ සිරි මංගල දයි මේ මනරම් ගීතයන් ශ්‍රී ජයදේව කිවිදු විසින් කරන ලද්දේ ය. හරීන් වහන්සේ ජයෙන් ජයට පත් වේවා.

29

පද්මාවතිය ගේ (සිරිකතගේ) පයෝධරයන් ආලිංගනය කිරීමෙන් තැවරීගිය සිරියල් රොන් සුණු ආදියෙන් දිළිසෙන, සුවඳවත් ඩහබිඳු වහනය වන, ආශ්චර්යමත් වාසුදේවයෝ සතොසින් වැජඹෙත්වා.

මෙසේ ද ගොවිඳුන් හට ප්‍රශස්ති පැවැත්වූ ජය දේවයෝ වසන්තකාලාරම්භයෙහි එක් දිනෙක රාධාවට යෙහෙළියන් පැවසූ තෙපලෙන් ස්වකීය ගීත ගොවිඳයෙහි කථා වස්තුව ආරම්භ කරන්නේ ය.

සෘතුන් අතුරෙන් වසන්තයම ප්‍රිය මනාප වෙයි. ගස් වැල් මලින් බරවී, පොළොව නිල් තණින් හෙබී, සුවඳ සුළඟින් ලොව සිහිල් වන වසත් සමය සුව ජනකය. හැඟීම් දනවන සුළු ය. විශේෂයෙන් ම යොවුනන්ගේ සිත්

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

අලවන්නේ ය. නව යොවුන් රාධ – මාධව යුවල ගේ ප්‍රේම හැඟීම් උත්කර්ෂයෙන් ම වර්ණනා කිරීමට ඉතාමත් යෝග්‍ය වන්නේ වසත් කාලය ම ය.

30

එය වසන්ත කාලය ය. වසන්තයෙහි කුසුම් සහි සුකුමාල ගතැති සුරතාසක්තව ගොවිඳුන් සිහිකරමින් වසන්ත වනයෙහි වෙසෙන රාදුවට යෙහෙළියක් මෙසේ කී.

31

මලය ගිරෙන් එන්නාවූ මුදු සීතල සුළඟ ලවංග ලතා සසලවමින් හමා යයි. ලතා මණ්ඩප බමර හඬින්, කෝකිල නදින්, රාව ප්‍රතිරාව වෙයි. විරහිනීන් වෙහෙසවන මේ වසන්ත කාලයෙහි කෝමල කාන්තාවන් හා සමග කෙළි දෙළෙහි යෙදෙමින් තිලඟ (මාධව) පසුවන්නේ ය. මිතුරිය හෘදය වියොගින්නෙන් දැවෙන්නේ ය.

32

වියෝවූ කාන්තාවෝ අනඟ සැර වැදී උමතුව විලාප නගත්. සුපිපි වකුල තුරු වසා බමරු රොද බැඳ සිටි.

33

මාලති ලා දළුවලින් කස්තුරි සුවඳ වහනය වෙයි. අනංග නිය වැනි එරමුදු මල් කෝමලාවන්ගේ හදවත් පාරයි.

34

පිපීගිය කේසර කුසුම අනංග රජයාගේ රුවන් ජය කොන්තය වැන්න. බඹරුන් ගෙන් වැසීගිය පලොල මල් පොකුරු අනංගයා ගේ හියොවුරු වැන්න.

35

මලින් ගැවසීගත් ලපටි කරුණ ගස් සමූහය වසත් සිරියෙන් මත් වී ලජ්ජා ශීලය දුරුකළ ලෝකයට සිනා–සෙන්නාක් වැන්න. කේතකී කුසුම් පෙති විරහිනීන් ගේ හදවත් දැදුරු කරන කුන්තායුධ වැන්න.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

36

අළුතින් පිපීගිය මාලතී මාදවී කුසුම් නිසා සුවඳවත් වූ සුළඟ, තවසුන් ගේ සිත්වුවද නව යොවුනන් ගේ සිත් මෙන් මෝහනය කරවන්නේ ය.

37

වැල් එතීගිය අඹතුරු සතුටින් ඉපිලීගිය කලෙක මෙන් මලින් බරවීය. වෘන්දා වන ප්‍රදෙශය පිරිසුදු කරමින් යමුනා නදිය වක්වෙවී ගලා බසින්නීය.

38

කාම දේවයා රජයන, අනුරා රස උතුරා යන, වසන්ත ඍතුවර්ණනය, සිවුබා (ගොවිඳුගේ) පාදයන් අනන්ත භක්ති ප්‍රේමයෙන් සිහිකරන්නාවූ ජයදේවයන් විසින් මෙසේ පබැඳින.

39

පෙනි දිගහැර හැර ප්‍රබොධ වන්නාවූ කේතකී කුසුමයන් මුළු ප්‍රදෙශයම සුවඳවත් කරන්නේ ය. ලවග කුසුම් රොන් පට සේලයන් මෙන් පැතිරෙන්නේ ය. අනංගයා ගේ ඇතුරා යන ජීවය මෙන්, සුළඟ හමන්නේ ය. මෙබඳු වසන්ත කාලය විරහින් ගේ සිත් තවාලන්නේ ය.

40

මී සුවඳ වහනය වන, බිගු රොද බැඳි අඹදළු කෝකිලයෝ ගී ගයමින් කඩාලති. ප්‍රාණ සම ප්‍රියාවන් සමග බෙනෙන ලද රස තෙපුල්, කරන ලද ක්‍රීඩාවන්, භාවනාවක් මෙන් නැවත නැවතත් සිහිපත් කරමින් මගීජනයා තැවෙන්නේ ය

රැකිරක්ෂාදී යම් යම් කරුණු සඳහා ගෙවලින් බැහැර වී සිටින පුරුෂයන්ට වසන්ත කාලයෙහි ලකුණු දසතින් පෙණෙන ඇසෙන විට ප්‍රියාවන් සිහිපත් වන්නේ ය. සිහි-

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

පත්වී ඔවුන් පිළිබඳව ම සිතන්නේ ය. තමන්ට ම කථා සාර ගන්නේ ය. මේ බිණීම් හිත එකඟ කරගත තොනවත්වා ම කරගත යන්නේ භාවනාවක් මෙනි.

41

ප්‍රියංකරවූ කෝමල කාන්තාවන් කැළඹුණු සිහින් යුක්තව වැළඳ සිඹ සනසමින් නුදුරෙහි සිටි කළු (ගොවිඳු) රාධාවට දක්වමින් යෙහෙළිය මෙසේ පැවසීය.

රාධාව කාමයෙන් කුල්මත් කරවන අයුරෙන් වසන්ත කාලය පිළිබඳ වර්ණනාවන්හි යෙදුන යෙහෙළිය රාධාව ගේ සිතෙහි වගාකල ආශාවන් තවතවත් ලියලවන අයුරින් ප්‍රේමවන්තයා වෙතත් කාමිනියන් සමග කෙළිදෙළෙන් පසුවන අයුරු චමත්කාරජනක ලෙස මෙසේ කියා පාන්නීය.

42

සඳුන් කල්කය හා නිල් පැහැති ගාත්‍රයන් පීත පැහැති සළුවෙන් වසන ලද, වන මල් මාලා ගෙළ පළඳන ලද, හිස හැරවීමේදී පැද්දෙන මිණි කොඬොල් හැප්පෙන දෙකම්මුල් ඇති, මුවග සිනාවක් නැංවූ හරි තෙමේ රාගයෙන් මත්වූ ක්‍රීඩා ලෝභී යුවතියන් සමග අනුරාග රසයෙන් ප්‍රීතිවන අයුරු බලව.

43

හරි තෙමේ ශෘංගාර රසාත්මක ගීයක (වස්දඬුවෙන්) තාලය දෙන කල් හී අනුරාග රසයෙන් කුල්මත් වූ කිසියම් ගෝපිකාවක් තම පියයුරු වලින් ඔහු තලා පොඩි කිරීමට මෙන් බදා වැළඳගෙන ගැයෙන තාලයට අනුව අනුරාගාන්විත ගීයක් ගයන්නී ය.

44

අනුරාගය පිරි ඉතිරී යන එක් කෙළිලොල් කෝමල කාන්තාවක් තියුණු කාන්ති ඇති සවකිය නෙතින් ලොබ වඩ වඩා පද්මයක් හා සමාන මදු සුඳන (ගොවිදු) වත වශීව බලා සිටින්නී ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

45

පුළුල් වූ උකුලක් ඇති වෙනත් රූමත් එකියක් කනට රහසක් කොඳුරන්නාක් මෙන් ලංවී සුමිහිරි කපෝල සිඹ ගත්තී ය.

46

සුරත ක්‍රීඩාවෙහි ගිජුවූ වෙනත් ගෝපිනියක් යමුනා නදී තීරයෙහි වේතු වනයට පිවිසගත් ගොවිඳු ගේ සළුවෙන් අල්වා ගෙන තමා වෙතට ඇදගැනීමෙහි යෙදෙන්නී ය.

47

ගොවිඳු ගේ වස් දඬුවෙන් නගන ලද සුමිහිරි තනුවට අනුව පා තබමින් නටන නව එකියක් එයට අනුරූපවන රාග තාලයක් වලලු ගැටීමෙන් නැංවෙන පරිදි අත්ලෙන් අත්ලට ගසන්නී ය.

48

හේතෙමේ එකියක් වැළඳ ගන්නේ ය. තව එකියක් සිප ගන්නේ ය. වෙනත් එකියක් සහ හුරතල් කරන්නේ ය. හිනැහෙන අතික් සුරතියක් වෙත ඇස් හෙළන්නේ ය. කෙළිලොල් අනෙකක් ලුහු බඳින්නේ ය.

කෘෂ්ණ ගේ සමාගමය ප්‍රියකරන්නියෝ රැසෙකි. ඔවුහු සියල්ලෝ ම නවයොවුන් යුවතියෝ ය. රූ සපුවෙන්, නැඹුල් බවෙන්, විලාසිතා දක්වීමෙන්, අනුරාග මතයෙන්, ඔම මොළ රූමතියෝ එකෙක් අනෙකකුට නොපරදින්නෝ ය. හැම එකියකගේ ම ආශාවත් උත්සාහයත් කෘෂ්ණ තමාට ම අයත් කර ගැනීමට ය එහෙත් කෘෂ්ණ ගේ නම් එබඳු ආත්මාර්ථකාමී පටු අදහසෙක් නැති. ඔහු ගේ ආශාව ඔවුන් සියල්ල ම පිණවීමට ය. එකවිට ම පිණවීමට ය. තමා ගේ ආලය සෑම දෙනාට ම එකසේ පවත්නා බව පෙන්වීමට ය. කුමන ලෙසකින් හෝ එකියක්වත් අත්හැර දැමීම ඔහුට කළ නොහැක. ඔවුහු සියල්ලෝ ම එක සේ ම ප්‍රියංකර බැවිනි, එබැවින් හේතෙමේ එකියක් වැළඳ ගන්නා

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගමන්ම අභිසාරිකාගේ වත සිඹින්නේ ය. වෙනත් එකියක් හුරතලයෙන් කිතිකවන්නේ ය. සිනාවෙන් තමා දෙස බලා සිටින රූපිනියකගේ හද නෙත් පහරින් හිල් කරන්නේ ය. තමා වෙතින් පැන යෑමට උත්සාහ කරන අනෙකක් ඇල්වීමට ලුහුබඳින්නේ ය.

49

වෘන්දවන වදුලෙහි කේෂවයන් ගේ විසිතුරු ක්‍රීඩා, ලොලත්වය වර්ණනා කෙරෙන ශ්‍රී ජයදේවයන් ගේ තෙපලෙන් සිරි සුබ මඟුල් වේවා.

50

කෙළිලොල් කාන්තා සමූහය විසින් සිපගන්නා ලද මහනෙල් මල් පැහැති සිනිඳු ශරීරය ඇති ගොවිඳු තෙමේ අනුරා රස ප්‍රබොධ කරමින් සුපුරුදු යහළු ලියන් සමග අනංගයා මෙන් කාලය ගතකරන හැටි බලව.

51

මලය පර්වතයෙන් හමන නිරන්තරයෙන් සර්ප විස මිශ්‍ර වූණ සුවඳවත් සුළඟ (මලය පව්වෙහි සඳුන් ගස් බෙනයන්හි නාගයෝ වෙසෙත්ල) ග්‍රීෂ්මය නැතිකරන පරිද්දෙන් හිමාලය දෙස ඇදී යන්නේ ය. මෑදුවූ අඹ තුරු මුදුන්හි සුදු කැකුළු මතු වන්නේ ය. බොහෝවූ කොවුල් නාදය දස දිශාව පුරා යන්නේ ය.

52

කුල්මත් වූ ගොපළු කාන්තාවන් සමග, ප්‍රේම ක්‍රීඩාවන්හි යෙදී අප්‍රමාණ සෙනෙහසින් හද වියොගිනි ඇවිලීගිය රාධාව තුරුළුවී සිපගත් සිත් අදනාවූ හෙම්සළු (ගොවිඳු) සියලු ලෝ සතුන් රක්ෂා කෙරේවා.

යෙහෙළිය විසින් නානා අරමුණු දර දැමීමෙන් රාධාව ගේ වියොගින්න වඩවඩාත් උග්‍රවූයේ කෘෂ්ණ තමාගෙන් වෙන් වූවා පමණක්ම නොව අන්‍ය කාන්තාවන් රමනය කිරීමෙහි නියැලීමෙන් තමාට නිග්‍රහය කළ බවද සිතීමෙනි. වියෝගයේත්, ඊර්ෂ්‍යාවේත් වේදනාවෙන් මිරිකෙන රාධා මෙසේ විලාප නගන්නී ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

දෙවැනි සඟ.

53

වෙනු (ගොවිඳු) වන වදුලෙහි යහලු ගොපලු ලියන් සහ බැඳී ප්‍රේම ක්‍රීඩාවන්හි යෙදී සිටින අතර නිරන්තරයෙන් බමර නදින් රැව්දුන් ලියගොමුවක ඇලී සිටින බොළඳ රාදාව වියොවුක මෙසේ පැවසූ හ.

54

ප්‍රියංකර බටදඬු ගීයෙන් රසගැන්වුණ පොළඹවන සුළු අති මිහිරි දෙතොලක් ඇති හෙතෙමේ (ගොවිඳු) කොමල බැලුම් ඉඟියෙන් හිස නටවන විට දෙකපොලෙහි වැදෙන කුණ්ඩලාභරණ ඇත්තේ ය. (අහෝ ඔහු) ගොපලු නැවුම් ජයට නටමින් කරන ලද විහිළු කෙළි කවට මට සිහි වන්නේ ය.

55

පූර්ණ චන්ද්‍රයා වැනි ලප ඇති මොනර පිල් ගවසන ලද කෙස් රොදින් යුතු, දේදුන්නෙහි කාන්තියෙන් බැබලුන වැසි වලාකුලක් බඳු ඔහුගේ ශරීරය සිත්හි ආසා වඩවන්නේය.

56

බරවූ පුළුලුකුලක් ඇති ගෝපිතියක ගේ වත සිප ගැනීමෙහි ආසා කළ ඔහුගේ දන්ත කාන්තියෙන් පැහැ පත්වූ ලාදළු වැනි මෘදු දෙතොල බඳුවද මල් පියලි වැනි ය.

57

දහස් ගණන් වූ යහලු ලියන් ගේ දළුවැනි අත් වලින් වැළඳ ගැනීමෙන් ඇඟ ලොවූ දූහැගැන්විහිය ඔහුගේ, අත්, පා, උරතල යන තැන්හි පැළඳි ආභරණයන් ගේ මාණික්‍ය රශ්මියෙන් අන්ධකාරය දුරුවන්නේ ය.

58

වැසි වලාකුලක් වැනි ඇස් බැම මැද පුන්සඳ වැනි සඳුන් තිලකය තුබූ ඔහු ගේ ශක්තිමත් පුළුල් උරතල ආරා වැඩෙන පූර්ණ පයෝධරයන් ගේ ආඩම්බරය නැති කිරීම සඳහා මැවූහාක් වැන්න.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

59

මකර සටහනින් යුත් මනෝහර මාණික්‍ය කුණ්ඩලයන් පැද්දී වැද්දෙන කොපුල්තල ඇති පීත පැහැති දුහුලක් ඇඳි ඔහු පිරිවරා සුර, අසුර, නර, මුනිවරුදීහු සිටින්නෝය.

60

ප්‍රේම කලහ කෙළියෙහි ප්‍රිය සුන්දරියන් පිරිසුදු කදම්බ මූලයෙහි දී සනසන ලද, අනංග සැර විදිමින් මා පීනවන චංචල බැලූම් හෙලූ (ඔහු සිහිවෙන්නේ ය.)

61

සුන්දරතර මෝහන මදුරිපු (ගොවිඳු) ගේ රූපය පිළිබඳව ශ්‍රී ජයදේවයන් විසින් කරන ලද මේ වර්ණනාවෙන් භක්තිමතුන් ගේ සිත් නැවත නැවතත් හරිගු ගේ ශ්‍රී පාදය කෙරෙහි යොමු කරවා පාපයන් ගෙන් මුදවනු ඇත.

62

මගේ බොළඳ සිත තවමත් හරි (ගොවිඳු) කෙරෙහි ම බැඳී පවත්නේ ය. හේ ගොපලු ලියන් වැළඳ ගෙන ඔවුන් ඔකඳ කිරීමෙහි යෙදී සිටියි. ඔහු ගේ කෙතරම් වැරදි තිබුනත් ඒ සියල්ලම යටපත් කරගත මා සිතට නැගෙන්නේ ගුණයන් මය. හිතවත, ඔබ කෙරෙහි මා සිත වෙනස් වූයේ නැත.

සවකීය වල්ලභයා කෙරෙහි ඇති ප්‍රේමය විසින් තිකුත් හැඟුම් පරදවනු ලැබූ රාධාව යෙහෙළියට මෙසේද කියන්නට වූහ.

63

පෙර වසන්ත කාලයෙහි දී ලතා මණ්ඩප වදුල තුළ මා සහ සැඟවී කෝමල සිනාවෙන් කාලය ගතකළ ඔහු අද මට නොමැත. මම සියලු දිසාවන්හි ම ඔහු සොයන්නෙමි. අනේ ප්‍රිය මිතුරිය, මට හිංසා පීඩා කරන අනංගයා එළවා දමන මෙන් කේසී ජයගත් ගොවිඳුන් මා වෙත කැඳවාගෙන එනු මැනව.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

64

පළමු සමාගම දිනයෙහි කෝලබියෙන් සිත ගැහි ගැහී මුවග මඳ සිනාවක් නංවාගෙන මා සිටි තැනට ලිහිල් දුහුලක් ඇඳගෙන පැමිණි මා ආදරවන්තයා කෙළිකවට බසින් මා තුළ වූ කෝලය දුරු කෙළේය.

65

මගේ සයනය වූයේ ලා දළු රිකිලි ය. ඔහු ගේ සයනය වූයේ මා පින් පියොවුරු ය. මා ඇද බැඳ වැළඳ මුව මී බිව් ඔහු අද මා හට නොමැත.

66

ඔහුගේ ඇඟ රෝමෝද්ගමනය වී ඇස පියවී ගිය සැටි ද, අනංගයා ගේ ආඩම්බරය මැඩීමට වෙහෙස වුන මා ගතෙහි ඩහ බිඳු නැගී ගිය සැටි ද මට සිහිවන්නේ ය.

67

කාම් කෙළියෙහි තෙරපත් හෙතමේ කෝකිලයන් ගෙන් මෙන් ගෙල රැව් නැගෙන ලිහිල් වූ කුසුමින් ආකූලවූ මා ළමැදෙහි නිය සලකුණු දුන්නේය.

68

සුරති රසට අනුරූප වන පරිද්දෙන් මගේ නූපුරයන් සහ මිණි මෙවුල රැව් දුන්නේ ය. වරලින් මා තමා වෙත් හී ඇද ගනිමින් ඔහු මිහිරි සේ සිප ගත්තේ ය.

69

රතියෙහි මුදුන් පත් වත්ම තෙළුම් පියැල්ලක් වැනි ඔහු ගේ නෙත පියැවී ගියේ ය. අනඟ රස විඳීමෙන් වෙහෙ සුන මගේ ශරීරය ඕජා සිඳී ගිය ලතාවක් වැන්න.

70

ශ්‍රී ජයදේවයන් විසින් වර්ණිත කරනු ලැබූ මදුරිපු ගේ ශෘඞ්ගාර චරිතයෙහි ගෝපිනියන් පිළිබඳ රස තෙපුල් ඇසූ, එසේම බිණූ, සියල්ලන්ටම සිරි සුබ මංගලයක් වන්නේ ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

71

මේ පෙර සිඩියක් සිහිපත් කරමින් ඇය දුක් වූ සැටි ය ය. ලද බොළඳ ගෝපිනියන් රොත්ත මැදට වී කෘෂ්ණ ඔවුන් නොයෙක් විලසින් ඔකඳ කරවමින් පොළඹවමින්, රමණය කරන රූප්පාවට රාධා හදිසියේ ම පැමිණියා ය. ඇය දකිත් ම මහත් ලජ්ජාවට පත් කෘෂ්ණ කලාත්මකව තමා සරසන ලද ඇසි බැමැති ඒ කාමිනියන් සමූහය ඇසිල්ලකින් විසුරුවා හැරියේ ය. ඔවුන් ගී රසයෙන් මෝහනය කළ ඔහුගේ බට නළාව වෙව්ලන දෙඅතින් ගිලිහී වැටුනේ ය. බිලියන් සන්ත්‍රාසයත් නිසා ඔහු ගේ මුහුණෙන් ඩහ බිඳු වැටී ගියේ ය. මේ මෙසේ වූ නුමුදු රාධාව රැවටීමට ඔහු මහත් ආයාසයෙන් පෙම් සිනාවකින් මුව සරසා ගත්තේ ය.

72

ඈත පෙනෙන කුසුමන් පිපී ගිය අසෝකය. ගුමු නඟන බමරුන් වසා ගත් අඹමල් සහ අතු ය. නොයෙක් වන පොකුණු ය යනාදිය පිසගන හමන සුළඟ මා ගත දවා සිත් හී සෝකය වැඩි කරන්නේය.

73

පියයුරන් සහ කිසිලි පෙනෙන පරිද්දෙන් දෙ අත් ඔසවා හිසකෙස් සදන මඳ සිනාවෙන් මුහුණු සරසා ගත් ගොපළු කාන්තාවන් වෙත නෙත් යොදමින් වසන හරි (ගොවිඳු) ඔබගේ කෙලෙස් සිත තසතු ලැබේවා.

—

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

තෙවැනි සග

මන බඳනා මොළ සළෙල ලියන් ගේ සමාගමය ප්‍රිය කරමින් කෙළි ලොල් භාවයෙන් ඔවුන් විනෝද කිරීමෙහි නියැලී සිටියද, කෘෂ්ණට රාධාව කිසි ලෙසකින් අමතක කළ නොහැකි. රාධාව සමග ඔහුගේ ඇත්තේ සසර තෙක් පැවති එන ප්‍රේම සම්බන්ධයකි. තමාගේ හැසිරීමෙන් සිත තැලී ගිය රාධා සිහිව, සංවේගයට පත් කෘෂ්ණ ගේ වැලපීම මහත් අභිරුචියෙන් ශ්‍රී ජයදේව කියා පාන්නේ වරදෙන් ගොඩ ඒමට තැත් කරන ප්‍රේමවන්තයකු ගේ සිතුවිලි විදහා පාන්නාක් මෙනි.

74

කංසා ජයගත් ගෝවින්ද සංසාර නමැති යදමෙන් බැඳීගිය රාධා සුන්දරිය සිහිකරමින් බාල ගොපළු කාන්තාවන් බැහැර කර හැරියේය.

75

කරන ලද ක්‍රියාවන් ගැන පසුතැවිලි වෙමින් අනංග හී පහරින් පැලීගිය හදැතිව සිය පෙම්බර සුකොමලිය සොයමින් යමුනා නදී තීරයෙහි වූ ලිය ගොමුවට පැමිණියේය. –පැමිණ මෙසේ වැලපෙන්නට වනි.–

76

මා සත්‍රීන් මැද සිටිනු දුටු විගසේම ඇ ආපසු හැරී ගියාය. ඇ නවත්වා ගනු පිණිස වරදෙහි බැඳුන මගේ සිතට ධෛර්‍ය යක් නො විය. අහෝ – අහෝ – ප්‍රේමය අතහැර දමා ඇ කෝපයෙන් ගියා ය.

77

විරහයෙන් පසුවූ ඇ කුමක් නම් කරනු ඇති ද? කවරක් නම් කියනු ඇති ද? මිල මුදලින් හෝ යහලු සත්‍රීන්ගෙන් හෝ කවර නම් පලක්ද? ඒ නබා ජීවිතයෙන් පවා මට ඇති ප්‍රයෝජනය කවරේද?

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

78

රත් නෙළුමක් වසා රොද බැඳගත සිටිත බිඟු මුලක් පරිදි සරොස් සිතින් බැම බිදි ඇයගේ පෙම් මුහුණ මට මතක් වන්නේය.

79

මා හා නො වෙතස් ව පෙම් කෙළියෙහි යෙදුණු මගේ හදවත තුළ ඉන්නා සුන්දරිය කුමක් නිසා වනාන්තරයෙහි සොයන්නෙම්ද?

80

බැන්දවූ ප්‍රේමය කඩා බිඳ හැර කෝපයෙන් මා අත්හැර ගිය මා ප්‍රේම තංවඩයිය ගේ දෙපා නැමද ක්ෂමාව අයැදීමට ඈ දූන් සිටින තැනක් නොදනිමි.

81

පෙම්බරිය, ඔබ මා සමීපයෙහි හැසිරෙන්නාක් මෙන් මගේ ඇස් ඉදිරියේ පෙනේ. අහෝ ප්‍රේමිය, පෙරදී මෙන් මා තුරුල්ලට විත් රස පහස නො දෙන්නේ කිම්ද?

82

අනේ සුන්දරිය මට කමා කරන්න. නැවතත් මෙසේ සිදු නොවන බවට මම පොරොන්දු වෙමි. රාගයෙන් මා ගත දැවෙන්නේය අහෝ මාගේ ප්‍රේමය පිළිගන්න.

83

කින්දුබිල්ව නැමැති මහ සයුරෙන් මතුවූ පූර්ණ චන්ද්‍රයා සමාන ශ්‍රී ජයදේවයන් විසින් ක්‍රිෂ්ණගේ සෝකාලාපයෝ මෙසේ ගීයට නහන ලදහ.

(ජයදේවයන් උපන්නේ කින්දුබිල්ව නම් ගමෙහි ය.)

84

මගේ ළයෙහි ඇත්තේ හෙළ නෙළුම් මාලාවක් මිස අනන්ත නාග රජයා නොවේ. ශරීරයෙහි තවරා ඇත්තේ සුදු හඳුන් කල්කය මිස යාග අළු නොවේ. අනංගය, මා ඊශ්වරයා යයි වරදවා සිතාගෙන මට නොවිදුව.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

අසුරයන්ගේ විපතින් සුරයන් මුදා ගැනීම සඳහා මහෙශ්වරයන්ගෙන් පුතකු ලබා ගැනීම අවශ්‍ය විය. අන් කිසිවකුට ද අසුරයන් මැඩිය නොහැකි බව මහා බ්‍රහ්මයන් ගෙන් ප්‍රකාශවූ බැවිනි. එහෙත් මහෙශ්වරයෝ මහා සිල්වත්හුය. උග්‍ර තපස් කාරන්නෝ ය. ස්ත්‍රී වර්ගයා කෙරෙහි මහත් පිළිකුලක් දක්වූ ඔහුගේ චිත්ත සන්තානයෙහි කාමාශා මාත්‍රයක් කිසිදු විටක ඉපදීමට අවකාශයක් නැති. මෙසේ කොට ඔහුගෙන් කෙසේ නම් පුතකු ද කරවා ගන්ට ද? මේ පිළිබඳව කතිකා කරගත් දිව්‍ය සමූහයා සරාගීක හැඟීම් ඇති කරවීමෙහි නම් දූරු මදනා වෙත පැමිණ දිව්‍ය සංඝතිය රැක ගැනීම සඳහා කෙසේ හෝ මෙහෙසුරු කාමයෙහි පොළඹවන මෙන් අයැද සිටියෝය. මදනා වෙත මෙතරම් බැරෑරුම් වගකීම් භාරයක් කිසි විටෙක නො පැවරුණේය. එනිසා හෙතෙමේ දන්නා මට්ටම් තබා ඇඟැක්ම තරම් වැරෙන් මෙහෙසුරාගේ හද වතේ මැදටම මල් හී විද්දේය. මෙහෙසුරු නලලැසින් නිකුත් වූ ගිනි ජාලාවන් ගෙන් මදනා දූවී පිළිස්සී අනංග බවට පත් වූයේ නමුදු ඔහුගේ තියුණු හීයේ කුරුමාණම හරි ගියේ ය. අසුරයන් වැනැසීම සඳහා මෙහෙසුරුට දූව පාවර්තියගෙන් ඛඳ කුමරු පහළ වූයේ එහි ප්‍රතිඵලය වශයෙනි.

එදා මෙහෙසුරු වීදි පරිද්දෙන් ම අනංගයා කෘෂණට මල් හී එල්ල කරනැයි කීමෙන් දක්වන්නේ ඔහුට ඇති කාමාශාවන්ගේ උග්‍ර භාවයය. එසේ ම මෙහෙසුරුගේ සහ කෘෂණ ගේ ඇඳුම් පැළඳුම්, ගති විලාසාදිය ද එව ගියෙන් කියැවෙන්නේ ය.

85

සියලු ලෝක සත්වයන් ඔකඳ කොට කෙළි දෙලෙහි පිහිටා ස්වකීය වසඟයට ගන්නා වූ මදන, දුර්වලයන් පෙළීම පිරිමි කමක් නොවේ. ලෝකයා විසින් ද එය වරදැයි පිළි

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ගන්නා ලද්දකි මෘගාක්ෂිය ගේ නෙත් සැරයෙන් දෑදුරු වී ගිය මගේ හදවත තව තවත් පාරනා විලස නොප අත ඇති උගු දුන්නෙහි අඹමල් හී නොයොදව.

86

සකල ලෝකයම වසඟයට ගත් ඇය ගේ (රාධාවගේ), බැමින් දූන්න සද කන්වැල් දුනු දියට යොදා චංචල බැලුම් නමැති හීය විදින්නේ ය.

87

ඇය ගේ බැම නමැති දුනු දියෙහි නෙත් නමැති සැර යොදා ක්‍රීඩා කෙරේවා. මනහර වරල හේතුකොට ගෙන අනංගයා ප්‍රබෝධමත් වේවා. බිඹුපල වැනි සුමිහිරි දෙ තොලින් මෝහනය වේවා. නැවතත් පූර්ණ පයෝධරයෝ ක්‍රීඩා සහිත වෙත්වා.

88

සුමිහිරි සුවදින් සුවඳවත්වූ රත් නෙළුමක් වැනි මුහුණ ද, බිඹු පලයන් ගේ පැහැය පැහැර ගත් ආශ්චර්යමත් තොල ද, පෙම් දියෙන් තෙත් වූ දෙනයන ද, මිහිරි බස ද, මට කිසි ලෙසකින් අමතක කළ නොහැකි. මෙයින් මා හද තුළ වියොගිනි පැත්රී යන්නේ ය.

89

වස් දඹුවෙන් මිහිරි ගීතස්වරය නංවන, දෙකපෝල යන්හි කුණ්ඩලාභරණ වැදෙන, යුවතියන් ගේ ආදරයට පාත්‍ර වූ, රාධා වෙත පෙම් බැලුම් හෙළන, හරි තෙමේ නිරන්තර යෙන් සියලු සිරි සැපත් සලසා දේවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

සිවු වැනි සග.

මෙසේ වියෝ ගින්නෙන් දැවී, වරදින් බැගෑවී, බලාපොරොත්තු වලින් හීන වී ඉතා දුකසේ ලතා ගුල්මයේ වැද වැතිරී සිටි කෘෂ්ණ වෙත පැමිණි රාධාව ගේ යෙහෙළිය ගේ බසින් වියෝ දුකින් පෙළෙන කාන්තාවක ගේ අභ්‍යන්තර බාහිර විලාශයන් ජයදේවයෝ මොනවට විසිතුරු සේ දක්වන්නෝය.

90

පෙම් පෙරළි කොට, යමුනා ගඟ බඩ ලිය ගොමු වදලෙහි සොවින් සැලි සැලී වැලපෙන මාදවයන් ගේ දුක් මැක් තුනී කරමින් රාදව ගේ යෙහෙළියක් මෙසේ පැවසූවා.

91

සඳුන් කල්කය ඇත් කළ ඇය දුන් සඳු මෙන් සුදුමැලි බවට පත්ව සිටින්නී ය. වැහැරී ගිය ඇය ගේ සුකුමාර දේහයට මලය ප්‍රදේශයෙන් හමන සිහිල් සුවඳ සුළඟ විස මෙන් දැනෙන්නේ ය. මාදවය, අනංගයාට බියෙන් මෙන් පෙම් බැඳි තා සිහිකරමින් ඇය බොහෝ දුකින් ඇවිදින්නීය'.

92

හදවත මැද ඇඳී ඇති තොප ගේ රූ සටහන මහත් වූ අනංග සැරවලින් රැක ගන්නා මෙන් ඇය තෙත් වූ නෙළුම් පෙති මාලාවෙන් ලැම පෙදෙස වසන්නී ය.

93

පෙර පරිද්දෙන් තොප වැළඳ ගෙන සැනහී සැපසේ සැතපෙන පිණිස ඈ කුසුමවියා ගේ අවි වැනි මල් යහනක් සැදීමෙහි යෙදී සිටින්නී ය.

94

රාහු ගේ මුව තුළට ගිය ද සෞම්‍ය චන්ද්‍රයා අමා රැස් දහර විහිදු වන්නාක් මෙන් නෙළුමක් හා සමාන වූ දුක්බර වූ ඇය ගේ වතින් කඳුළු බිඳු කඩා වැටෙන්නේ ය.

10

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

අත්‍යයනතට නොදැනෙන සේ රාධාව කස්තුරියෙන් මාධව යා ගේ රූපය ඇඳ එයට පුද පූජා පවත්වන්නී ය. මාධව රූපයේ අතෙහි අඹමල් කිනිත්තක් ඇත. දෙපා මුල මත්ස්‍ය යෙකු ගේ රූ සටහන වෙයි. මේ ඇය මාධවයා අනංගයා ලෙස ඇඳ දක්වූ සැටියි. අනංගයා ගේ අත්හී සවකිය ශී සඳහා බොහෝ විට ගනු ලබන අඹමල් ඇත්තේ ය. ඔහු මින වාහනාරූඪ වූවෙකි. රාධාවට මාධවයා අනංගයා ය. ඇය විෂය ලෝකයෙහි රස භාවයන් දැන උගත්තේ ඔහුගෙනි. පෙම් මඟට පා තැබුයේ ද ඔහු ගේ මඟ පෙන්වීමෙනි. මාධව ගේ වෙන් වීමෙන් ඇයට මේ සියල්ල නැතිවී ගියේය. එබැවින් ආශ්වාද රතියත්, ප්‍රේමයත් නැවත ලබා ගැනීමට මාධව ස්වරූප අනංගයා පිදීම යුක්ති යුක්තය.

95

අතෙහි අඹ කැකුලක් දරා මීන වාහන නැගි සේ රඟයින් තොපගේ රූපය කස්තුරියෙන් ඇඳ ඇය එයට භක්ති ප්‍රේම යෙන් පුද පූජා පවත්වන්නී ය.

96

තොප ඉතා ම ඈත වුව ද ඈ සලකන්නේ ඇය ගේ සිත පත්ලේ තොප ඇති බව ය. ඈ ඉමහත් දුකින් වැළපෙන් නී ය. හිනැහෙන්නී ය. මැලවෙන්නී ය. චංචල වන්නී ය. ඇවිදින්නී ය.

97

මගේ ශරීරය දවන ගින්න නිවීමට කිරි මුහුදේ දිය වුවද ප්‍රමාණවත් නොවේ. මාදව තොපගේ පාදයන් වඳිනෙමි. මා ගේ දුහය නිවනු මැනව. මෙසේ කියන ඇගේ බස අසව.

98

හරිගෙන් විරහ වූ රාදාව ගේ සෝකය සෙහෙළිඹ රස බසින් කී අයුරු පැවසෙන ශ්‍රී ජයදේවයන් ගේ මේ ගීතයන් රස බීමට සුදුසු ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

99

ඇය ගේ නිවෙස දූත් වන ලැහැබෙක. යෙහෙළියන් විසින් පළඳවන මාලා දාමයන් ඇය හඟින්නේ මලපුඩු ලෙස ය. ඇය ගේ මුවින් නික්මෙන සුසුමයෝ ගිනිසිළු වැනියහ. තොප ගේ විරහ දුකින් පෙළෙන එම මුවැත්තිය බිලි කරගනු සඳහා අනංග කොටියා ඉව කරමින් හැසිරෙන් නේ ය. අනේ ඌට ඇය අසුවනු ඇත.

100

මාලාදාමයෙහි බර ඉසිලීමට පවා නොහැකි පරිද්දෙන් අනේ ඒ මතරම් තන්වංගිය වැරි ගොස් ය. කේසව තොප ගේ විරහයෙන් රාධිකා මහත් දුක් විඳින්නී ය.

101

මිහිරි වූ මලය සඳුන් කල්කය රුදු විසයක් මෙන් ඇය අප්‍රිය කරන්නී ය.

102

ඇගේ මුවින් නික්මෙන සුසුමයෝ හද තුළ ඇති අනුරාග යෙන් නික්මෙන ගිනි සිළු වැන්නහ.

103

තොප සෙවීම සඳහා දස දිසාවම බලන ඇය ගේ නෙත්‍ර යෝ නෙළුම් පෙති වැන්නහ. ඉන් නික්මෙන කඳුළු වැල් දූලක් ඇදියාක් වැන්නහ.

104

සැඳෑ කාලයෙහි පෙනෙන නිශ්චල නව සඳ වැනි මුහුණ ඒ කුමරිය නිරන්තරයෙන් ම අත්ලෙහි රඳවා ගෙන සිටින්නී ය.

105

ලපල කුසුමින් සඳන ලද යහන ඇයට දැනෙන්නේ ගිණි සිළු ලෙස ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

106

විරහ සෝකයෙන් තැවීම නිසා මරණය ළං වූවාක් මෙන් සළකන ඇය නිරන්තරයෙන් ජපයක් මෙන් "හරි" යි කියන්නී ය.

107

ශ්‍රී ජයදේව විසින් බඳන ලද හරිහු ගේ ශ්‍රී පාදය වෙත පත් මෙම ගීතයෙන් සිරි සම්පත් සැදේවා.

108

ලොමු දැහැගත් ඇය ගේ ගත සීතල බවට පත් වී ඇත. ඇය ගේ මුවින් නික්මෙන සුසුම් හඬ පැතිරෙන්නේ ය. ඈ හිටි හැටියේ විලාප නගන්නී ය. මොහොතකින් හිනැහෙන් නී ය. එම විටම හඬන්නී ය. බිම වැද පෙරළෙන්නී ය. යළිදු නැගිට පෙර මෙන් ඒ සියල්ලම කරන්නී ය. අහෝ දිව්‍ය වෛද්‍යතුමාණෙනි, ඇය වැඩි කලක් ජීවත් නොවනු ඇත. ඇය සුවපත් කළ මැනව.

109

දිව්‍ය වෛද්‍යවරයන් වන අස්විණීන් ගේ ප්‍රියතම වූ උචිද්‍ය, අමා මෙන් මුදු සුවඳවත් තොප ගේ ස්පර්ශයෙන් ඒ හද පැලී ගිය කුමරිය සුවපත් නො කරතොත්, තොප සෙන පහර කටත් වඩා නද ළයක් ඇත්තෙක.

110

තොප ගැන ම දිවා රෑ දෙක්හි සිතමින් වෙසෙන ඒ තන්වංගියට, සඳ, සුදු සඳුන්, නෙළුම් සිහි වන විටද අනංග දැහයෙන් සිරුර දවන්නේ ය. භයානක මාර මුඛයට වැටී සිටින ඇය ගලවා නොගන්නෙහි ද?

111

ඇසිපිය හෙළීමේ දී තොප රුව දැකීමට වන බාධාව උසුලනු නොහැකි වූ ඒ පෙම්බර සුරූපිනිය තොප ගැන සිත

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

සිතා මෙපමණ කලක් ගත කළා ය. අඹ ඉති මලින් බරව ගොස් තිබෙනු දක්නා ඇයට තව තවත් විරහ දුක් ඉසිලිය හැකි ද?

අඹමල් වලින් කියනුයේ එය වසන්ත කාලය බවයි. සාමාන්‍ය අය පවා කාමාශක්ත කරවන වසන්තයෙහි විරහිනියන් කෙසේ නම් සැනසී සිටින්නේ ද?

112

ධාරාතිපාත වරුසාවෙන් ගොපොලු කුලය රැක දිම සඳහා ගෝවර්ධන පර්වතය ඔසවා ලූ හස්තය, ප්‍රෙම හරිත තරුණාංගනාවන් ගේ දෙ තොල්හි ගෑ ලතු දියෙන් රත් පැහැවුන ශ්‍රී හස්තය, මහත් බල සම්පන්න රෞද්‍ර කංසා නම් සතුරා වනසා ලුව ශ්‍රී හස්තය, මෙම ගීතිකාවන් අසන ඔබට ශ්‍රී පතිහු ගේ එම ශ්‍රී හස්තය නිරන්තරයෙන් සිරි සෙත දෙනු ලැබේවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

පස් වැනි සගය.

රාධා කෙරෙහි කෘෂ්ණ ගේ සිත්හී ඇතිව තුබූ සැක බිය සහිත චංචල භාවය සංසිඳවා ලූ යෙහෙළි ලිය රාධා වෙත පෙරළා ගොස් ඇය ඔහු වෙත කැඳවා ගෙන ඒමට දරණ ප්‍රයත්නය මනොහාරී ලෙස ජයදේවයෝ මෙසේ විස්තර කෙරෙති.

113

රාධාව ගේ විරහ දුක් පැවසූ යෙහෙළියට හරි තෙමේ, "මම මෙහි රැඳී සිටින්නෙමි. තී ගොස් ඇය සනසා මෙහි කැඳවා ගෙන එව"යි කියෙන් යෙහෙළිය රාදා වෙත ගොස් මෙසේ කියන්නට වනී.

114

කාමාශාවන් ඇති කෙරෙමින් මලය සුළඟ හමන්නේ ය. ප්‍රිය විප්‍රයෝග දුකින් පෙළෙනවුන් ගේ හදවත් පෙළමින් සෑම තැනම කුසුම් පිපේ.

යෙහෙළි රාදව, තොප විරහයෙන් ඇති වූ සෝකයෙන් වනමාලී (කෘෂ්ණ) මැලවී වැටී යෙසි.

115

සඳ රැස් ඔහුට මරණ වේදනා දෙන්නේ ය. අනංගයා ගේ මල් හී වලින් විදිණු ලැබූ හෙතෙම වලප්නේ ය.

116

බමරුන් ගේ ගුම් නාදය ඇසෙන විට දෙ අත්ලෙන් දෙ සවන් වසා ගන්නා හේ විරහ දුකින් කැලඹුණු සිතින් යුක්තව රාත්‍රියක් පාසා ඉමහත් දුකින් කාලය ගෙවයි.

117

මල් දම් පැළඳීම අත් හළ හේ දුන් ලිය මඩුවෙන් ඈත්ව මහ පොළොවෙහි වැතිරෙමින් නිරන්තරයෙන් තොපගේ නම (රාධ රාධායි) මුමුනයි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

118

කෘෂ්ණ ගේ විරහ දුක් වේදනාවන් කියැවෙන ශ්‍රී ජය දේවයන් ගේ මේ ගීතයන් සේවනයෙන් ඔබ ගේ හද තුළට හරි පැමිණ නිරන්තරයෙන් ලැගුම් ගනීවා.

119

මේ ලිය ගොමුව තුළ තොප සහ තරුණ රයය සිත් සේ විඳි අයුරු සිතමින්, තොප නම ජපයක් සේ නිබඳවම කිය මින්, නැවතත් රන් පුන් කලස් වැනි තොප ගේ පියයුරන් වැළඳ ගැනීමට හේ පතන්නේ ය.

120

ප්‍රිය මිනාප පරිද්දෙන් කම්සුව විඳීමට කාම දේවයා මෙන් තොපගේ පෙම්වතා සුපුරුදු ලිය මඩුවෙහි සිටින්නේ ය. පුළුල් වූ උකුලක් ඇත්තිය, තොප සතුටු කිරීමෙහි සමත් ඔහු වෙත වහා යව. සිහිල් සුළඟින් සුව දායක වූ යමුනා ගංතෙර වනමාලී (කෘෂ්ණ) වෙසෙයි. තොප ගැන නොඉවසිල්ලෙන් හෙතෙම බලා සිටියි. ගෝපිනියන් ගේ පියයුරන් මැඩීමෙහි නියැලිව තුබූ ඔහු ගේ ඇඟිලි තොප සුරතල් කිරීමට මහත් ආශාවෙන් පොපියනු ලැබෙයි.

121

තොප ගේ නම ද, හමුවිය යුතු තැන ද හේ මිහිරි ලෙස වස් දඬුවෙන් වාදනය කරන්නේ ය. තොපගේ ඇඟෙහි ඇති මල් රොන් පිස හමන සුළඟ පවා ඔහුට ප්‍රිය ජනක ය.

122

පක්ෂියකු ගේ පියාපතක් හෝ ගසකින් වැලකින් ගිලි හුණ කොළයක් හෝ පොළොවෙහි පතිත වන විට ද හේ තිගැස්සී තොප එතැයි මඟ දෙස බලන්නේ ය. චංචල වූ ඇසින්, පෙළඹී ගිය සිතින් යුක්ත වූ තොප ආයේ වනැයි සිතා මල් යහනා සදන්නේ ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

123

අනුරාග රසයෙහි සතුරු වූ හෙවත් තොප ගේ සමාගමය ගැන මුළු ලොවට අඩ ගා කියන්නා වූ පා සලඹ ගලවා දමා නිල් සළුවකින් වසා පොරවාගෙන ඔහු ගේ නිකුංජය කරා වඩායව.

124

පෙර කාල කුසලයක විපාකයක් විඳුනා පරිද්දෙන් කෘෂ්ණා ගේ ශරීර සයනයෙහි සැතපෙන තී ගේ ගෙලෙහි විදුලි දමයක් මෙන් දිලිසෙන මුතුහර වැසි වලාකුලක් තුලට පියාඹා යන කොක්කු අයිතක් වැන්න.

නිල් පැහැති කෘෂ්ණ ගේ ලය මඩල වැසි වලාකුල ය. එහි ලැග්ගෙන රාධාව ගේ මුක්තහාරය වලාකුලට පියාඹා යන කොක්වැල ය.

125

හැඳි සළු පිළි ලිහිල් කොට ඉන බැඳි මිණිමෙවුල ගලවා දමා ලදල අතුරන ලද යහනෙහි සැතපී මහනෙල් පියැල්ලක් වැනි ඇසින් මහත් ආශාවෙන් බලා සිටින ඔහුට නිතඹ නිධානය දක්වා වැළඳ තුරුළුව අනේක සැපත් විඳුව.

126

මා කියන සේ කරව. යම් සේ රාත්‍රිය ගෙවී යේ ද, එපරිද් දෙන් ම කෘෂ්ණා ගේ ආශාව ද ගෙවී යනු ඇත. සාඩම්බර මදුරිපු (කෘෂ්ණ) වෙත වහා ගොස් ඔහු සතාසා ලව.

127

හරීන් වහන්සේ මහත් භක්තියෙන් සේවයෙහි යෙදි ශ්‍රී ජය දේවයන් මෙ සේ පරම රමණීය ගීතයන් ගායනය කරන කල්හි, (තොපි) පිබිදුනු සැදෑහැ බැති සිතින් උන් වහන්සේ නැමද කුසල් පල ලබව්.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

128

විරහ ගින්නෙන් දැවෙන තොප ගේ පෙම්වතා නැවත නැවත උණුසුම් සුසුම් හෙළයි නිකුංජය තුළට ඇතුල්ව, යළි යළි එහි දොරකඩට පැමිණ තොප එන පෙරමඟ බලයි. තොප සඳහා කුසුම් යහන සරසයි. අහෝ! හේ නිරන්තර යෙන්ම නැවී වැලපී කාලය ගෙවන්නේ ය.

129

සූර්යයා බැස යත් ම, අන්ධකාරය පැතිරී යත් ම, තොප කෙරෙහි හරිහු ගේ ආශාව වැඩි වන්නේ ය. මේ දුඩි ගතිය අත්හැර දමා ඔහු වෙත යන ලෙස මම කො තරම් තම් ඇවිටිලි කළෙම්ද? ප්‍රිය මිතුරිය, යව – යව – මෙය එයට ඉතාම සුදුසු කාලය ඉවි

130

අන්‍ය සමාගමය ප්‍රිය කරණ ස්ත්‍රී පුරුෂයෝ මේ බඳු මහා ඝනාන්ධකාරය බෙහෙවින් ප්‍රිය කරත්. ලජ්ජාව නිසා හට ගත් බියක් නැති ගැනීමත් ඇති ඔව්හු කිසිවක් නො පෙනෙන මේ ඝන අඳුරෙහි තම ආශාවන් මූදුන් පමුණුවා ගැනීමට යෙත්. තමන් බලාපොරොත්තු වූ සුහදයන් යයි සිතා ඔවුනොවුන් වැළඳගෙන ප්‍රීතිවත අවස්ථාවන් හිඳී ය, එසේ වැළඳගෙන සිටින්නේ සවකියයන්ම බව වැටහෙනුයේ.

131

චංචල වූ ඇහින්, අන්ධකාර මාර්ගයෙහි වටපිට බලමින් කිසිවකුට හෝ නො පෙනෙන පරිදි තුරින් තුරට මාරු වෙමින්, රැඳි රැඳී ගොස්, ප්‍රේමයෙන් සිප වැළඳ හරි සතසව.

132

අතිශයින් ප්‍රිය සාරූ වූ රාදාව ගේ වත තඹරෙහි මධු පානය කරන මී පා වැනි වූ ද, දේවකිය ගේ පුත්වූ ලෝකාග්‍ර ඉඳු නීල ශිඛා මාණික්‍යය වූ ද, ලද බොළඳ ගොපලු කාන්තා

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

වන් ගේ සිත් සතුටු කිරීමෙහි නියැලුනා වූ ද, දුෂ්ට වූ කංසා වනසා දැමීම සඳහා ලෝ පහළ වූ ධූම කේතුවක් හා සමානවූ ද, ශ්‍රී කෘෂ්ණ තොප රැක දේවා.

133

(මෙසේ රාධා උතන්දු කරවීමෙහි යෙදුන යෙහෙළිය, ශ්‍රී ජයදේවයෝ නැවතත් කෘෂ්ණ වෙත යවන්නෝ ය.)

වියෝ දුකින් රාධාව අතිශයින් ම වැහැරී ගොස් ය. ගොවින්දයන් (කෘෂ්ණ) ගේ සමාගමය නිරන්තරයෙන් පත මින් සිහිකරමින් සිටිතුදු, ඇයට ඒ ලිය ගොමුවෙන් බැහැර යාමට තරම් ශක්තියක් නැති. මේ බව දුකින් පසුවෙන ගෝවින්දයන්ට යෙහෙළිය මෙසේ පවසන්නී ය.

134

අහෝ සවාමීනි, රාධාව, සිය වාසයෙහි—ලියගොමු තුලෙහි—මහත් දුකින් පෙළි පෙළී දුර්වලව ක්ෂය වන්නී ය. ඇය කෙතරම් නම් දුබල වී සිටි ද යත්, ඔබ සැම දෙසෙහි ම සිටින සේ ඇයට පෙනෙන්නේ ය. එමතු ද ඇය ගේ මුවම් උරන සේ ද දැනෙන්නේ ය,

135

තොප සමීපයට පැමිණීමට මහත් ආශාවෙන් පිය එසෙවූ ඇය කොතරම් දුර්වල වීද යත් අහෝ බිම වැටී ගියා ය.

136

ශරීරය දවන ගින්න මැඩ පවත්වා ගැනීමේ අදහසින් ඇය නෙළුම් දැලියෙන් කළ වළලූ අත්හි පළඳින්නී ය. කිසිදු ආහාරයක් නො ගන්නා ඇය ජීවත් වන්නේ තොප සමග කළ සුපෙම් කෙළි විහිළු සිතට නගා ගැනීමෙන් ඇති වන ආශ්වාදයෙනි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

137

තොප අඳිනා පපිදි සළු පිළියෙන් සැරසෙන ඇය "මදුරිපු නම් මම ය" යි කියන්නී ය.

138

මාගේ ප්‍රේමණීය හරි මෙහි නො එන්නේ කිමැයි ඈ නිබඳව ම යෙහෙළියන් ගෙන් අසන්නී ය.

139

ඇය අවට ඝනාන්ධකාරය පැතිරෙන විට හරියයි ආශා වෙන් වැළඳගෙන සිප ගන්නී ය. (කෘෂ්ණ අන්ධකාරය මෙන් කළු පැහැයෙන් යුක්ත ය.)

140

පෙර තිබූ ලජ්ජා ශිලි සහපත් ගතිපැවතුම් බිඳහැර ඇය ශෝකය ඉවසා ගත නොහි ලත දෙව් මහා හඬින් හඬන්නීය.

141

ශ්‍රී ජයදේව කිවිඳු ගේ මේ මනරම් වර්ණනයෙන් භක්ති මතුන් ගේ සිත් ප්‍රබෝධ වනු ඇත.

142

එම්බා වෛරය, ඇයගේ සිත පුරාම පවත්නේ තොප පිළිබඳ හැඟීම් ම ය. ආදර සාගරයෙහි ප්‍රේම තරංගයන්හි ගිලී ගිය ඒ මෘගාක්ෂිය තොප ගැනම සිතමින්, මනැස ඉදිරි යෙහි තොප රුව මවා ගනිමින් සම්මෝහන වන්නී ය. දෙඩන් නී ය. සුසුමන් හෙළන්නී ය. අහෝ තොප ගැනම ආශා ඇති ඇය මෙසේ වෙහෙසී අප්‍රමාණ දුක් විඳින්නී ය.

143

තොප දැකීමට ආශා කරන ආභරණයන් ගෙන් ඇය සැරසෙන්නීය. තණ පතක් සෙලවෙන විට ද ප්‍රියතමයා එන හඬ යැයි තිගැස්සී ඇය බලන්නීය. මෘදු මොළොක් මල් පෙති වලින් යහන අතුරා තොප ගැනම බලාපොරොත්තුව සිටින

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

දුර්විලවූ ඇය තොප ගේ සමාගමය නො ලැබ තව එක රැයක් ජීවත් වනු සැක සහිත ය.

144

"සහෝදරය, කළු නාගයකු ඉන්නා මේ තුඹගස මුල කුමකට සිටී ද? සියලු සැප පහසු කම් ඇති, නන්දගේ ගෙය තෙල පෙනෙන්නේ ය" මගියාට මෙසේ කාරුණාවෙන් පවසා රාධව ගේ බස දන්වනු ලැබූ ගොවිඳුගේ ආශීර්වාදය තොපට ලැබේවා.

එක් සන්ධ්‍යාවක මග අසල පිහිටි තුඹ සෙවනට මගියෙක් පැමිණ රාත්‍රිය එහි ගෙවන පිණිස පිළියෙල විය. මේ දුටු රාදුව, මගියාට කියනුයේ, "සහෝදරය, මේ තුඹය මුල නපුරු කළු නාගයෙක් වෙයි. මෙහි රැඳීම අන්තරා දායක ය. නුදුරින් පෙනෙන නන්ද ගේ ගෙහි මගීන්ට සියලු සැප පහසු කම් සැලසී ඇති. එහි ගොස් රාත්‍රිය සුවසේ ගත කරන්න." නන්ද ගේ නිවසට පැමිණි මගියාගෙන් කෘෂ්ණාට මේ පුවත දැනගන්නට ලැබුණි. ඇත්ත වශයෙන්ම මෙය මගියාගේ මාගීයෙන් රාදා, කෘෂ්ණ වෙත යැවූ පණිවුඩයෙකි. රාද - කෘෂ්ණ දෙදෙනාගේ ප්‍රේම නිප්පල මේ තුඹ සෙවන ය. එහි මගියාගේ රැඳීම ඔවුන්ට බාධාවෙකි. කළු නාගයා වශයෙන් කියන ලද්දේ කෘෂ්ණ ගැනය.

රාදා තුඹය මුල ඔහු ගැන බලාපොරොත්තුවෙන් රැඳී සිටින බව මගීහු ගේ පණිවුඩයෙන් කෘෂ්ණ දැනගත්තේය.

145

මේ, අතර, රූමත් කාන්තාවකගේ නළලෙහි වූ සඳුන් තිලකයක් වැනි සඳ, අහස් තලයට නැඟී වන තලාවන් අලෝකමත් කරන්නට පටන් ගත්තේ, දික්වූ කළු සෙවනැලි පැතිර ගියේය. තරුණ වෛශ්‍යාඞගනා වන්ට අවහිර කිරීමේ පාපයෙන් සඳෙහි කළු ලප ඇති වූවා දෙයි සිතමි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

146

පූර්ණ චන්ද්‍රයා අහසෙහි නැගී නැගී එයි. එහෙත් තවමත් ගොවිඳු ගේ පැමිණීමක් නොවිය බලාපොරොත්තු කඩ වී. ශෝකය දරාගත නුහුණු ඇය උණු කඳුලු ඉසිමින් නොයෙක් ආකාරයෙන් වැලපෙන්නීය.

147

නියම කරගත් පරිදි වන වදුලට නියමිත වේලාවට, හරි ගේ පැමිණීමක් නැති අහෝ ඔහු නොමැතිව මගේ තරුණ භාවයෙන් හෝ මනහර රූප ශ්‍රියෙන් හෝ ඇති ඵලය කුමක්ද?

148

මා යමෙකු සඳහා මහා රාත්‍රියෙහි පවා වනාන්තරයට ගියෙම් ද? අහෝ ඒ ඔහු මා අත්හැර ගොස්ය. අනංග ශරයන් ගෙන් මා විදිනු ලැබෙයි.

149

බැලු බැලූ තැම තැනම, හැම දෙයෙහිම මට ඇත්තේ දුක් මය මගේ හදවත පැලෙන්නේ ය.මෙබඳු දැඩි විරහ දුක් විඳිනවාට වඩා මරණය මට උතුම්.

150

අනේ මේ රමණීය රාත්‍රිය මා දවන්නේ ය. මා මෙසේ දැවෙන තමුදු දැන් මේ මොහොතේ වාසනාවන්තියක් හරිහු ගේ පුරුල්ලෙහි ඔකඳ වනු ඇත.

151

හරිහුගේ විරහයෙන් ඇතිවූ ප්‍රේම ගින්නෙන් මගේ ශරීරය දැවෙන්නේය. මේ ආභරණයන් ගෙන්, අත්හී ඇති මිණිමය වළලු වලින්, කවර නම් ප්‍රයෝජනයක් ද?

152

මල් පෙති හා සමාන මෘදු මොළොක් වූ මගේ සුකුමාර ශරීරයට මේ මාලාදාමයෙහි බර ඉසිලිය නොහැකි ය. එය මට දැනෙන්නේ විස හී තල මෙනි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

153

මතරම් වන පෙත අත්හැර, හරිහු නිසා මෙහි රැඳුනෙමි. අහෝ එහෙත් ඔහුගේ සිත්හී මා කෙරෙහි දයාවක් නොමැති.

154

ප්‍රේමවන්තයකු ගේ හෘදයෙහි සුරූපි පෙම්බරියකගේ රූපය ඇඳී තිබෙන්නාක් මෙන් හරිහු ගේ ශ්‍රී පාද පද්මයන් සේවනය කරන ශ්‍රී ජයදේවයන් ගේ මේ රසවත් ගීති කාව්‍යෝ භක්තිමතුන් ගේ සිත්හි රැඳී පවතිත්වා.

155

පෙම් තිප්පලට හේ නාවේ ඇයි? මිත්‍රයන් සමග ක්‍රීඩා සක්ත ව හේ පසු වන්නේ ද? නැතහොත් අන්‍ය කොමලියක් ලුහු බඳින්නේද? එසේත් නැතහොත් දුක උපුලණු නොහැකිව දුර්වලව මේ කිට්ටුවම වැතිරී සිටීවත් ද?

156

මේ අවස්ථාවෙහි මාදවයා (කෘෂ්ණ) වෙතට ගිය යෙහෙළිය ආ පසු පැමිණ කිසිවක් කථා නොකර එහි සිටින බව දුටු රාධා, කෘෂ්ණ වෙනත් නව යොවුන් රූබරියකට ආදරයෙන් පසුවන බව සියැසින් දුටු පරිද්දෙන් මෙසේ කියන්ට වූවා.

157

මට වඩා රූප සම්පන්න වූ කෝමල සොඳුරියක් සමග මදුරිපු තෙමේ (කෘෂ්ණ) කෙළි දෙළෙන් කාලය ගෙවයි.

ඔහු පිනවීම සඳහා අලංකාර ලෙස සැරසුණ ඒ සුරූපිනිය අතිශයින් කැලඹී සෑම් රස කෙළියෙහි යෙදෙන විට අවුල් වී ගිය කේශ කලාපයෙන් මල් පෙති හැලී යන්නේ ය.

158

කෘෂ්ණ (හරි) විසින් ඇය තුරුළු කොට වැළඳ ගන්නා කල්හි උත්සන්නවූ හැඟීම් ඇති ඇය ගේ ළැම ප්‍රදේශය පිම්බෙන විට ගෙල පැළඳි මල්දම දිය රැළක සිරිය ගත්තේ ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

159

පියකරුවූ ඇගේ තලලෙහි වැටී කියඹු රොද චන්ද්‍රයා ගේ දුක්වෙන කළු ලප මෙනි. දෙතොලින් අමා මුව මී උරා බී සන්තර්පනය වූ කෘෂ්ණ ගේ දෙ ඇස් පියවී යයි.

160

කාම් කෙළියෙහි යෙදි ඇය ගේ කුණ්ඩලාභරණයෝ සෙලවී කම්මුල් පිරිමදිත්. ඉනෙහි වන මෙවුලෙහි කිකිණි නාද කරයි.

161

ඇය ගේ පියාදර කෘෂ්ණ ඇය රූ සපුව ගිජු ඇසින් බලන කල විලියෙන් සිනාසෙයි. කෘෂ්ණ විසින් තුරුළු කර ගනු ලැබූ ඇය කාමාශා වඩවමින් පරෙවියක මෙන් උගුර හඬවයි.

162

ප්‍රීතියෙන් උද්දමවූ ඇය ගේ ලොමූ දැහැගත් සර්වාංගය කීලිපොලා යයි. තිම් සැනසී ගිය ඇය ගේ දෙනෙත් පියැවෙයි.

163

සුරුපි දේහයෙන් මුතු වන් ඩා බිඳු කඩා හැලෙන ඇය තවත් උසුලනු නොහැකිව වෙහෙසී ඔහු ගේ ළමැදට හාන්සි වන්නී ය.

164

කෘෂ්ණ ගේ සුරති කෙළි වර්ණනා කොට ශ්‍රී ජය දේවයන් විසින් බඳින ලද මේ ගීතිකාවන් සේවනය කරන ජනයා ඝොරෙන් කලියුග පාපයන් ඈත්වනු ඇත.

165

අහා – මේ සඳ මට හරිහු ගේ නෙළුමක් වැනි මුහුණ සිහි කරවයි. එහි ඇති මේ පඬු පැහැයෙන් විරහ ගින්නෙන්

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

මිරිකී ඔහු සුදුමැලිව ගිය හැටි මට පෙනෙයි. එහෙත් අනංගයා ගේ පැරණි මිත්‍රයකු වූ මේ චන්ද්‍රයා කිසිවකු ගේ හෝ පිහිටක් නොමැති මා නොඉවසිය හෙන පරිද්දෙන් පෙළෙන්නේ ය.

166

මේ දූත් පවා යමුනා තීර වන රොදෙහි වැලි තලාවක් මත මුරාරි (කෘෂ්ණ) අනිකක් සමග ප්‍රීති වන්නේ ය. මහත් මුරණ්ඩු ලෙස මා අත් හැර දමූ හේ අනිකක් සමග විජය ශ්‍රීයෙන් කෙළි දෙලෙහි යෙදී සිටියි.

ආශාවන් ප්‍රබෝධමත් කරන ඇය ගේ සුපුන් සඳ වැනි මුහුණ සඳහා සමාන වන පරිද්දෙන් තලලෙහි කස්තුරියෙන් තිලකය තබා ලපය ඇඳ අනුරාග දක්වා දෙතොල මී බිඳු උරන්නේ ය.

167

වැසි වලාවක් වැනි වූ ද, අනංගයා නැමැති මුවා සැඟවී සිටින වන රොදක් වැනි වූ ද, සිත් පොළඹවන ඇය ගේ දිගු සුනිල් කේශ කලාපය හේ මහත් ආශාවෙන් කුරවක කුසුමින් සරසන්නේ ය.

168

අහස් තලය මෙන් පැතිරී ගිය ඇය ගේ කලස් වැනි පිරුණු උස් පියයුරන්හි කස්තුරි කල්කය ආලේප කොට අඩ සඳවන් නිය ලකුණු එබූ හේ තාරකා මෙන් බැබළෙන මුතු කැට වලින් ගෙල සරසාලන්නේ ය.

169

සිහින් බැවින් නෙළුම් දලි පැරදූ, රත් නෙළුම් වන් අත්ල ඇති ඇය දෙ අතෙහි ඔහු පැළඳූ ඉඳුනිල් වලලු නෙළුමක් වටකර රොද බැඳ ගත් බඹර මුලක් වැන්න.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

170

අනංග තෙමේ රුවන් සිහසුන් අරා වැජඹෙන දෙවො- ලක් වැනි මුදු සිනිඳු පුළුලුකුල වටා නලියන ඇඟිලි වලින් ඔහු විසින් බඳිනා ලද මිණි මෙවුල් දම පූජාසනය ඉදිරියෙහි එල්වන ලද මාලාදාමයක් වැන්න.

171

නිය නැමැති මාණික්‍යයන් දිළිසෙන, රත් නෙළුම් පියලි වන් රුචිරාතනීය පාදයන්ට රක්ෂාවරනයක් පරිද්දෙන් ඝෙතෙමේ ශ්‍රියා කාන්තාව රුදි තම ළය මත තබා ලාක්ෂා රස ගල්වන්නේ ය.

172

හලදර (බලරාම) යාගේ නපුරු සහෝදර තෙමේ (කෘෂ්ණ) කාමිනියන් සමග මෙසේ රමනය වන කළ මෙහි තනිව කුමකට කාලය ගෙවන්නදැයි යෙහෙලිය කියව.

173

මදුරිපු (කෘෂ්ණ) ශ්‍රී පාද සේවනය සඳහා පවිත්‍ර භක්ති යෙන් චිත්තය යෙදුවා වූ ජයදේව කවිරාජයන් ගේ රස කවි සේවනයෙන් කලියුගයේ පාපයන් ළං නොවනු ඇත.

174

මගේ ප්‍රේම පණිවුඩය නියම අන්දමින් ඔහුට දුන්වූ ප්‍රිය යෙහෙළිය කුමක් නිසා නී දුක් වන්නෙහි ද? හිත් දැඩි ඒ සොර තෙමේ ප්‍රිය වූ ගැහැණුන් වැළඳගෙන කැමති සේ ප්‍රීති වෙත්වා - ඔහු කෙරේ බැඳී ගිය මගේ මේ හෘදය වස්තුව ලඟදීම - ශරීරයෙන් ඉවත් වී ඔහු වෙත පියාඹා යනු ඇත.

175

අහා ප්‍රිය යෙහෙළිය, වනමාලී (කෘෂ්ණ) සහ ප්‍රීතිවන ඇය වාසනාවන්තියෙක. සුළඟෙහි සැලෙන නිළුපුල් පෙති මෙන් චංචල වන ඇස් ඇති ඔහු හා සමග ලපළු යහනෙහි සැතපෙන ඇයට කිසිදු දුකෙක් නොමැති.

11

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

176

ප්‍රිය ගිය පද්මයක් වැනි මුහුණක් ඇති ඔහු සමග කෙළි දෙළෙහි යෙදී ඇයට අනංගයා ගේ හී සැර වලින් වන පීඩා වෙක්ද නැති.

177

අමා සරි මිහිරි බස් ඇති ඔහු සමඟ යෙදී ඇයට මලය උපීතයෙන් එන සුවඳ මුදු සුළඟෙන් දැවීමෙක් ද නොවන්නේ ය.

178

වැහි වලාවක් වැනි සිසිල් සිත් බඳනා ගතක් ඇති ඔහු හා වසන ඇය සඳ රැසින් නොදැවෙන්නේ ය.

179

වැහි වලාවක් වැනි ගතැති ඔහු හා සමග රමනය වන ඇයගේ හෘදය විරහ බරින් දුදුරු නොවන්නේය.

180

රන්වන් සළුවෙන් සැරසුණු ඔහු හා බැඳුණු ඇයට යෙහෙළියන්ගේ කවට සිනා ආදියෙන් වන තැවීමෙක් ද නැති.

181

මුළු මහත් පොළොවෙහි සියල්ලන්ට ම වඩා උතුම්වූ තරුණ භාවයක් ඇති ඔහු සහ තියැලි ඇයට කිසිදු කරුණෙකින් දුකක් නොවන්නේ ය.

182

ශ්‍රීජයදේවයන් ගේ මේ රසවදන් සහ උවිඳු ගේ දසාවද රසිකයන් ගේ හදතුළට පිවිසේවා.

183

සඳුතෙන් සුවඳ වත් වී දකුණු දිශාවෙන් හමන්නා වූ සිසිල් සුළඟ අනංගයා හා සමඟ මිතුරුව මා මෙසේ කවර

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

කාරුණක් නිසා පෙළන්නේ ද? ලෝකය ප්‍රීතිමත් කරවන මිත්‍රය, එක් මොහොතකට උවිඳු (කෘෂණ) මා ඇස දක්වා කැමතිවූ ලෙසකින් මගේ ප්‍රාණය රැගෙන යව.

184

හරි ගෙන් වෙන්ව සිටින විට ප්‍රිය මිත්‍රයෝ සතුරු වන්නෝ ය. පූර්ණිවන්ද්‍රයා ද රෞද්‍ර විෂයක් වැන්න. සිසිල් සුළඟ ගිණිදූල් වැන්න. මගේ හද දැවී අළුවන මේ වියෝ ගින්න මට විඳ දරානත නොහැකි. කාන්තාවනට ප්‍රේම මාගීය පීඩාදායකයැයි පැවසුවේ මේ නිසා ය.

185

හා මලය සුළඟ, තට කැමති සේ පීඩා කරව. අනංගය, තා කැමති සේ මගේ හද පලව. මම නම් නැවත ගෙදර නොයන්නෙමි. යමයා ගේ නැගනිය වූ යමුනා ගංගාව, එසින්වත් මා දවන වියෝගින්න නිවී යන පරිදි මා වෙලා ගෙන අනෝ ගිලගන්න.

186

රාධාව පීත පැහැති සළුව පොරවාගත ද හරි නිළුපුල් පැහැ සේලයකින් සැරසීගත ද අළුයම සිටිනු දුටු යෙහෙලියෝ මූළු මූළුවී සිනාසෙන විට විලි වැදී නැවී ගිය රාධාව වෙත ඇස් කොනින් බැළුමන් හෙළු නන්ද පුත්‍රයා (කෘෂ්ණ) සකල ඓශ්වය්‍යීයෙන් සලසාවා.

(හරි පීත පැහැ සළු අඳින්නේ ය. රාධාවගේ වස්ත්‍රය නිල් පැහැ ගත්තකි. හරි රාත්‍රිකාලය ගත කළේ රාධා සමඟ ය. අළුයම් කාලයෙහි යෙහෙලි පැමිණෙත්ම කලබල යෙන් ඇඳුම් ඇඟලීම නිසා මේ සළු මාරුවීම විය.)

187

අනඟ සැර වැදි වැදී නොනිඳ දුක සේ රැය ගෙවූ රාධාව අළුයම තමා ඉදිරියෙහි වැඳ වැටී භක්ති ප්‍රේමයෙන් යාඥ කරන කෘෂ්ණ (හරි) දක්නට ලැබී සිත්හි කකිය කකියා පැසවමින් තුබූ කෝපය මෙසේ ප්‍රකාශ කළාය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

188

කැමති පරිදි මුළු රාත්‍රි කාලයම නින්දක් නොලබා
කෝමලියක් සමඟ තොප කාලය ගත කළ හැටි ඔය රත්
පැහැ නෙත්ම කියා පාන්නේ ය. යව මාදව, යව, කේසව,
ඔබ වාටු කතන්දර වලට මා රැවටේයයි නොසිතව. රත්
නෙළුම් පියලි මෙන් තා ගේ ඇස් රතු පැහැ කිරීමට හේතුවූ
ඒ පෙම්බර සෝබනිය වෙතට යව.

189

ඇය ගේ මනහර ඇස් බැමිවල ගෑ කළු අඳුන් දෙනෙත්
සිප ගැනීම නිසා තොප ගේ තොල්වල තැවරී තිබේ. මේ
කළු වූ තොල් තොපට ඉතා ම ගැලපෙන්නේ ය. තොල ද
තා මෙන් ම දූත් කළු ය.

190

මද සහ සුද වැදී දිණු ප්‍රවෘත්තිය සටහන් කළ, රන්
පත්‍රයක සේ තගේ ඒ සුන්දර පෙම්බරිය විසින් තිය ලකුණු
ඔබන ලද සම්භෝගය ම දිස් වන්නේ ය. තොප කල් ගෙවූ
සැටි තොප ගේ ශරීරය මුළු ලෝකයාට ම අඬගා පවසන්නේ
මෙසේ ය.

191

බලව, තොපගේ ළමැද ඒ ප්‍රියාවිය ගේ දෙපතුල්හි ගෑ
ලතු තැවරී රත් පැහැ ගෙන තිබේ. මෙය හරියට හිටි
හැටියේම ආදරය නැමැති ගසේ දළු ලියලා ගියාක් වැන්න.
(හෘදය ආදර ගස ය. එහි තැවරී ගිය ලාක්ෂාරසය, ළදල ය.)

192

කාමාශාවෙන් මත්වූ ප්‍රිය සුන්දරියක් විසින් සපන ලද
ලකුණු තොප ගේ තොල් වල ප්‍රකටව ම පෙනෙන්නේ ය.
නැවත කිසි කලක තොප හා මගේ ආශ්‍රයක් නම් ඇති
වේයයි නොසිතව.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

193

කෘෂ්ණය, තොප ගේ පිටත මෙන් ම ඇතුලත ද කළු බව ඇත්ත ය. නැතහොත් මා වැනි සුවිනීත පෙම්බරියක් අත්හැර සල්ලාලියන් කෙරෙහි කෙසේ ඇදී යන්නේ ද?

194

තොපගේ සිතෙහි කළු බව පුදුමයට කරුණක් නොවේ. තා මේ වන පෙදෙස පීරා ඇවිද ප්‍රයෝගයන් නොදන්නා අහිංසක යුවතියන් රවටා අනාථ කරන්නේ ය. පූතනා වැනි දුප්පත් කාන්තාවක් අමු අමුවේම මරා දමා ජීවිතය පවන් ගත් තොප වැන්නකු ගෙන් වෙන කුමක් බලා පොරොත්තු විය හැක්කේ ද?

195

හා රස හඳුනන නුවණැත්තෙනි, ප්‍රේම මාර්ගය වැරදී ගිය, එසේ ම රැවටීමට හසුව අත්හැර දමනු ලැබූ, කෝපී විරහිනියක ගේ අවලාද වැලපුම් පැවසෙන ශ්‍රී ජය දේවයන් ගේ මේ ඉමිහිරි ගීතාවලියෙන් නික්මෙන අමෘතය හා සමාන රස පානය කරව්.

196

නිරන්තරයෙන් සාදර භක්තියෙන් සේවනය කරන ලද මගේ පිවිතුරු ප්‍රේමය රුදු කුරිරු සොර තා සිඳ බිඳ දමුවෙහි ය. නිර්ලජ්ජිතය, එය මට ඉවසිය හැකි ය. එහෙත් තාගේ ඒ අඹුවගේ යටිපතුලේ ගෑ ලතු වලින් රත්වූ ලැම ද, තොපගේ සිත තුළ ඇවිලෙන කාමාග්නිය පිටට නිකුත් වූ අයුරු දැක්වෙන රත් පැහැගත් ලැම ද, මට පෙන්වමින් තා මෙහි සිටිනු දැකීම මට කිසිසේත් ඉවසුම් නො දෙන්නේ ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

197

කම්සා සතුරු ගේ (කෘෂ්ණ) වස් දඬුවෙන් ගලා යන මිහිරි රාවයෙන්, එනම් අසුරයන් ගෙන් පැමිණෙන සියලු විපත්තීන් දුරු කොට සුරන් තොස පත් කළ ඒ වස්දඬු රාවයෙන්, එසේ ම කුල්මත් වූ කතුන් ගේ සැළු හිස් වලින් මදුරු මල්පෙති වැගිර වූ වස්දඬු රාවයෙන්, තවද ගෝපාලයන් පුදුමයට පත් කොට වශීකළ ඒ වස්දඬු රාවයෙන් ආසිරි යසස් සැලසේවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

නව වන සග

198

විරහයෙන් ජනිත වූ කෝපය රැදුව කෙරෙන් මෙපරිද්දෙන් උතුරු යන කල්හි යෙහෙලිය ඇගේ කනට කොඳුරා මෙසේ කියන්නට වූවා ය.

199

ප්‍රේම ලැහැබ්හි හරි රැඳී සිටියි. මුදු සිසිල් සුලභ ද හම සි. මෙහි රමණීය සැපත කොහින් ලැබිය හැකි ද? ආඩම්බර කාරිය, කුමක් නිසා නි හරි සමග මෙසේ දබර කරන්නෙහි ද?

200

තල් පල වැනි පිරිපුන් සුම්හිරි තිගේ පයෝදරයන් සුරතල් කිරීමට හරිහු ගේ අත්වලට ඉඩ නොදෙන්නේ ඇයි?

201

නී කෙරෙහි ඔහුගේ හෘදයෙහි ඇවිලෙමින් පවතින ප්‍රේම ගින්න නිවා නොදමන මෙන් මා තිට කෙතරම් තම් කිවෙහි ද?

202

නී මලානිකව සිටින්නේ ඇයි? වැලපෙන්නේ ඇයි? යෙහෙලි ලියන් තිට විහිළු කරන හැටි බලව.

203

දිය සහිත මුදු සුමුදු නෙළුම් පත් අතුරන ලද තිගේ සයනයෙහි හරි සතපා ගෙන ඔහු ගේ රූපශ්‍රිය සිත් සේ බලා නෙත් ලද ඵල ලබා ගනුව.

204

නී මෙතරම් හිතට වේදනාවක් කවර කාරුණක් නිසා දෙන්නෙහි ද? මගේ බස අසන්න. මා තිට හිතවත් බව දන්නවා නෝද?

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

205

ති වෙතට පැමිණි ආදරණීය බසින් සනසාලනු පිණිස හරි හට ඉඩ දෙව. අහෝ මේ විලසින් තිගේ සිත පීඩා, නොකරව.

206

හරිහු ගේ චරිතය වර්ණනා කොරෙන ශ්‍රී ජයදේවයන් ගේ මේ ගීතයන් ගෙන් රසික ජනයා සුවපත් වෙත්වා.

207

සුමුදු වූ ප්‍රේම පතුරමින් ති වෙත්හි එන ආදරවන්තයා, හට පෙරළා ප්‍රේම නොකරන, ඔහු ගෙන් සිදු වූ ප්‍රමාද දෝෂයන්ට ක්ෂමා කරන මෙන් කඳුළු වගුරුවා අයදින තමුන් අනුකම්පාවක් නොදක්වන තිට, සඳුන් කල්කය විසවීම, චන්ද්‍ර කාන්තිය ඉරු රැස් සේ චණ්ඩ වීම, හිම ගිණිසිළු මෙන් වීම පුදුමයක් නොවේ. ති වැන්නවුන්ට එය විය යුත්තෙක් ම ය.

208

විසිරි යන රොන් සුණු පරිද්දෙන් මන්දාකිනි නදිය ගලා යන්නාවූ, නමස්කාරයෙහි නියැලි ශක්‍රයා ප්‍රධාන දිව්‍ය ගණයා ගේ වොටුණු අග රැඳි ඉඳුනිල් මිණි නැමැති බමරුන් විසින් සෙවිනා ලද, පිපී ගිය රත් නෙළුමක් වැනි සිරිපතිහු ගේ මනෝනන්දන ශ්‍රී පාද පද්මයන් පාපයෙන් දුරුවීම සඳහා භක්ති ප්‍රේමයෙන් නමදිමු.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

දසවන සග

209

සෙවනැලි දික් බවට යෙමින් සවස් කාලය වැඩී යත් ම යෙහෙළිය ගේ කරුණු දැක්වීම නිසා රාධාව ගේ කෝපය ගෙවී යනු දුටු හරි සතුටින් ඉපිලී ඇය වෙතට ගොස් ඇය සනසා නම්මවාගනු සඳහා මෙසේ රසබස් තෙපලීමට විය.

210

මගේ ප්‍රාණය හා සමාන ගුණවත් පිය සුන්දරිය මා සමග මෙසේ නොමිතාප වීමට කාරුණෙක් නැති. අනංග ගින් නෙන් මා හද දැවෙන්නේ ය. සුන්දර දේවිය, ප්‍රේම මුව මී පොවා මා හද ඇවිලෙන ගින්න නිවන්න.

211

මුතු මෙන් දිළිසෙන දත් දෙපළක් ඇති ප්‍රියාවිය, මා තොපට වරදක් කොළෙහි නම් මා සමඟ තිගේ සිත්හි සත්‍ය ලෙස ම නොමතාපයක් ඇතොත් මට දඬුවම් කිරීමට පසු බට නොවන්න. තිගේ තියුණු තිය පහර දී මා ශරීරය ඉරු දමන්න දිගු අතින් මා මිරිකාලන්න. කෝපයට පත් දතින් මා දෙතොල් විකාලන්න. මෙසේ කැමති සේ පලි ගෙන මා සමග ඇති නොමතාපය දුරු කරලන්න.

212

අහා, මා සුන්දරිය — මගේ උතතම ආභරණය තොප ය. මගේ ප්‍රාණය තොප ය. නොයෙක් කරදර කුණාටු වලින් පිරීගිය මාගේ හෘද සාගර පත්ලෙහි රැඳී ඇති මහාඝ්‍ර මාණික්‍ය රත්නය ප්‍රේමිය තොප ය. මගේ මේ ජීවිතයේ උසස්ම බලාපොරොත්තුව, එකම සතුට සීදේවිය පිණවීමම ය. අනේ සුන්දරිය, දැන්වත් මා හා සමඟ මෘදු මොළොක් බසක් බෙනෙන්න.

213

මගේ තන්වංගිය ගේ නිල් මහනෙල් පැහැගත් නුවන් යුග කෝපයෙන් රත්වී රත් නෙළුම් පියලි බවට පත්ව

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

තිබේ. සුන්දරිය, රත් පැහැගත් මේ නෙත් කොනින් මා වෙත බැලුමක් හෙලා අනඟ ඊතර විද මගේ නිල් ගත රත් පැහැ කරවන්න.

214

පුන් කලස් වැනි පයෝධරයන් බැඳ ඇති මිණි කැරලි පට බුරුල් කොට එයට මතු වීමට අවකාශ දේවා. පළල් වූ උකුල් තලය අලංකාර කොට ඇති මිණි මෙවුල් දම් කිකිණි හඩවා අනංගයා ගේ ප්‍රේමාඥාව පළකරනු ලැබේවා.

215

මිහිරි වදන් ඇති පෙම්බරිය, අහෝ එක ම එක වචනයක් මා සමඟ කථා කරන්න. රත් නෙළුම් පියලි වන් තිගේ සුකොමල යටි පතුල් ඉතා සුවිනීතව ලාක්ෂා රසයෙන් අලංකාර කරන්නෙමි.

216

ප්‍රේමාදර සිතිවිලි වලින් මා හිස ගිණිගෙන දැවෙන්නේ ය. අහෝ, ප්‍රිය සුන්දරිය, තිගේ ලපළුවන් පාද තල හිස් මත්තෙහි තබා මා සුවපත් කරන්න. සිළුමිණ මෙන් බැබලීම සඳහා තොපගේ කෝමල පාදය මහිස මත රඳවන්න. කෲරතර ලෙස අනංගයා මා දවන්නේ ය. මේ ගින්න සුන්දරිය, තිගේ මුදු මොළොක් පාදතලයෙන් නිවා දමන්න.

217

රාධාව රවටා සනසාලීම සඳහා මුරා ගේ පසමිතුරා (කෘෂණ) කරන ලද සල්ලාපයන් වර්ණිත ශ්‍රී ජය දේව කිවිහුගේ මේ රස පිරි ගීතයන්ගෙන් කැළඹිගිය සිත් ඇති කාන්තාවෝ ශාන්ත බවට යෙත්වා.

218

අහෝ පිය පෙම්බරිය, කුමක් නිසා තවමත් මා සැක කරන්නෙහි ද? මගේ සිත ඇතුළට තොප හැර අනංගයා මිස අන් කිසිවකු ඇතුළු නොවූ බව දිවුරා කියමි. ති අණ කරනු

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ලබන සියල්ලක් ම සුවවව ඉටු කරන බව නිසැක ලෙස සිත්හි තබා ගන්න. සුන්දරිය නී තුරුළු කර ගැනීමට මට ඉඩ දෙන්න.

219

පෙම්බරිය, අනංග චණ්ඩාලයා උගු දුන්න උර පුරා ඇද මල් හී විද මා හද දැදුරු කරන්නේ ය. ඒ සැඩොලා අතින් මිය යැමෙන් වන අගෞරවයෙන් අනේ සුන්දරිය මා මුදා ලන්න. අනංගයා ගේ කෲරතර ක්‍රියාව නී විසින් සම්පූර්ණ කරනු ලැබේවා. තොප ගේ අත් නැමති වැල් වලින් කිටි කිටියේ වෙලා දත් වලින් ගත ඉරා සුපුන් පයෝධරයන් ගෙන් තලා පොඩි කොට මා මරාලුව මැනව.

220

පුන්සඳ වැනි මුහුණ ඇති සිංදේවිය, නිගේ නැමි ගිය කළු දෙබැම නම් යෞවනයන් ගේ හෘදයන් දෂ්ට කොට විෂ යෙන් පුරවාලන ඝෝර වූ ආශිර්විෂයෝ ය. එහෙත් ප්‍රේමාමෘත බින්දු රැඳුන සුරත් දෙතොල සකල විෂ හරවන මන්ත්‍ර දැහැනෙකා.

221

මා ප්‍රියතම රාධාව — නිගේ අහංකාර නිශ්ශබ්ද තාව යෙන් මා මියන්නේ ය. සුන්දරිය, වීණා නාදය පැරදූ මිහිරි වදන් දෙඩා පෙර පරිදි ඇස් කොනින් පෙම් බැලුම් හෙළා මා සුවපත් කරන්න. අහෝ ප්‍රේමිය, මා හා බැඳී ගිය දෘඪ ප්‍රේමසම්බන්ධයන් කඩාහැර මා ඉවත් කර දමන්නෙහි ද?

222

සුන්දරිය, ලෝකය ජය ගැනීම සඳහා අනංගයා නී සහාය කර ගත් බව මගේ හැඟීම ය. ඌ තම නිපුණු හී නී ආදශී කොට ගෙන සැදූ බව නිසැක ය. නිගේ දෙතොල බඳුවදු කුසුමෙකා. කපෝල මදුකා මලෙකා. දිගැස් නිළුපුල් ය. නැහැය තල පුෂ්පයෙකා. සුදු දත් කොඳ කැකුළු ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

තිගේ වුවන දෙස බලා මල් හී සකස් කරගත් අනංගයා සකල ලෝකය ම සිය වසභයට ගෙන සිටින්නේ ය.

223

අහෝ සුරූපිනිය, තී මේ පොළොවෙහි සැරි සරනත් සකල දිව්‍ය කාන්තා කල්‍යාණයන් එකා තී කෙරෙහි කොත රම් ආශ්චර්යමත් ලෙස පිහිටා තිබේ ද? බලව, ඇස්හී මෘදු භාවයෙන් මදාලසා ද, පුන්සඳ හා සමාන රමණීය වුවනින් ඉන්දුමතිය ද, හංසායමාන ගමනින් මනෝරමා ද, නැමී ගිය සුන්දර බැම සහලින් චිත්‍රලේඛාව ද, සුමුදු සුපිරුණු වටොරින් රම්බා ද, කාන්තා ගුණයන් ගෙන් කාලවතිය ද යන මේ සිය එම දිව්‍යාංගනාවෝ තී කෙරෙහි වෙත්.

224

හරිහු විසින් සකල සම්පත් ඔබට දානය කෙරේවා. යුඩය සඳහා සැරසී සිටි කුවලයාපීඩ නම්වූ හස්තියා ගේ කුම්භ තලය දුටු ඇසිල්ලෙහි රාධා ගේ පින් පියොයුරු සිත්හි මැවී ඉන් ඇතිවූ ආශා වේගයෙන් සිරුරින් ඩහ බිඳු කඩා හැලී, මොහොතකට දෙඇස් පියවී ගිය යම් හරිහු කොතොක් දකි මෙන්, අපි දිණුවෙමුයි කම්සා ජයඝෝෂා නැගූයේ ද, ඒ හරිහු විසින් තොපට සියලු සැප ගෙන දේවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

එකළොස් වන සග

225

රාධාව මෙසේ රස බසින් සනසාලූව හරි තෙමේ ප්‍රිය උපදවන පරිද්දෙන් ශරීරය සරසාගෙන සුපුරුදු ලතා ගුල්ම යට පිවිස ගත්තේ ය. සිත්හී වූ ශෝකය පහකළ රාධාවට හිරු අස්තංගත වී යත් ම හිතවත් යෙහෙලිය මෙසේ කියන්නට වූවා.

226

රස උතුරා යන ආදර බස් තෙපලූ, එසේ ම නී ගේ නොමනාපය මගහරවාලනු සඳහා දෙපා මුල්හි වැඳ වැටී කමාව අයැදි ඒ ප්‍රේමවන්තයා මල් යහනේ සැතපීමට ආශා වෙන් ලතා ගුල්මය කරා ගියේය. යෙහෙළි බොළඳ රාධිකාව, තොප වෙත පෙම් බැඳි මදුමතන (කෘෂ්ණ) කරා වහ වහා යව.

227

වට මට සිළුටු දෙවොරර ඇති, තන බරින් බරවූ යෙහෙළිය, හින මෙවුලෙහි මිණි කිකිනි නින්නාද කරමින් හසහනක් මෙන් ඔහු වෙත රහසින් යව මැනව

228

යෙහෙළිය කන් දෙව. නව යොවුන් කාන්තාවන් කුල්මත් කරවන බමර ගීතයන් නැඟෙන්නේ ය. කෝකිල සමූහයා ජයස්තුති පාඩම් කරන සැටි අසව.

229

ගජ සොඬ මෙන් වට වූ වරෝර ඇත්තී ය. පුළඟින් සැලෙන වැල් සහ දළු ලතා ගුල්මයට නී ඉක්මන් ඉක්මන් සාර කැඳවන්නාක් වැන්න.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

230

මදන රළ වැලෙහි පෙරළෙන පුන්කලස් වැනි කම්පිත වන්නාවූ නි ගේ පයෝධරයෝ ළඟ එන වාසනාවෙහි පෙර නිමිති කියන්නාක් වැන්න. මගේ වචනය කෙරෙහි යම්කිසි සැකයක් ඇතොත් සෙහෙළිය තිගේ පුන් පියයුරන් විම සන්න.

231

ළඟ එන ප්‍රේම රණ කෙළියට නී මහත් ආශාවෙන් සැර සෙන බව සියළු සෙහෙළියෝ ම දනිත්. අහා සෙර, නි ගේ බොරු ලජ්ජාව අත්හරුව. සෙහෙළියෝ නී වලක්වාලතැයි යම්තමකට හෝ නොසිතව. එබැවින් පෙරට යව. නි ගේ මෙවුල සහ සළඹ නාදින් රණ ගොස පතුරා නොබා පෙරමුණ බලව.

232

සෙහෙළිය ගේ අතට වත්තම් වී යව මැනව. නි ගේ අත්වල වළලු එකට ගැටීමෙන් රණ බෙර හඬ නංවා නොබා යව මැනව. අනංග යුධයේ දී නි ගේ තියුණු නිය අවි මෙන් නිට සහාය වනු නියත ය.

233

හරිහු ගේ චරිත කථා වර්ණනය නැමැති ශ්‍රී ජයදේවයන් ගේ මේ මනෝහර මුක්තාහරය බැතිමතුන් ගේ සිත්හි භක්ති ප්‍රේම වර්ධනය කරමින් සදකල්හි පවතීවා.

234

දුන් දුන් රාදුව ගේ පෙම් බැලුමන්, රස මැසිවිලි, ලොමු දැහැගන්වන වැළඳගැනීම්, නොඅනුමානයෙන් ම ලැබෙතැයි මහත් බලාපොරොත්තුවෙන් ඉමහත් සතුටින් මග බලමින් සිටි ඔහු ජේනනෙක්මානයේ නී දැකීමෙක් නොමැති හෙයින්, කම්පා වන්නේ ය. සිහි නැතිවී ඇද වැටෙන්නේ ය. හඬන්නේ ය. අසිහියෙන් මෙන් දොඩන්නේ ය. අහෝ! හෙතෙම ප්‍රේමය නිසා බොහෝ දුක් විඳින්නේ ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

235

ප්‍රිය මිතුරිය බැළුව මැනව. කළු පලසක් වැනි අන්ධකාරය සිව් දෙස පුරා පැතිරී යන්නේය. මේ ගන්දර්ව කාන්තාවන් ගේ ඇස් බැම කළු අඳුන් ගා සරසයි. දෙසවන් කළු තමාල පතින් හොබවයි. කේශ කලාපයෙහි නිල් මහනෙල් දම් රඳවයි. ළැමදෙහි කස්තුරියෙන් කළ කළු කල්කය ගාන්නේයි කොටින්ම අන්ධකාරය වල්ලභයන් වෙත යන කාමිනියන් සියලු ලෙසින්ම වසාලන්නේ ය. කිසිවකුට හෝ නොපෙනී ඔවුනට ගමන් කළ හැකි.

236

රන් රසන් දම් හා රුවන් අබරණින් සැරසුණ කසාවන් රන් පැහැති කාන්තාවෝ අන්ධකාරය තුළින් සිය වල්ලභයන් සොයා යති. ඔව්හු කළු උරගලයෙහි දිලිසෙන රන් රේඛා මෙනි.

237

යෙහෙලිය ගේ අවවාදයන් ගෙන් ධෛර්‍යමත් වූ රාධාව ඇය සමග හරි සොයා ගියා ය දෙපයේ සලඹින් ද, ඉනෙහි මෙවුලෙන් ද, එසේම දෙ අත්හී වළලු වලින් ද, නිකුත් වන මාණික්‍ය රුස් වළලුවලින් පිටවී, ලතා ගුල්මයේ දොරකඩ රැකා සිටින හරිහු දැක, ලද බොළඳ ලජ්ජාවෙන් තැවීගිය රාධාවට හිතවත් යෙහෙලිය මෙසේ කියන්නට වීත.

238

බලාපොරොත්තු වන ප්‍රීති වේගයේ පෙර නිමිති මෙන් මුව පුරා පැතිරී ගිය සිනහවෙන් යුත් රාධාව, සිත් ගන්නා ලිය මඬුවෙහි ලදල යහනට වැද රිසිසේ ඔකඳ කෙළි කෙළව. රාදේ, මාදව සමීපයට නොලැගී යනුව.

239

හතියෙන් සැලෙන තන සඟල මත්තෙහි නලියන මාලා දමයන් ඇත්තිය, මෑදුවූ අලුත් අශෝක දළු අතුරා පිළියෙළ කළ නොල යහන්හි කෙළිදෙලෙන් කල් ගතකරව.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

240

මල් මෙන් මෘදු මොළොක් තිගේ සුකුමාර දේහය මිහිරි සුවඳින් සුවඳවත් වූ ලියමඩු තුලෙහි සතප්පව.

241

කුසුමවියා ගේ සැරට බියෙන් හැකුළුණ යෙහෙළිය, සිහිල් මලය නල හමන මෙහි සිප් සේ ප්‍රීති වෙව.

242

සුවිසාල උකුල් පෙදෙසක් ඇති රාධාව, වැල් එකිනෙකට එතිගිය ලා දළු රිකිලි වලින් අතුරක් සිදුරක් නොතබා වැසී ගිය මේ මනරම් ලිය මඩුවෙහි කැමතිසේ ක්‍රීඩා කරව.

213

මල් පැණි බී මත් වූ බමරුන් ගේ කෝලාහලයෙන් එකානින් නාදවූ මේ ලිය ගොමුවෙහි ආශාවන් නැතිවන තුරු ඔකඳ කෙළි කෙළව.

344

මුතුමෙන් දිලිසෙන දන්තයන් ඇත්තිය, කුල්මත්වූ කෝකිල සමූහයා ගේ කූජනයෙන් ප්‍රියංකරවූ මෙහි රිසි සේ කල් හරුව.

245

මුරාරින් වහන්ස - පද්මාවතිය ගේ පිහිටෙන් මේ ගීත බන්ධනයෙහි වෙර වැඩු ශ්‍රී ජයදේව කවිරාජයාන හට සිය ගණනින් ආශිර්වාදයන් දෙවා වදාළ මැනව.

246

යෙහෙළිය, තොප ගැන සිතිම නිසා ගත තැවී විඩාවට පත් වී දෙතොල් අමඋරා බිමෙහි ආශාව දියුණු කළ, බැම බිඳි පමණින් තොප ගේ සෑම මෙහෙවරක් ම කිරීමෙහි නියැලුණු, තොපගේ දෙපාමුල වැඳ වැටුණු, දසයා කෙරෙහි කුමක් නිසා බිය වන්නාහු ද?

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

247

මිතුරිය ගේ ඇණවීම පරිද්දෙන් රාධාව පද ගිගිරි හඬවා සුවඳවත් වූ ලතා ගුල්මයට පිවිස තිගැස්සෙන හදින් යුතුව සතුටින් පිරි ඉතිරි හරිහු ගේ මුහුණට නෙත් කැළුම් විහිදුවා ලීය

248

පුන්සඳ රැස් වැද තරංගයන් ඉපිලී ඔද වන සාගරය මෙන් අනේක පෙම් හැඟුම් වලින් විකසිත වී ගිය ඇයගේ මුහුණ දැක්මෙන් කැළඹුන සිතැති කෘෂ්ණ, රාධාව දුටුවා ය. ඇයගේ සමාගමය පතමින් ප්‍රේමය වැඩි දියුණු කරගනිමින් සිටි හරි ඇය දැක ප්‍රීතියෙන් කුල්මත්වන අයුරු රාධා දුටුවා ය.

249

ඔහු ගේ මහත්වූ පුළුල් උරතලයෙහි ලීලෝපේත වූ මුතු වැල යමුනා නදියේ පෙණ පිඬු වැලක් මෙන් ඇය දුටුවා ය. (කෘෂ්ණගේ සුනිල් පැහැ උරතලය යමුනා රළ තල ය. සුදේ සුදු මුතුහර පෙණ පිඬුය.)

250

රන්පැහැ සළුවෙන් වැසූ කෝමල ශරීරය ඇයට දිස් වූයේ රන්වන් මල් රොනින් වැසී ගිය නිල් මහනෙල් දණ්ඩක් මෙනි.

251

ඔහුගේ රුචිරාතණීය මුහුණ ප්‍රභාමත් කරමින් කාන්තී තිකුත් වන චංචල දෙඇස ඇය දුටුයේ සරද විලක පිපීගිය නඹරෙක පැන ඇවිදිමින් ක්‍රීඩාකරන ලිහිණී යුවලක් මෙනි.

252

සූර්‍ය බිම්බ යුගලයක් වැනි මාණික්‍යමය කුණ්ඩලාභරණ මුව තඹර තලවාලන මෙන් සෙමෙන් සෙමෙන් වැදෙන් නේ ය. සිත් ඇදගනු ලබන සිනාවකින් සැරසුණු මුව රාධාව ගේ රක්තාධර බිමෙහි ආශාව දක්වන්නේ ය.

253

සුදු මලින් ගවසන ලද ඔහු ගේ කේස කලාපය සඳරැස් රේඛාවක් වැටුණු කළු වලාකුලක් වැන්න. නළල චන්දන තිලකය, සුනිල් අහස මැද උදාවූ පුන් සඳ වැන්න.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

254

සුරත කලා කෙළියෙහි පාරප්‍රාප්ත වූ ඔහුගේ ශරීරය කිළි පොළමින් තලියන්නේ ය. මනඃකාන්ත ලෙස පළඳින ලද මණිකාභරණ කාන්තියෙන් එය මනාව දිලිසෙන්නේද වේ.

255

කර්ණරසායන සුන්දරතර මේ ගීතාවලිය නමැති මිලකල නොහෙන මිණිදමයෙන් ශ්‍රී ජයදේවයන් විසින් පුදනු ලබන හරින් වහන්සේ රසික ජනයෙනි, තොපගේ සිත් ගඳකිළි තුළෙහි වැඩ හිඳවාගෙන පූජා කරව්.

256

සිත් පැහැර ගත්තාවූ කෘෂ්ණ ගේ මනරම් රූ සපුව සිත් පුරා බැලීමට රාධාව ගේ ඇස් දෙකන් දක්වා දික්වී ගියේය. ප්‍රාණය හා සමාන වූ තමා ගේ ප්‍රේමවන්තයා වන ඔහු වෙත සමීපවන විට ඇයගේ සිත හුණුවී ගොස් වැහි බිඳු මෙන් උණු කඳුලු වැටුනි.

257

රාධාව ඇසිපිය නොමහෙළා හරිහු ගේ රූප සම්පත්තිය බලමින් මහත් ආශාවෙන් යහන වෙත ළංවෙත් ම සිය මූවඟ නැගී ආ සිනහව දෙකපොළ කසන ලෙසක් දක්වා යෙහෙළිය සඟවා ගත්තා ය.

258

මෘදු මොළොක් ලෙස රධාව මදින් මද සමීපකර විදුලිය වේගයෙන් තරයේ බඳා වැළඳ සිපගෙන, ඇයගේ උස්වූ පීන් පියොවුරු ලෙන් නැගී පිටින් මතුවූවාදැයි ගෙල හරවා තම පිට දෙස නෙත් හෙළූ නන්දගේ පුත්‍රයා (කෘෂ්ණ) තොපට සියලු සැප සම්පත් ආසිරි දනය කෙරේවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

259

මුරා වනසාළුව ඒ ශක්තිමත් දීර්ඝ බාහු යුවල සඳකල් විජය ග්‍රහණය කෙරේවා. කුවලයාපීඩ නම් රෞද්‍ර අසුරයා යුද්ධයෙහිදී හෙලා උගේ ගෙල ලේහෙයෙන් මදුරා මල් රොන් සුණු තැවරී ගිය කාලෙක මෙන් සුරත් පැහැගත් ඒ ශක්ති මත් දිගු බා යුවල සඳකල් ජයෙන් ජයට පත්වේවා.

260

පූර්ණ පයෝධරයන් නැමැති රත් නෙළුම් පොහොට්ටු ඇති රාධිකාවගේ අභිරමණීය සුවදායක ලමැද නැමැති තඩාගයෙහි ප්‍රසිද්ධ වූ රාජ හංසයෙක් මෙන් නිරන්තරයෙන් කෙළි දෙලෙහි ඇලි මුකුන්ද තෙමේ තොපට සියලු සම්පත් දනය කෙරේවා.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

දොළොස් වන සග.

261

යෙහෙළියන් ඉවතට යෙත්ම කාමාශක්ත රාධාව කුසුම් සයනය දෙස සිත යොමු කරමින් මුකුළු සිනාවකින් මුව සරසා ගත් බව දුටු ගුරුළුදද (කෘෂ්ණ) ඇයට මෙසේ කියන්නට වනී.

262

මා ප්‍රිය රාදිකාව, වහා එන්න. ඔබ ගේ ප්‍රාණය වැනි නාරයන ගේ තුරුල්ලට එන්න. ලපල සහ මල් පියැලි ඇතුරූ මේ සයනයෙහි මා රාදිකාව, ඔබේ සුකොමල පා තබන්න. එහි ඇති මෘදු මොළොක් භාවයට මේ ලා දළු සහ මල් පෙති ලජ්ජා වී හැකිලෙන මෙන් අනේ රාධාව පා තබන්න.

263

තොප ගේ මෘදු මොළොක් පාද තලයන් පිරිමදිනු සඳහා මෙහි තබන්න. මේ කෝමල පතුල්වල තෙළුමක් මෙන් මෘදු වූ ලා අත් වලින් කිවරක් ලතු දිය ගැවෙම් ද? ප්‍රියාවිය, මෙහි සැතපෙන්න. තොප ගේ පාදයෙහි වූ නූපුරය මෙන් මා වෙන් නොකොට තිබදව තබා ගන්න.

264

ප්‍රේමිය – චන්‍ද්‍රයා ගේ අමා උතුරන්නාක් මෙන් තොප මුව සඳින් සුපෙම් රස බස් දෙන්න. මා යම් ලෙසකින් දුන් දුකින් මිදී සිටින්නෙම් ද, එසේම දුහුල් තනපට ලිහා පිය යුරන් මුදා ලීමට ඉඩ දෙන්න.

265

ප්‍රිය දේහිනිය, තොපගේ සමාගමය පතමින් විරහ ගින් තෙන් දැවි දැවී පසුවුණ මගේ හෘදය නිවාලන පිණිස අහෝ! සුන්දරිය! පුන්කලස් වැනි මේ පියයුරන් මා ළමැදට තද කරන්න.

266

ප්‍රේමිය, තොප ගේ දෙඅදර අමාවෙන් මා සුවපත් කරන්න. විරහ ගිනි වැද හද දැවී පැලී මරණයේ දොරටුව කරා පැමිණී සිටින තොප ගේ සුවච වහලා වන මා අනේ සුවපත් කරලන්න.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

267

පුන්සඳ වන් මුහුණක් ඇති මා සිඳේවිය, තොප ගේ ඝන මෙවුලෙහි කිංකිනි නද සුමිහිරි වදන් හඬ හා සමග මුසු කර වන්න. මදමත් කොවුල් නාදයෙන් පීඩාවට පත් මගේ දෙසවන් ප්‍රේමිය ගේ රස බසින් සනසාලන්න.

268

අහෝ! සාදරිය, කුමක් නිසා මෙසේ දෙ ඇස වසාගත සිටින්නෙහි ද? කවර නම් වරදක් නිසා මා සමඟ උරණ වන් නෙහි ද? ඇයි සුන්දරිය, මා දෙස බැලීමට ලජ්ජා වන්නේ ඇයි? ප්‍රියාවිය මට තව තවත් වද දෙන්නේ කුමක් නිසා ද?

269

මදුරිපුහු ගේ රති අංශාවන් පිළිබඳව ශ්‍රී ජයදේවයන් විසින් බඳින ලද මේ මනහර ශෘංගාරාත්මක ගීතාවලියෙන් රසික ජනයන් සඳකල් ඔකඳ වේවා.

270

එකල ඔවුන්ගේ සමාගමය විය. සුරතෙහි සැම රසයක් ම එක බිඳකුදු මඳ නොකොට විඳ ගැනුමෙහි නියැලුණු ඔවුන්ට යම් යම් බාධාවන් නුවූයේ නොවේ. නිසසලව වැළඳ ගත සිටීමට රෝමෝද්ගමනය බාධාවක් විය. සිත්වූ පරිදි ඔවුනොවුන් ගේ රූපශ්‍රිය දැකීමට ඇසිපිය හෙළීම බාධාවක් විය. දෙ අදර අමා උරා බීමෙහිලා රස තෙපුල් කෙඳිරීම බාධාවක් විය.

271

ඝුගතින් බඳ වැළඳ ගෙන, පයෝධරයන් හප්පා තලා ලමින්, ඇඟෙහි නිය පහර ලමින්, කෙහෙයෙන් වෙතට අදිමින් රාධාවන් දුන් නොයෙක් වද හිංසාවන් හෙතෙමේ දිව්‍ය සැප මෙන් සැලකුවේ ය.

272

සුරතයෙහි හරි පරදවා ලනු සඳහා පෙළඹුණ ඇය ගේ පියකරු ගාත්‍රයන් ඇසිල්ලකින් ම වාගේ දුර්වල විය. දෙනෙත් පියැවී ගියේ ය. හෘදය වස්තුව වහා සැලෙන්නට විය. දුර්වල සත්‍රී වශීයාට අනංගයා කවර ලෙසකින් පැරද විය හැකි ද? නොහැක්කේම ය.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

273

නිදි වැරීමෙන් රත් පැහැ වූ දෙනයන ද, තැලී මිරිකී ගිය දෙතොල ද, නිය පහරින් බිඳී ගිය පියයුරන් ද, මිදීගිය කේශ කලාපය ද, ලිහිල්ව හැලීගිය සළුපිළි ද, ඇති රාධාව අළුයම් කාලයෙහි දුටු හරිහු ගේ සිත මල්සර සැරයෙන් විකල බවට පත් විය.

274

තළලෙහි වැතිරී ගිය කෙහෙ රොදැති, ඩහදියෙන් තෙමී ගිය කම්මුල් ඇති, ගෙල පැළඳි මුතු හරෙහි කාන්තිය පරදවා ලූ පයෝධරයන් ඇති, මිණිමෙවුලෙහි ලක්ෂණ පරදවා ලූ මනරම් උකුලක් ඇති, රාධාව ලජ්ජා සිතින් නිතඹ ප්‍රදේශ යන් අතින් ආවරණය කළාය.

275

අනංග යුද්ධයෙහි යෙදීමෙන් වෙහෙසට පත්ව පියැවී ගිය දිගු නුවන් ඇතිව, දන්ත කාන්තියෙන් පැහැ දියුණු වූ තොල් සඟලක් ඇතිව, නිශ්චලවූ ලැම පෙදෙසක් ඇතිව, විශ්‍රාම සුව යෙන් පසු වූ සුකොමල රාධාව ගේ මුව අමෘතය ඔහු විසින් උරා ගන්නා ලදී.

276

කාම රස කෙළියෙහි යෙදී වෙහෙසී සතුටට පත් වූ රාධිකාව තමා හට ඉතා අවනතව විසූ ගොවිඳු හට මෙසේ තෙපළා ය.

277

සතුට පිරී ඉතිරී ගිය රාධාව කෘෂ්ණ සමග මෙසේ කෙළි දෙලෙහි පසුවන්නට වූවා ය. හා, යදුනන්දනය, සුවඳ සඳුන් කල්කයට වඩා සිහිල් වූ තොප ගේ අතින් අනංගයා ගේ පුන් කලස් වැනි මගේ පයෝධරයන්හි කස්තුරියෙන් සටහන් අඳින්න.

278

අනංග දුනුදිය වැනි මා දෙබැමෙහි ගා තිබූ අඳුන් තොප ගේ චුම්බනයන් ගෙන් මැකී ගොස් තිබේ. යදු නන්දනය, බමර වැල් පරදන කළු අඳුනෙන් යලි මා දෙබැම සදව.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

279

නෙත් කොනින් නිකුත් වන කාන්තියෙන් පැහැපත් වූ අනංග පාස වැනි සිත් අදනා සෝබන මා දෙසවනෙහි මිණි කොඩොල් බහාලව.

280

ප්‍රේමවන්තය, පිපීගිය පියුමක ප්‍රියංකර සුවඳට රොද බැඳ පැමිණි බමර වැල් මෙන් මා මුව තඹරෙහි නළලතට වැටී රැලි ගැසී සිටින කෙස් රොදවල් තිසි තැන්හි රඳවා තබව.

281

තෙළුම් මලක් වැනි මුහුණක් ඇති මා ආදරවන්තය, ඔහ බිඳු තිවී යන මා නළලතෙහි කස්තුරියෙන් තිලකය තබා සඳෙහි ලපය මෙන් සරසන්න.

282

මයුර පිලක් මෙන් දික් වූද අනංගයා ගේ දද චාමර වැනි වූ ද රති ක්‍රීඩාවෙහිදී ගිලිහීගිය මගේ කේස කලාපයෙහි මේ වන කුසුමන් ගවසන්න.

283

පෙම්රස මෙරීමට පත් කෙරෙන අනංග ලෙන වන් වට මට සිළුවූ වූ උකුලෙහි ලිහී ගිය පට සළු හඳවා, මිනිමෙවුල් දමින් සරසාලන්න.

284

පිරී ඉතිරී ගිය මහත් භක්තියෙන් හරිහු ගේ ශ්‍රී පාදයන් නමස්කාරයෙහි නිගැලි ශ්‍රී ජය දේවයන් ගේ ඉම්හිරි මේ ගී අමාවෙන් කලියුග පාපයන් නැමැති ජ්වරයන් වනසාලනු ලැබේවා.

285

මා පෙම්වත් යදුනන්දනය, කස්තුරියෙන් මල්ලියකම රචා ඇඳ මා ළැමද සරසව. ගිලිහී ගිය මිණි මෙවුල් දම උස් කර බඳුව. කේසයන්හි කුසුමන් ගවසව. කිකිණි නාද කර-වන සලඹ පයලව. මේ ඈ විසින් රාධාව කරන ලද සියලු නියමයන් හරි තෙමේ අප්‍රමාදව ඉටු කෙළේය.

286

කාම ශාස්ත්‍රය පිළිබඳව නොයෙක් ග්‍රන්ථයන්හි එන ශෘංගාරාත්මක උපදෙශයන් කැමැත්තෙහි ද, ගන්ධර්ව කලා

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

වෙහි දක්වෙන සංගීත රසයන් කැමැත්තෙහි ද, එසේම ශ්‍රී විෂ්ණූන් වහන්සේ ගේ ශ්‍රී විභූති තේජස් මහිමය සත සිත යොමු කරවීමෙහි කැමැත්තෙහි ද, නුවණැත්තෙනි, එසේනම් කාව්‍ය නාටක ශාස්ත්‍ර විශාරද ශ්‍රී ජයදේව කවීන්ද්‍රයා ගේ අමෘතය හා සමාන විචිත්‍ර ගීත ගෝවින්දය සේවනය කරව්.

287

ශ්‍රී භොජදේවයන්ට දුව රාමාදේවිය ගේ කුසින් උපන් සුවිනීත ජයදේව කවීන්ද්‍රයන් ගේ මේ ගීත ගෝවින්දය,

287

උතුම් වූ පරාසර ඍෂින් ආදී කල්‍යාණ මිත්‍රයන් ගේ ආශ්‍රයට පැමිණ මිහිරි රස පතුරා රසවතුන් ගේ සිත් සපුරාලමින් යෙහෙන් පවතීවා.

288

අහා රසවත් මධුව, තොප මිහිරියයි මෝහොතකටවත් නොසිතව. සකීරා, දැඩිවූ තොපේ ඇති මිහිරක් කොයින් ද? මුද්‍රිකාඵල කවරෙක් නම් තොපෙන් මිහිරි රස සොයත් ද? අමෘතය, තොපගේ රස විනාශයට ගොස් දැන් බොහෝ කල් ය. ලාලිනියන් ගේ දෙතොල, අහෝ තොප ගේ රස පිරිහී ගොස් ය. කිර, තොප නී රසය. අඹ, තොප රසින් තොර වී තිබේ. දැන් ලෝකයෙහි මධුරතර රස ඇත්තේ උතුම්වූ සුලලිත පදයන් ගෙන් පිරි ශ්‍රී ජය දේවයන් ගේ අමරනීය ගීතයන්හිම ය.

(ලෝකයෙහි උතුම් රස ඇති බවට සම්මත සියලු දෙය, එනම් මධුව, සකුරු, මිදිඵල, තරුණියන් ගේ දෙතොල, කිරි, අඹ, යන සියල්ලට ම වඩා ජය දේවයන් ගේ මේ ගීතයන් ජනයා ප්‍රිය කරන බව මේ කී සේයි.)

289

ශ්‍රී පතිහු ගේ ශ්‍රී හස්තයන් ඔබට සකල සැප සම්පත් දනය කෙරේවා. යමුනාව මෙන් උඩට නැමී වසා රොද හා ගංගා නදිය නැමැති මුතුහර හා හමුවන පයාගයෙහි වූ ඵලයන් වැනි රාධාව ගේ පයෝධරයන් සේවනයෙහි යෙදුණු ශ්‍රී පතිහුගේ ශ්‍රී හස්තයෙන් ඔබට සකලවිධ ඓශ්වර්‍ය්‍යයන් දනය කෙරේවා.

නිමි.

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

Dr. Urmila Sharma Collection, Varanasi

CC0. In Public Domain, Digitizagtion by eGangotri

ජී. පී. ඩී. ජිනදෘස සහ පුත්‍රයෝ
279, මෙල්ල විදිය
කොළඹ.

මිල රු. 3–50 ශ.

Dr. Urmila Sharma Collection, Varanasi